# කොහේද කොහේද අපේ ලොවක්

## ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය තුළ සමාජභාවය, ලිංගිකත්ව හා ලිංගික චර්යා



සචිනි පෙරේරා හා සෙයිනබ් ඉබ්‍රහිම්

ප්‍රකාශන වර්ෂය: 2021

කතුවරුන්: සචිනි පෙරේරා (sachiniperera@gmail.com) සහ සෙයිනබ් ඉබ්‍රහිම් (zainab.ibrahim@gmail.com)

යෝජිත උපුටා දැක්වීම: Perera, S., & Ibrahim, Z. (2021). Somewhere Only We Know: Gender, sexualities, and sexual behaviour on the internet in Sri Lanka. Association for Progressive Communications. https://erotics.apc.org/wp-content/uploads/2021/03/Somewhere-only-We-Know-Online.pdf

සංකල්පය, නිදර්ශන සහ කවර නිර්මාණය: ඉසුරි (https://artofisuri.com/)

පිරිසැලසුම සහ තොරතුරු සැලසුම් කිරීම: හානිම් අබ්දුල් කාදර්

සිංහල පරිවර්තනය: චූසති ලියනආරච්චි

දෙමළ පරිවර්තනය: රවීන්ද්‍රන් සිවතර්සිනි

වෙනත් ආකාරයකින් සටහන් කර ඇති අවස්ථා හැරුණු විට, මෙම ලේඛනයේ අන්තර්ගතය Creative Commons බලපත්‍රයක් (ආරෝපණය, වාණිජ නොවන, ව්‍යුත්පන්නයන් නොමැත, ජාත්‍යන්තර 4.0) යටතේ බලපත්‍ර ලබා ඇත.

https://creativecommons.org/ licenses/by-nc-nd/4.0/legalcode

# කොහේද කොහේද අපේ ලොවක්

ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය තුළ සමාජභාවය, ලිංගිකත්ව හා ලිංගික චර්යා

# පටුන


**කෙටි යෙදුම්** **1**

**රූප සටහන් ලැයිස්තුව** **2**

**ස්තුතිය** **4**

**පෙරවදන** **5**

**මෙම වාර්තාවේ ගවේෂණය වන තේමා සඳහා ගැටපදය** **6**

**මෙම වාර්තාවේ සඳහන්වන පිරිස ආශ්‍රිත ගැටපදය** **7**

**සොයාගැනීම්වල දළ විශ්ලේෂණය** **8**

**හැඳින්වීම** **16**

**ක්‍රමවේද, සීමා හා අභියෝග** **19**

ප්‍රමාණාත්මක පර්යේෂණ 20

ගුණාත්මක පර්යේෂණ 21

සීමා හා අභියෝග 23

**සොයාගැනීම්** **25**

ප්‍රතිචාරකයන් කවුරුන් ද? 26

- වයස 27
- රැකියාව 28
- ලිංගික දිශානතිය හා සමාජභාව අනන්‍යතාව හා ප්‍රකාශනය (SOGIE) පිහිටීම 28, 29

අන්තර්ජාලය හා පියවි ලෝකය: අසත්‍ය විභේදනයක් ද නැති ද? 30

**අන්තර්ජාල භාවිතය හා අන්තර්ජාලයේ ප්‍රකාශන** **33**

අනන්‍යතාව, ප්‍රකාශනය හා රංගනය 33

- සමාජභාව අනන්‍යතාව හා ලිංගිකත්වය 34
- ආත්ම ප්‍රකාශනය හා ස්වයං-වාරණය 37
- ප්‍රකාශනය හා රඟදැක්වීම 43

ප්‍රචණ්ඩත්වය, හිරිහැර හා අපයෝජනය 45

**ප්‍රජාව සොයාගැනීම හා ජීවනෝපාය** **54**

ප්‍රජාව සොයාගැනීම හා ක්‍රියාකාරිත්වය පිහිටුවීම 54

ජීවනෝපාය 59

අන්තර්ගතය: පරිභෝජකයන් හා නිෂ්පාදකයන් 64

**පිවිසියහැකිබව හා නියාමනය** **70**

පිවිසියහැකිබව 70

- පාලනය 71
- පිරිවැය 74
- රජය හා වේදිකා තුළින් සිදුවන නියාමනය 74

ප්‍රියතම වේදිකා හා පරිශීලක සංස්කෘතිය 77

භාෂාව හා පාරිභාෂික පදමාලාව 86

- අන්තර්ජාලයේ භාවිතවන භාෂා 87
- සමාජභාව හා ලිංගිකත්වය වටා පදමාලාව හසුරවීම 92

**නිර්දේශ** **97**

**ආශ්‍රිත ග්‍රන්ථ** **104**

**ඇමුණුම** **111**

ඇමුණුම 1- පදමාලාව 112

ඇමුණුම 2- ප්‍රමාණාත්මක සමීක්ෂණය 115

ඇමුණුම 3- පර්යේෂණ විචාරය 124

ඇමුණුම 4- නෛතික රාමුවේ දළ විශ්ලේෂණය 125

# කෙටි යෙදුම්

| | |
|---|---|
| APC: | ප්‍රගතිශීලී සන්නිවේදනය සඳහා වූ සංගමය (Association for Progressive Communications) |
| CSO: | සිවිල් සමාජ ආයතන (Civil Society Organisation/s) |
| ICT: | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (Information and Communication Technology/ies) |
| IT: | තොරතුරු තාක්ෂණය (Information Technology) |
| INGO: | ජාත්‍යන්තර රාජ්‍ය-නොවන ආයතන (International Non-Governmental Organisation ) |
| LBQ: | සමලිංගික-කාන්තා ද්විලිංගික අතික්‍රාන්ත (Lesbian Bisexual Queer) |
| LGBTQ+ | සමලිංගික කාන්තා සමලිංගික පිරිමි ද්විලිංගික සංක්‍රාන්තිලිංගික අතික්‍රාන්ත (Lesbian Gay Bisexual Transgender Queer) |
| NGO | රාජ්‍ය නොවන ආයතන (Non-Governmental Organisation) |
| SOGIE | දිශානතිය සහ සමාජභාව අනන්‍යතාව හා ප්‍රකාශනය (Sexual Orientation and Gender Identity and Expression) |

# රූප සටහන් ලැයිස්තුව


රූපසටහන 01: ඔබේ වයස කීයද? 26

රූපසටහන 02: ඔබගේ රැකියාව කුමක්ද? 27

රූපසටහන 03: ලිංගික දිශානතිය 28

රූපසටහන 04: සමාජභාව අනන්‍යතාව 28

රූපසටහන 05: පිහිටීම 29

රූපසටහන 06: ජනවර්ගය හා පළාත අනුව ජනගහණය (2012) 29

රූපසටහන 07: අපි පියවි ලෝකයේ දකින ප්‍රචණ්ඩත්වය ම අන්තර්ජාලයේ පරාවර්තනය වී ඇත 30

රූපසටහන 08: ඔබ අන්තර්ජාලය භාවිත කරන ආකාරයට ඔබේ සමාජභාව අනන්‍යතාව බලපා තිබේද? 34

රූපසටහන 09: ඔබ අන්තර්ජාලය භාවිත කරන ආකාරයට ඔබේ ලිංගික අනන්‍යතාව බලපා තිබේද? 34

රූපසටහන 10: අන්තර්ජාල පිවිසුම ඔබ වෙනත් සමාජභාව හා ලිංගික අනන්‍යතා ඇති පුද්ගලයන් දෙස බලන ආකාරය වෙනස් කර තිබේද? 35

රූපසටහන 11: අන්තර්ජාල පිවිසුම ඔබ සමාජභාව හා ලිංගික අනන්‍යතා වටහාගන්නා ආකාරය වෙනස් කර තිබේද? 35

රූපසටහන 12: වයස්කාණ්ඩවලට අනුව 1 සිට 10 දක්වා පරිමාණයක ආත්ම ප්‍රකාශනය සඳහා අන්තර්ජාලයේ වැදගත්කම 37

රූපසටහන 13: 1 සිට 10 දක්වා පරිමාණයක, වයස් කාණ්ඩවලට අනුව අන්තර්ජාල භාවිතයේ අත්දැකීම කෙතරම් සතුටුදායක ද? 37

රූපසටහන 14: අපවාදාත්මක කමෙන්ටු 46

රූපසටහන 15: අවසරයකින් තොර පෞද්ගලික තොරතුරු හුවමාරු 46

රූපසටහන 16: කාන්තාවන් පහත් කර සැලකීම සඳහා අසභ්‍ය හෝ ප්‍රචණ්ඩ රූප භාවිතය 46

රූපසටහන 17: අන්තර්ජාලයේ හිරිහැර විඳින්නේ කාන්තාවන් පමණයි 47

රූපසටහන 18: නොතකා හැරියා 50

රූපසටහන 19: එම වේදිකාවට වාර්තා කළා 50

රූපසටහන 20: නෛතික පද්ධතියකට වාර්තා කළා 50

රූපසටහන 21: ආපස්සට කතා කළා 50

රූපසටහන 22: අපවාදාත්මක කමෙන්ටු 52

රූපසටහන 23: ප්‍රචණ්ඩකාරී ඍජු තර්ජන, ලිංගික හා/හෝ ශාරීරික ප්‍රචණ්ඩකාරී තර්ජන ද ඇතුළු 52

රූපසටහන 24: සමාජ මාධ්‍ය පෝස්ටු හෝ/හා ඊතැපැලෙන් ලැබෙන නිරන්තර වෛරී ප්‍රකාශන 52

රූපසටහන 25: ලිංගවාදී හෝ/හා සමාජභාව විරෝධී කමෙන්ටු හෝ නම් අඬගැසීම් 52

රූපසටහන 26: අන්තර්ජාලය පහසුවෙන්ම මාව අන් අය හා සම්බන්ධ කරයි 55

රූපසටහන 27: අන්තර්ජාලයේ විවාද/ සාකච්ඡාවල විවිධ පුද්ගලයන් සහභාගී/සම්බන්ධවනවා 55

රූපසටහන 28: ඔබ ජීවනෝපායක් සඳහා අන්තර්ජාලය භාවිත කරනවාද? 60

රූපසටහන 29: නිපැයුම් පරිභෝජකයෙකු ලෙස ඔබ කොපමණ අන්තර්ජාලය භාවිත කරනවාද? 65

රූපසටහන 30: නිපැයුම් නිෂ්පාදකයකු ලෙස ඔබ කොපමණ අන්තර්ජාලය භාවිත කරනවාද? 65

රූපසටහන 31: සමාජයේ අසම්මත/තහනම් යැයි සැලකෙන දේ ගැන මට අන්තර්ජාලයේ තොරතුරු සොයාගත හැකියි 66

රූපසටහන 32: ඔබ නිතර අන්තර්ජාලයට පිවිසීමට භාවිත කරන උපකරණය කුමක්ද? 71

රූපසටහන 33: ඔබ අන්තර්ජාලයට පිවිසීමට භාවිත කරන මූලික උපකරණය කෙතරම් දුරට පාලනය කිරීමට ඔබට හැකිද? 72

රූපසටහන 34: ඔබ භාවිත කරන සියලු ම වේදිකා අතර ඔබට වැඩිම ප්‍රකාශන අවකාශයක් ලබා දෙන වේදිකාව කුමක්ද? 81

රූපසටහන 35: වෙබ්අඩවියක් සෑදිය හැකියි (1 සිට 10 දක්වා පරිමාවක) 84

රූපසටහන 36: කෝඩ් ලිවීමට හැකියි (1 සිට 10 දක්වා පරිමාවක) 84

රූපසටහන 37: සෙවුම් එන්ජින් භාවිත කළ හැකියි (1 සිට 10 දක්වා පරිමාවක) 84

රූපසටහන 38: සමාජ ජාලවල සහභාගිවිය හැකියි (1 සිට 10 දක්වා පරිමාවක) 84

රූපසටහන 39: බ්ලොග් කළ හැකියි (1 සිට 10 දක්වා පරිමාවක) 84

රූපසටහන 40: අන්තර්ජාලයේ කණ්ඩායම්/සාකච්ඡාවල සහභාගිවිය හැකියි 84

රූපසටහන 41: සමීක්ෂණය සම්පූර්ණ කළේ 87

රූපසටහන 42: කතා කරන භාෂාව හා අන්තර්ජාලයේ භාවිත කරන භාෂාව 88

# ස්තුතිය

මෙම පර්යේෂණය බොහොම දෙනෙකුගේ කාලය හා ශ්‍රමය වැය කිරීමේ ප්‍රතිඵලයක් වන නිසා ම අප ලැබූ සියලු සහයෝගයන්හට අපි ස්තුතිවන්ත වෙමු. සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වීමට, ප්‍රජා සාකච්ඡා හා සම්මුඛ සාකච්ඡා වෙනුවෙන් මෙන් ම මෙම පර්යේෂණය වැඩිදියුණු කළ යුතු ආකාරය අප හා බෙදාගැනීමට කාලය වැය කළ  සියලු දෙනාට අපගේ ස්තුතිය පුදකරමු.

උදා දේශප්‍රිය හා තරින්දි දේවසුරේන්ද්‍ර එක් එක් කාලපරාසවල මෙම පර්යේෂණයේ විවිධ අංග සමායෝජනය කළ අතර, ඔවුන්ගේ සියලු උපකාරවලට ස්තුතිවන්ත වෙමු. මෙම පර්යේෂණයේ ඇතුළත් වූ හරවත් සාකච්ඡා දරා සිටි ප්‍රජා සංවිධාන කිහිපයක් විය. හාර්ට් ටු හාර්ට්, වෙනස, ජාතික සංක්‍රාන්තිසමාජභාවී ජාලය, අභිමානි හා ෂත්‍ර, ඔබගේ අවකාශයන්ට අප පිළිගත් ඔබට ස්තුතියි. අප හා මෙම කතාබහ සංවිධානය කළ/සැලසුම් කළ මංජු හේමාල්, ජොශ් නඩේසරාජා, තේනු රන්කෙත්, භූමි හරේන්ද්‍රන්, පබා දේශප්‍රිය, අප අතරින් සමුගත් කුසුම් ජයලත්, කෞෂල්‍යා පෙරේරා, යමුනා ගුරුගේ, හසානා චේගු ඉසදීන් හා කයාත්‍රි දිවාකලාල හට අපි ස්තුතිවන්ත වෙමු. මෙම පර්යේෂණය පුරාවට අපට පරිවර්තකයන් හා අරුත්දක්වන්නන් කිහිප දෙනෙකු සහය දැක්වූවා, ඔවුන් අතරින් සමහර අය මෙම වාර්තාවේ සාකච්ඡා කර ඇති භාෂාවේ දේශපාලන මානයන් ගැන ද සිතා බැලුවා. ඉතින් අපි මයිකල් මෙන්ඩිස්, හසානා චේගු ඉසදීන්, රවින්ද්‍රන් සිවතර්සිනි, ඵුසති ලියනආරච්චි, ඉෆ්රයිම් ශඩ්රක් හා අම්බිකායි ෆෝර්මන් හට ස්තුතිවන්ත වෙමු.

එරොටික්ස්හි (**Exploratory Research on Sexuality and the Internet**) කොටසක් වීමට අපට ආරාධනා කළ ඒපීසී කාන්තා අයිතිවාසිකම් වැඩසටහනට අප ස්තුතිවන්තවන්නේ අපට ඕනෑ ම වේලාවල 'දයාබර සුපිරි මිනිසුනි' කියා දිරිදුන් වැලේව විශේෂයෙන් සඳහන් කරමිනි. දකුණු ආසියා එරොටික්ස් හවුල්සමාගමේ අනෙකුත් අපේ සුපිරි මිනිසුන්වන නේපාලයේ බොඩි ඇන්ඩ් ඩේටා, ඉන්දියාවේ පොයින්ට් ඔෆ් වීව්, බංගලාදේශයේ පර්සා සජිඩ් හා ලංකාවේ කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයට ද අපගේ ස්තුතිය පුදකරමු. වාර්තාව සැකැස්මේ දී නිරන්තර ප්‍රතිපෝෂක ලබා දුන් හ්වාලේ හා ස්‍රිනිධි රාඝවන්හට ද ස්තුතිය පුදකරමු. මෙම වාර්තාව විමර්ශනය කර එයට පෙරවදනක් ලියූ පසන් ජයසිංහට ද, එය ගැන ගැඹුරින් සිතමින් සංස්කරණය කළ සුනිලා ගලප්පත්තිට ද, මෙම වාර්තාවේ පිරිසැලසුම සකසා, එහි එක් එක් පිටපත් නිර්මාණ සැලසුම් කළ හානිම් අබ්දුල් කාදර් හා ඉසුරිට ද අපගේ ස්තුතිය පුද කරමු.

අවසාන වශයෙන්, මෙම පර්යේෂණය කරගෙනයාමට මූල්‍යමය අතහිත හා සම්පත් ලබාදුන් ඇම්ප්ලිෆයි චේන්ජ් ආයතනයට, මෙම හවුල්සමාගමේ කොටසක් වීමට අපට ආරාධනා කළ ඒපීසී ආයතනයට මෙන් ම, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අපගේ මූල්‍යමය හවුල්කරු වීමට එකඟ වී අප වෙනුවෙන් අරමුදල් බෙදාදුන් කාන්තාව හා මාධ්‍ය සාමූහිකයට ද බෙහෙවින් ස්තුතිවන්ත වෙමු.

**සචිනි පෙරේරා හා සෙයිනබ් ඉබ්‍රහිම්**

# පෙරවදන

අපි අපිව ම සොයාගන්නේ කෙසේ ද යනු අතික්‍රාන්ත පිරිස අතර නිරන්තරයෙන් ඇසෙන පැනයකි. මේ වනවිට අන්තර්ජාලය මේ පැනය පුපුරුවා දමා ඇත්තේ- අපව ම සොයාගැනීමට පෙර නොහිතූ විරූ ගණන් කළ නොහැකි තරම් විධි බොහොමයක් ඇති කරමිනි. අනන්‍යතා හා ප්‍රජාව ගොඩනගාගැනීමටත්, පැරණි තෘප්තීන් සොයාගැනීමටත්, අලුත් තෘප්තීන් නිර්මාණය කිරීමටත් අලුත්, වගේම සරල ක්‍රම ඇත. ඒ වගේම අපි අපිව ම සොයාගැනීමට අන්තර්ජාලය භාවිත කරන විට මෙලෙසින් ම නොයෙකුත් සංකීර්ණතා මතුවෙන්නට ඉඩකඩ තිබේ. ඉන් සමහරක් මගින් අපට පියවි, විසල් ලෝකයේ දී මුහුණ දීමට සිදුවන කාංසා, අවමාන හා ප්‍රචණ්ඩත්වය ප්‍රතිනිර්මාණය කරයි. අතික්‍රාන්ත අනන්‍යතා සාපරාධී යැයි සලකන ලංකාව වැනි රටක, මෙම සමීකරණ දෙක ම ඉහළ අගයක් ගනී: එහි අන්තර්ජාලය හෙළන සෙවනැලි වඩාත් අඳුරුයි, ඒවා තුළින් සොයාගන්නා තෘප්තියත් තදබල එකක්.

කොහේද කොහේද අපේ ලොවක් යනු ශ්‍රී ලංකාවේ අතික්‍රාන්ත ප්‍රජාව එකිනෙකා සොයාගන්නේ කෙසේ ද යන පැනයට ලබා දෙන සමහර පිළිතුරු හසුකරගැනීමට දරපු තැතකි. ඔවුන් අන්තර්ජාලයේ තමන්ව ප්‍රකාශ කරන ආකාරය මෙන් ම, අනෙක් අය ඔවුන් දෙස බලන ආකාරය හේතුවෙන් ඔවුනට මුහුණදීමට සිදුවන දෑ පිළිබඳ ගතික පරාසයක් මින් අනාවරණය කෙරේ. මෙම අධ්‍යයනය මෙම පිළිතුරු පිළිබඳව සිතා බලන්නේ අතික්‍රාන්ත ජනතාව කෙරෙහි ශ්‍රී ලංකා රජයේ මෙන් ම සමාජයේත් ඇති දැඩි රෙගුලාසි පසුතිරයේ තිබෙද්දී ය. මෙම අධ්‍යයනය තුළින් සමූලයක් වශයෙන් ඇදෙන සිතුවම පැහැගන්වන්නේ, එදිනෙදා ජීවිතය තරණය කිරීම සඳහා අතික්‍රාන්ත ශ්‍රී ලාංකිකයන් යොදාගන්නා සංකීර්ණ, පෙළක් විට පරස්පරවිරෝධී ක්‍රම හා, ලෝකයට මෙන් ම තමන් වෙතත් පිවිසීමට හැකි සීමාරහිත දොරටුවක් වැනි අන්තර්ජාලය ඔස්සේ ඔවුන් අරුත් සොයාගන්නා නොයෙක් ක්‍රමත් ය.

කොහේද කොහේද අපේ ලොවක් ඔස්සේ සචිනි හා සෙයිනබ් දායකවන්නේ ශ්‍රී ලංකාවේ හා පුළුල් වශයෙන් දකුණු ආසියාවේ LGBTQ+ ජනතාවගේ අත්දැකීම් පිළිබඳව වැඩෙන දැනුම් සම්භාරයට යි. අතික්‍රාන්ත අනන්‍යතාවල විවිධත්වය, ඔවුන්ගේ පිහිටීම, ජනවර්ගය, වයස හා ජීවනෝපාය වැනි පුළුල් පරාසයක් ඔස්සේ අතික්‍රාන්ත ශ්‍රී ලාංකිකයන්ගේ හඬ යොමු කිරීම තුළින් ඔවුන් හසුකරගන්නේ ව්‍යාප්ත වූ දසුනකි. මෙම ව්‍යාප්තබව තවත් වැදගත්වන්නේ එය මෙම අධ්‍යයනය ස්ව-ආවර්ජනය වෙනුවෙන් හිතාමතා ම කෙරුණු භාවනාවක් ලෙස විදහා පාන බැවිනි. අවසාන වශයෙන්, එහි වැදගත්කම රැඳී ඇත්තේ ගෝලීය දකුණේ පිහිටි අධ්‍යයනයක් වුවත් බොහෝදුරට උතුරේ නිෂ්පාදනයවූත්, එ මගින් බලපැවැත්වෙන්නාවූත් ව්‍යුහ හා සම්මතයන් සහිත විෂයක් දෙස බැලීම තුළ ය.

මෙවැනි දායකත්ව ඔස්සේ අපට අතික්‍රාන්ත ජනතාව ලෙස අපව ම නිදහස් කරගැනීමේ වියහැකියාවන් සිතීමට පමණක් නොව, එසේ කිරීම තුළින් අවකාශ, ශරීර මෙන් ම සිත්වල ද පවතින යටත්විජිතකරණයන් විසංයෝජනය කරමින් ඒවා බිඳ දමන අයුරින් කටයුතු කිරීමට ද හැකිවේ ඒ වගේ ම එ තුළින් දැනුවත් වී, සිතනමතනසුළු වී අවසානයේ දී අප එකිනෙකා සොයාගන්නා අයුරු පිළිබඳව විශ්වාසය ද ගොඩනගාගත හැකි ය.

**පසන් ජයසිංහ**
**කොළඹ, ශ්‍රී ලංකාව**
**2020 ජූලි**

## මෙම වාර්තාවේ ගවේෂණය වන තේමා සඳහා ගැටපදය

### අන්තර්ජාල භාවිතය හා අන්තර්ජාලයේ ප්‍රකාශන




අනන්‍යතාව, ප්‍රකාශනය හා රංගනය



ප්‍රචණ්ඩත්වය, හිරිහැර හා අපයෝජනය

### ප්‍රජාව සොයාගැනීම හා ජීවනෝපාය



ප්‍රජාව සොයාගැනීම හා ක්‍රියාකාරීත්වය පිහිටුවීම



ජීවනෝපාය




අන්තර්ගතය: පරිභෝජකයන් හා නිෂ්පාදකයන්

### පිවිසියහැකිබව හා නියාමනය



පිවිසියහැකිබව



ප්‍රියතම වේදිකා හා පරිශීලක සංස්කෘතිය



භාෂාව හා පාරිභාෂික පදමාලාව

## මෙම වාර්තාවේ සඳහන්වන පිරිස ආශ්‍රිත ගැටපදය


ශිරාණි


හිරාන්


සෙල්වි


හසිනි


දිව්‍යා


ආර්යා


ලක්ෂ්මි


විජේ


මෙලනි


ක්‍රිෂාණි


ෂමාල්


විරාන්


සාරා

# සොයාගැනීම්වල දළ විශ්ලේෂණය

2019 අගෝස්තු හා 2020 අප්‍රේල් අතරතුර කාලයේ, අප ශ්‍රී ලංකාවේ සමලිංගික ස්ත්‍රීන්, සමලිංගික පුරුෂයින්, ද්විලිංගිකයන්, සංක්‍රාන්තිලිංගිකයන්, අතික්‍රාන්ත පුද්ගලයන් මෙන් ම වෙනත් සමාජභාව අනන්‍යතා හා ප්‍රකාශන, ලිංගිකත්ව හා ලිංගික චර්යා ඇති (**LGBTQ+**) පුද්ගලයින් අන්තර්ජාලය භාවිත කරන ආකාරය අවබෝධ කරගැනීමේ කාර්යය දියත් විය.

අන්තර්ජාල කාවැදීම 34% ලෙස හා ඩිජිටල් සාක්ෂරතාව 40% ලෙස දැක්වෙන ශ්‍රී ලංකාවේ අන්තර්ජාල පිවිසියහැකිභාවය හා භාවිතය අඩුවුවත් (ජාත්‍යන්තර විදුලිසන්නිවේදන සංගමය), පර්යේෂණ පෙන්වන්නේ ශ්‍රී ලංකාවේ සියලු ම අන්තර්ජාල පරිශීලකයන් සමාජජාල පරිශීලකයන් බවයි (ගල්පාය සහ පිරිස, 2019). දශක තුනක යුද්ධයේ නිමාවෙන් පසුව පැමිණි දශකයේ දී ශ්‍රී ලංකාව ආණ්ඩු මාරු කිහිපයක්, නවලිබරල් ආර්ථික ප්‍රතිපත්ති ප්‍රගුණනයත්, නිශේෂයෙන් ම සිංහල-බෞද්ධ ජාතිකවාදයේ නැගීම සුජාතකරණයත් සමගම වූ වාර්ගික-ආගමික ගතානුගතිකත්වයේත්, ලිංගික ගතානුගතිකත්වයේත්, සෝදිසියේත් නැගීමක් දැක ඇත. මේ සියල්ල මගින් ශ්‍රී ලංකාවේ, විශේෂයෙන් ම සමාජ මාධ්‍ය තුළ අන්තර්ජාල ප්‍රවේශය සහ/හෝ භාවිතය හැඩ ගැසී ඇත. අන්තර්ජාලය යනු ජනතාව ඔවුන්ගේ සමාජීය හා දේශපාලනික ජීවිත ගත කරන අඛණ්ඩතාවක් නම්, මෙය LGBTQ+ ජනතාවටත්, සම්මත නොවන සමාජභාව අනන්‍යතා හා ලිංගික චර්යා සහිත අයටත් වලංගු වේ. මෙම අධ්‍යයනයෙන් අපි තැත් දැරුවේ ක්‍රියාකාරීත්වයෙන් ඔබ්බට ගිය අන්තර්ජාලයේ එදිනෙදා භාවිත මෙම ප්‍රජාවන්ට දිස්වන්නේ කෙසේ ද යන්නත් අන්තර්ජාලයේ රැඳී සිටීම මගින් ඔවුන් තේරුම්ගන්නා කාරකත්වය කුමනාකාර දැයි යන්නත් ගවේෂණය කිරීමටයි.

විෂමසම්මත නොවන ලිංගිකත්ව හා ලිංගික චර්යා තවමත් ශ්‍රී ලංකාවේ සාපරාධීයැයි සැලකේ. සමාජ-ආර්ථික පංතිය, භාෂාව, ජනවර්ගය, වයස හා වෙනත් සාධක හා ඡේදනය වන වෛරී ප්‍රකාශ හා ප්‍රචණ්ඩත්වය, ස්ව-වාරණය හා නියාමනය පිළිබඳ අත්දැකීම්, අන්තර්ජාලයේ දී ආරක්ෂාව හා සුරක්ෂිතභාවය, හා පිවිසියහැකිබව යන කරුණුවලට බලපායි. එහෙත් මෙම අධ්‍යයනයේ තවදුරටත් අප සොයාගත් පරිදි අන්තර්ජාලය එයට පිවිසිය හැකි අය හට, නිදහස් අවකාශයක්, පියවි ජීවිතයට වඩා විවෘත ප්‍රකාශනයන් කිරීමට වේදිකාවක් (platform), ජීවනෝපායන් ඇති කිරීමට අවස්ථාවක්, සම-සිත් ඇති මිතුරන් හා ප්‍රජාවේ අනෙක් අය ඇතුළු ප්‍රජාවන් සොයාගැනීමට අවස්ථාවක් ලබා දෙන අතර ම ශ්‍රී ලාංකීය සමාජයේ බොහෝ අංශවල තහනම් යැයි සැලකෙන මාතෘකා පිළිබඳව ඉගෙනගැනීමටත් අවස්ථාව සලසා දෙයි.

මීළඟට අප දක්වන්නේ මෙහිදී පැන නැගුණු ප්‍රධාන මාතෘකා ය; ඒවා එකිනෙකට සම්බන්ධ බැවින් වටහාගතයුත්තේ ද ඒ අයුරිනි. උදාහරණයක් ලෙස, උපකරණ හා අන්තර්ජාල භාවිතයට ඇති පිවිසියහැකිබව හා පාලනය අන්තර්ජාලයේ නිදහස් ප්‍රකාශනයටත්, ස්වයං-වාරණයේ තීව්‍රතාවටත් බලපෑ හැකිය. කෙසේ වෙතත්, මෙම වාර්තාවට පහත මාතෘකා ඔස්සේ පිවිසිය හැකිය:

1) අන්තර්ජාල භාවිතය හා අන්තර්ජාලය තුළ ප්‍රකාශනය;
2) ප්‍රජා හා ජීවනෝපාය සොයාගැනීම
3) පිවිසියහැකිබව හා නියාමනය.

# 1. අන්තර්ජාල භාවිතය හා අන්තර්ජාලය තුළ ප්‍රකාශනය

මෙම අධ්‍යයනය මංපෙත් කිහිපයක් ඔස්සේ අන්තර්ජාල භාවිතය හා අන්තර්ජාලය තුළ ප්‍රකාශනය ගවේෂණය කළේ ය:

## අ) පුද්ගලයකුගේ සමාජභාව හා ලිංගික අනන්‍යතා හා වෙනත් ජනවර්ගය වැනි අනන්‍යතා ඔවුන්ගේ අන්තර්ජාල භාවිතයට සම්බන්ධවන්නේ කෙසේද?

අන්තර්ජාලය තුළ ආත්ම-ප්‍රකාශනය හා/හෝ ස්ව-චාරණයට හේතු සංකීර්ණ වන අතර ඒවා ඔවුන්ගේ විවිධ අනන්‍යතා මත මෙන් ම ඡේදනය වන වරප්‍රසාද, පීඩනය හා විෂමතා අක්ෂ මත ද පුද්ගලයෙකුගෙන් තවත් අයෙකුට වෙනස්වෙයි. උදාහරණයක් ලෙස, ඔබ සංක්‍රාන්ති නොවන පුද්ගලයෙකු නම් ඔබට සංක්‍රාන්තිලිංගිකයකුට (transgender) වඩා ප්‍රකාශන අවකාශයක් හිමිවුවත්, සංක්‍රාන්ති නොවන පුද්ගලයෙකුට හිමි ප්‍රකාශන මට්ටම සමාජ පංතිය, ජනවර්ගය වැනි වෙනත් සාධක මත තීරණයවන්නටත් ඉඩකඩ තිබේ.

මෙම අධ්‍යයනයේ දී, බොහොමයක් දෙනා කියා සිටියේ ඔවුන්ගේ අන්තර්ජාල භාවිතයට බොහෝවිට හෝ සමහරවිට ඔවුන්ගේ සමාජභාවය හා ලිංගිකත්වය බලපාන බවයි. ප්‍රතිචාරකයන්ගෙන් අඩකට වඩා කියා සිටියේ ඔවුන් තමන්ගේ සමාජභාවය හා ලිංගිකත්වය අවබෝධ කරගෙන සිටි ආකාරයත්, අනුන්ගේ සමාජභාවය හා ලිංගිකත්වය දකින ආකාරයත් අන්තර්ජාලය නිසා බොහෝවිට ධනාත්මකව වෙනස් වූ බවය. පුද්ගල ආත්ම ප්‍රකාශනය තුළ අන්තර්ජාලයේ භූමිකාව ඉහළ ම අගයක් ගත්තේ සංක්‍රාන්තිලිංගික පුද්ගලයින් අතරයි. ඉන්පසුව පිළිවෙළින් සිස්-කාන්තාවන් හා සිස්-පුරුෂයන් අතරයි. තවදුරටත්, අන්තර්ජාලය ඔවුන්ගේ ආත්ම ප්‍රකාශනයට ඉතාමත් වැදගත් යැයි කියූ අය අතර 71% ක් වයස 30 හෝ ඊට අඩු අය විය. කෙසේවෙතත්, උනන්දුව දනවන සුළු ලෙස, වයස් කාණ්ඩ හරහා අන්තර්ජාල භාවිතයෙන් ලැබුණු තෘප්තිය මිශ්‍ර එකක් විය. සමහර පුද්ගලයින් අන්තර්ජාලයේ ප්‍රකාශනය 'රංගනයක්' ලෙස දුටුව ද, විවිධත්වයෙන් යුතු සමාජභාව ඇති අය කියා සිටියේ අන්තර්ජාලයේ වූ අවකාශය පියවි ලෝකය වඩා ඔවුන්ගේ සමාජභාවය අවංකව ම ප්‍රකාශ කිරීමට ඉඩකඩ ලබාදුන් බවත්, පියවි ජීවිතයේ දී ඔවුන්ට ගැලපීම සඳහා 'රඟදක්වන්නට' සිදු වූ බවත් ය.

## ආ) පරිභෝජන රටා හා අන්තර්ගත (content) නිෂ්පාදනය

මෙම අධ්‍යයනයේ, 82% ප්‍රතිචාරකයන් තමන්ව ම දුටුවේ අන්තර්ගත පරිභෝජකයන් ලෙසයි. තමන්ව ම අන්තර්ගත නිෂ්පාදකයන් ලෙස දුටුවේ 30% වැනි පිරිසක් පමණි. අන්තර්ගත නිර්මාණය යන මාතෘකාව යටතේ බොහො දෙනෙකු දුටුවේ යම් අගයක් හෝ සමාජ පිළිගැනීමක් තිබූ ස්වීය නිර්මාණයි. සමාජ පිළිගැනීමක් නොතිබුණු පෞද්ගලික ඡායාරූප වැනි දේ අන්තර්ජාලයේ හුවමාරු කිරීම අන්තර්ගත නිර්මාණය කිරීමක් ලෙස සියලු ම දෙනා දුටුවේ ද නැත.

සියලු ම දෙනා අතර විශේෂයෙන් ම තහනම් යැයි සැලකෙන, විධිමත් හෝ පහසුවෙන් ලබාගත හැකි අධ්‍යාපන මූලාශ්‍රයක් නොමැති මාතෘකා වන සමාජභාවය, ලිංගිකත්වය හා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය හා අයිතීන් වැනි තොරතුරු වෙත පිවිසියහැකිබව අගය වීය. පුළුල් වශයෙන්, සමීක්ෂණය පෙන්වා සිටියේ බොහෝ දෙනා අන්තර්ජාලය භාවිත කළේ බ්ලොග්, ඇමතුම්, චැට්

කිරීමට, ඊමේල්, ක්ෂණික පණිවුඩ, පර්යේෂණයට, සෙවුම් අඩවි සඳහා, සමාජ ජාලගතවීම්, වීඩියෝ නැරඹීම හා රැකියා සඳහා බවත් ය. සමහරවිට, අන්තර්ජාලය භාවිත වූයේ අන්තර්ජාල බැංකු ගනුදෙනු, බ්ලොග්, ෆෝරම්, ක්‍රීඩා, සෞඛ්‍යය තොරතුරු, ජීවනෝපාය, කාමුක චිත්‍රපට හා ලිංගික තෘප්තිය වෙනුවෙන් බවයි. අන්තර්ජාලය දුලබව ම භාවිත වූයේ පෙම් සබඳතා හා ලිංගික පණිවුඩ හුවමාරුවටයි. ප්‍රකාශනයට වැඩි ම අවකාශය ලබා දුන් වේදිකා ලෙස ෆේස්බුක, වට්සැප්, ඉන්ස්ටාග්‍රෑම්, ඉමෝ හා ට්විටර් නම් විය.

## ඇ) අන්තර්ජාලයේ අපවාද, ප්‍රචණ්ඩත්වය හා වෛරී ප්‍රකාශන පිළිබඳ අත්දැකීම්

සමීක්ෂණයට ලක්වූවන්ගෙන් 62% අන්තර්ජාලයේ දී අපවාදාත්මක කමෙන්ටු ලැබූ අතර, 56% කට අනවශ්‍ය ලිංගික ප්‍රකාශන සහිත පණිවුඩ හා ස්ත්‍රීන්ට අවමන් කරන නොයෙකුත් ප්‍රචණ්ඩකාරී හා අසභ්‍ය රූප ලැබී ඇත. ඇසුවන්ගෙන් අඩකට වඩා කියා සිටියේ අන්තර්ජාලයේ දී හිරිහැරයට ලක්වූයේ කාන්තාවන් පමණක් නොවන බවත්, එය බොහෝවිට වරප්‍රසාදය හා සම්බන්ධ වූ බැවින් සම්මත නොවූ සමාජභාව හා ලිංගිකත්ව හිමි පුද්ගලයින් පහත මට්ටමක සිටි බවත්, පුළුල් වශයෙන් මෙයට කාන්තාවන් ද අයත් වූ බවත් ය. නිසැකයෙන් ම එක්තරා ආකාරයක - ස්ත්‍රී සිරුර, ලිංගිකත්වය, ලිංගික අධ්‍යාපනය වැනි අන්තර්ගත හුවමාරු කරන කාන්තාවන් සඳහා වැඩි අවරගැස්මක් තිබිණි. මෙලෙස අපචාරයට, ප්‍රචණ්ඩත්වයට හා වෛරී ප්‍රකාශයන්ට ලක්වූවන්ගෙන් බොහොමයක් දෙනා ඒ පිළිබඳව එම අදාළ අඩවි හෝ වේදිකාවන්ට වාර්තා කරති නැතිනම් ඒවා නොසළකා හරිති. එහෙත් 90% දෙනා එය නීතිමය හෝ නොවන කිසිදු පද්ධතියකට වාර්තා නොකිරීම මගින් ඉහත තත්වය මොනවට පැහැදිලි වේ.

## ඈ) ස්ව-වාරණය හා නියාමනය

තමන්ගේ ප්‍රකාශන කිරීමට කොපමණ නිදහසක් දැනුණා දැයි යන කාරණයේ සිට තමන්ගේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය හා මානසික සුවය හේතුවෙන් ඇතැම් විට විවිධ සම්මුති ඇති කරගැනීම දක්වා මෙම අත්දැකීම් සැලකිය යුතු විවිධත්වයක් පෙන්නුම් කළේය. ඉහත සඳහන් පරිදි, තමන්ව ම ප්‍රකාශ කරගැනීමට ඇති කැමැත්ත සූක්ෂම ලෙස තීරණය වූයේ ප්‍රචණ්ඩත්වය, හිරිහැරය හා අපයෝජනය හා පෙර තිබූ අත්දැකීම් මත ය. ඇතැම් විටෙක එක ම පුද්ගලයාට වුව ද අන්තර්ජාලය නිදහසේ හා ආත්ම ප්‍රකාශයේ අවකාශයක් මෙන් ම, එහි රැඳී සිටීම සඳහා තමන්ව ම ස්වයං-වාරණයට ලක් කිරීමට සිදුවන අපහසුදායක, කටුක අවකාශයක් ද විය හැකි ය. ජනතාව තවත් ගැටුණු දෙයක් වූයේ ඔවුන් අන්තර්ජාලයේ හා අන්තර්ජාලයෙන් පිටත පෞද්ගලික හා පොදු ජීවිත තේරුම්ගත් ආකාරයත්, ඇතැම් අයට නිදහස ලබාදෙන එහෙත් තවත් අයට අනාරක්ෂිත බවක් දනවන අන්තර්ජාල පරිසරයක් තුළ මෙම දෙගිඩියාව දරාගන්නේ කෙසේ ද යන්නත් පිළිබඳවයි. සමහර අය මුහුණට මුහුණ හමුවීම් වෙනුවෙන් අන්තර්ජාලය සිය මූලික ප්‍රකාශන අවකාශය ලෙස සැලකීම නවතා දැමූ අතර, විටෙක එම භාවිතය සීමා කළේ ඔවුනට දැනුණු අනාරක්ෂිත බව හේතුවෙනි. අන්තර්ජාලයේ ස්වයං වාරණයට බලපෑ මූලික සාධක ලෙස පවුල, නීත්‍යානුකූල පවුල (in-laws) හා පෙම්වතුන් සඳහන් විය.

## 2. ප්‍රජාව හා ජීවනෝපායන් සොයාගැනීම:

අන්තර්ජාල වේදිකා විසින් විශේෂයෙන් ම සම්මත නොවන සමාජභාව අනන්‍යතා ඇති සංක්‍රාන්තිලිංගිකයන් වැනි අයට ජීවනෝපාය පවත්වාගෙන යාමටත්, ඒවා වැඩීමට උපකාර කිරීමටත් මෙවලම් හා අවස්ථා ලබා දී ඇත. මේ ඔස්සේ ඔවුන්ට අන්තර්ජාලයේ වැඩි අවස්ථාවන්, පිළිගැනීම හා පුළුල් ප්‍රේක්ෂක සමූහයන් ද හිමිවිය. ලිංගික ශ්‍රමිකයන් සිය කටයුතු සඳහා තාක්ෂණය යොදා ගැනීම සේවාදායක කළමණාකරණය පහසු කළ අතර තවදුරටත් එම ගනුදෙනු පොදු ස්ථානවල දී සිදු කිරීමට අවශ්‍ය නොවූ නිසාවෙන් ශ්‍රමිකයන්ගේ ආරක්ෂිත බව ද වර්ධනය කිරීමට යෙදුණි. මේ හේතුවෙන් ඉපයීම්, එකිනෙකා වෙත එළඹීම මෙන් ම ආරක්ෂාව අතින් ද සාධනීය ප්‍රතිලාභ ඇතිවිය. අන්තර්ජාලය මත පදනම් වූ දිවිපැවැත්මක් පවත්වා ගැනීම එක්තරා දුරකට අඩමානය- ඒ කෙනෙකුගේ අනන්‍යතාව අනුව මහජන පිළිගැනීමේ අඩුවීම් සිදුවිය හැකි නිසා මෙන් ම බොහොමයක් වේදිකාවන්වල විවිධ නියමයන් හා කෝන්දේසිවලට යටත් වී තුන්වැනි පාර්ශිකයින්ගේ පාලනයට ලක් වන නිසායි. මින් සමහරක් වේදිකා සිතාමතා ම හෝ නැතිව හෝ LGBTQ+ පුද්ගලයින්හට වෙනස් ලෙස සලකන ප්‍රතිපත්ති අනුගමනය කරයි.

බොහෝ දෙනා අන්තර්ජාලය දුටුවේ තමන්ව පහසුවෙන් අන් අය හා සම්බන්ධ කරමින් ඔවුන්ට තමන් ලෙස ම පෙනී හිඳීමට ඉඩකඩ ඇති පිළිගැනීම හා උපකාර ලබාදෙන 'ප්‍රජාවක්' සොයාගැනීමට පහසු කරවූවක් ලෙසයි. තවත් අයෙකුට අන්තර්ජාලය අන් අය හා සබඳතා ඇතිකරගෙන සහයෝගය ඉල්ලා සිටීමටත්, අවශ්‍ය ආත්ම විශ්වාසය සොයාග ැනීමට උපකාරී වීමටත්, ප්‍රජාවේ සිටින අයට වැදගත් වන තොරතුරු ලබාදීමටත් ක්‍රමයක් සලසා දෙයි.

## 3. පිවිසියහැකිබව හා නියාමනය:

අන්තර්ජාලයට පිවිසිය හැකි බව පහත ක්‍රම ඔස්සේ තීරණය විය:
අ) උපකරණ හා අන්තර්ජාල පිවිසීම පාලනය කිරීමට ඇති හැකියාව;
ආ) උපකරණ හා අන්තර්ජාල සබඳතා සඳහා පිරිවැය;
ඇ) රාජ්‍ය හා වෙනත් වේදිකා මගින් නියාමනය;
ඈ) මෙම වේදිකාවල මූලිකව භාවිතවන, භාවිත කළ හැකි භාෂා(ව).

වෙනත් පර්යේෂණයන්ට අනුව, ස්මාර්ට් ජංගම දුරකථන මගින් අන්තර්ජාල භාවිතය තීරණය වේ, මෙම අධ්‍යයනයේ ප්‍රතිචාරකයන් 88%ක් අන්තර්ජාලයට පිවිසීමට භාවිත කරන මූලික උපකරණය ද ජංගම දුරකථනය වේ. මින් 60% දෙනෙකුහට පමණ තමන්ගේ ජංගම දුරකථනය සම්පූර්ණයෙන් ම පාලනය කළ හැක. සීමිත හෝ පාලිත පිවිසියහැකිබවක් ඇති අය අන්තර්ජාලයේ ස්වයං වාරණය සිදු කරයි. කෙසේවෙතත් මෙම වාර්තාවේ වෙනත් අංශවල දැක්වෙන පරිදි, නිදහස් ප්‍රකාශනයේ මිම්මක් ලෙස පිවිසියහැකිබව හා පාලනය සැලකිය නොහැකිවන්නේ වෙනත් සමාජීය, දේශපාලනික හා නෛතික සාධක මගින් ද බලපෑම් සිදුවන බැවිනි. උපකරණවල මිල මෙන් ම අන්තර්ජාලයට පිවිසීමේ පිරිවැය ද අන්තර්ජාලය කෙතරම් දුරට හා කොපමණ විට භාවිත කිරීමට හැකි ද යන්න තීරණය කරන සාධක වේ. රජය මගින් නියාමනය හා අන්තර්ජාල වසා දැමීම අන්තර්ජාලයේ ජීවනෝපායන්ට බලපාන්නේ එය නිදහස් ප්‍රකාශනයට ද බලපෑම් එල්ල කරන බැවිනි. ලිංගික ශ්‍රමිකයන් වැනි අන්තරා වනසුළු කණ්ඩායම්වලට ඔවුන්ගේ ජීවනෝපායන් අන්තර්ජාලයේ නියාමනය නොවුණායි කියා කිසිදු නෛතික ආරක්ෂාවක් ද ඇති නොවේ. පරිශීලකයන් ප්‍රිය කරන ෆේස්බුක් හා වට්සැප් වැනි ආත්ම ප්‍රකාශනය සඳහා වූ වේදිකා ද, ඔවුන්ට එතරම් පාලනයක් ගෙන දෙන ඒවා නොවන්නේ ඔවුන් හුවමාරු කරන දත්ත පාලනය කිරීමට ඔවුන්ට හැකියාවක් නොමැති බැවිනි. අන්තර්ජාලයේ සුරක්ෂිතබව හා ආරක්ෂාව පිළිබඳ බිය ඔවුන්ගේ හා ඔවුන්ගේ දත්තවල පෞද්ගලික ආරක්ෂාව වැනි දෑ ජනතාව ස්වයං-වාරණය වෙත යොමු කළේ ය.

භාෂා භාවිතය අතීතයේ සිට ම ලංකාවේ සංකීර්ණ දේශපාලනික ගැටලුවකි. සමීක්ෂණයට අනුව ප්‍රතිචාරකයන්ගෙන් බොහෝ දෙනෙක් එදිනෙදා ජීවිතයේ මෙන් ම අන්තර්ජාලයේත් ද්විභාෂික වූහ. 30% කට වැඩි පිරිසක් අන්තර්ජාලයේ ඉංග්‍රීසි භාවිත කළ අතර, මෙයට සිංහල හා දමිළ භාෂා ශබ්ද මගින් (phonetic) සන්නිවේදනයට ඉංග්‍රීසි අකුරු භාවිතය ද අඩංගු වේ. මෑතක සිට අන්තර්ජාල වේදිකාවල බහුභාෂික පිවිසුම් වැඩි දියුණු වුණ ද, අප සමීක්ෂණය හා එක් වූ බොහෝ දෙනා කියා සිටියේ අන්තර්ජාලයේ මග සොයාගැනීමට ඔවුන්ට තවමත් කුඩා හෝ ඉංග්‍රීසි දැනුමක් අවශ්‍ය ම බවයි. බොහොමයක් මූලාශ්‍ර පවා ඉංග්‍රීසියෙන් පවතින බැවින් ඉංග්‍රීසි නොදත් අය හට විශාල තොරතුරු ඌනතාවකට මුහුණ දීමට සිදුවේ.

සමාජභාව හා ලිංගිකත්වය වටා වූ පදමාලා සලකා බලන විට පෙනීගියේ ගෝලීය LGBTQ+ ක්‍රියාකාරීත්වයේ භාවිත වූ පද සෑම විට ම සිංහල හෝ දෙමළ පරිවර්තනයක දී අදාළ හෝ ගැලපෙන ඒවා නොවූ බවත්, ඇතැම් විටක ඒවායේ අරුත් ලාංකීය සන්දර්භය තුළ නැතිවී ගිය බවත් ය.

## මෙම වාර්තාව මගින් පහත සඳහන් නිර්දේශ සිදුකරයි:

### රාජ්‍යය කාරකයන් සඳහා නිර්දේශ:

- ලිංගිකත්වය, සමාජභාවය හා ලිංගික චර්යාව පාදක කරගෙන පුද්ගලයින් සාපරාධීබවට පත් කරන නීතීන් අවලංගු කර, සංශෝධනය කරන්න.
- රාජ්‍යය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා ඩිජිටල් ප්‍රතිපත්ති සකසන කාර්යයන් සඳහා LGBTQ+ පුද්ගලයින් ඇතුළත් කරගන්න.
- ප්‍රජා-මුලික වූ විද්‍යුත්සන්නිවේදන යටිතල පහසුකම් ජාලා දියුණු කරන්න.
- තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වයට එරෙහිව නීති ක්‍රියාත්මක කිරීම හා ඒ හා කටයුතු කරන ICT නිලධාරීන්ගේ ධාරිතාවන් දියුණු කරන්න, තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය හඳුනාගෙන එයට ප්‍රචණ්ඩත්වය ලෙසින් සලකන්න, හානිකර නොවන අවසරය හා පෞද්ගලිකත්වය සහිත රාමුවක් තුළ මෙම සිද්ධි හසුරුවීමට පුහුණු කරන්න, සමාජභාව හා ලිංගිකත්ව අයිතින් මත පදනම් වූ වටහාගැනීමක් ඔස්සේ සංවේදීකෘතවන්න.
- වෛරී ප්‍රකාශන හා තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වයට භාජනය වූ අයට රජය දක්වන ප්‍රතිචාර මේ ආකාරයේ විකල්ප සහිත විය යුතුය: පවතින නීති සම්පූර්ණයෙන් ම යෙදවීම; නොමිලේ ලබා දෙන විවේචනාතමක නොවන මානසික සෞඛ්‍යය හා මනෝසමාජීය උපකාර වෙත පිවිසියහැකිබව; තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය වාර්තා කරන අයුරු පිළිබඳව තොරතුරු කරා පිවිසියහැකිබව; සිවිල් සමාජ ආයතන හා සම්බන්ධවීම මෙන් ම නීතිමය උපකාර ලබාගැනීම පිළිබඳව තොරතුරු.
- ඩිජිටල් ආරක්ෂාව, මාධ්‍යය සාක්ෂරතාව හා සවිස්තරාතමක් ලිංගිකත්ව හා සබඳතා අධ්‍යාපනය පිළිබඳව පාසල් මට්ටමේ වැඩසටහන් නිර්මාණය කර ක්‍රියාත්මක කරන්න.
- තොරතුරු ලබාගැනීමේ අයිතීන් උල්ලංඝනය කරන, ජනතාවගේ ආර්ථික හා සමාජීය ජීවිතවලට බලපෑ හැකි අන්තර්ජාල වසාදැමීම් කියා ද හැඳින්වෙන සිතාමතා ම සිදුකරන අන්තර්ජාල හා විද්‍යුත් සන්නිවේදන බිඳ දැමීම් නවතා දමන්න.

### සිවිල් සමාජ කාරකයන් සඳහා නිර්දේශ:

- පුද්ගලයන්ගේ ලිංගිකත්වය, සමාජභාවය හා ලිංගික චාර්යාව පාදක කරගෙන ඔවුන්ව සාපරාධී ලෙස සලකන නීති හා ප්‍රතිපත්ති අවලංගු කිරීම වෙනුවෙන් පෙනීසිටින්න.
- සිංහල හා දෙමළ භාෂාවලින් ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය හා අයිතීන්, ලිංගිකත්වය හා සමාජභාවය පිළිබඳව තොරතුරු ඇති අන්තර්ජාල මූලාශ්‍ර දියුණු කර ඒවා හුවමාරු කිරීමටත්, සාකච්ඡාකිරීමටත් උපකාරීවන අන්තර්ජාල අවකාශ නිර්මාණය කරන්න.
- LGBTQ+ ප්‍රජාවට තමන්ගේ භාෂාවන්ගෙන් තම කතා පැවසීමටත්, ඒවා බෙදාගැනීමට උපකාරී වීමටත් අවශ්‍ය සම්පත් වෙන් කරන්න.
- ජනතාවගේ අන්තර්ජාල පිවිසියහැකිබව, ඩිජිටල් සාක්ෂරතාව, ඩිජිටල් ආර්ථිකය ප්‍රවර්ධනය කරන තාක්ෂණික ආයතන හා සබැඳි පුහුණුකිරීම් හා වැඩසටහන්වලට සහයෝගය දක්වන්න.

- වෛරී ප්‍රකාශ හා ප්‍රචණ්ඩත්ව හමුවේ ඔවුන්ගේ අන්තර්ජාලාත්මක අයිතීන් මෙන් ම ඒවාට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව LGBTQ+ ප්‍රජාව අතර අවබෝධය හා දැනුම ශක්තිමත් කරවන්න.

- තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය ද සමාජභාව-පාදක කරගත් ප්‍රචණ්ඩත්වයේ කොටසක් ලෙස සලකමින් සිවිල් සමාජ සංවිධානවල (CSOs) විෂය පථය පුළුල් කර ඒවායේ පෙනීසිටීම්, ව්‍යාපාර හා සහයෝගීතාවලට ප්‍රචණ්ඩත්වයට භාජනය වූ අය ද එක් කරගන්න.

- වෛරී ප්‍රකාශන හා තාක්ෂණය සබැඳි ප්‍රචණ්ඩත්වයන්ට භාජනය වූ අය දක්වන ප්‍රතිචාර මේ ආකාරයේ විකල්ප සහිත විය යුතුය: පවතින නීති සම්පූර්ණයෙන් ම යෙදවීම වෙනුවෙන් පෙනීසිටීම; නොමිලේ ලබා දෙන තොර මානසික සෞඛ්‍යය හා මනෝසමාජීය උපකාර වෙත පිවිසියහැකිබව; ප්‍රචණ්ඩත්වය වාර්තා කරන අයුරු පිළිබඳව තොරතුරු ලබා දීම; ඒ හා කටයුතු කරන සිවිල් සමාජ ආයතන හා සම්බන්ධවීම මෙන් ම නීතිමය උපකාර ලබාගැනීම පිළිබඳව තොරතුරු.

- ඩිජිටල් ආරක්ෂාව, මාධ්‍යය සාක්ෂරතාව හා සවිස්තරාත්මක ලිංගිකත්ව හා සබඳතා අධ්‍යාපනය පිළිබඳව පාසල් මට්ටමේ වැඩසටහන් නිර්මාණය කිරීම වෙනුවෙන් පෙනීසිටින්න, සහයෝගය ලබාදෙන්න.

## අන්තර්ජාල වේදිකා සඳහා නිර්දේශ:

- තාක්ෂණය හා බැඳුණු ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමට උපකාරීවන මානව අයිතිවාසිකම් සම්මත හා අනුකූල වූ පැහැදිලි ප්‍රජා මාර්ග නිර්දේශ, නියාම හා කොන්දේසි ඇතුළත් කරගන්න.

- සිංහල හා දමිළ භාෂාවන්ගෙන් අන්තර්ගත මධ්‍යස්ථකරණය කිරීමට හැකියාවක් සියලු ම වේදිකාවලට තිබිය යුතු අතර, LGBTQ+ ප්‍රජාවට එරෙහි වූ ප්‍රචණ්ඩත්වයන් ඇතුළු ඔවුන්ට ලැබෙන සියලු වාර්තා ඇමතීමට හැකියාවක් ද තිබිය යුතු ය.

## මාධ්‍යය සඳහා නිර්දේශ:

- සිය මාධ්‍යය වේදිකාවල LGBTQ+ ප්‍රජාව නිරූපණයේදීත් වාර්තාකරණයේදීත් වෙනස්කොට සැලකීමෙන් වැළකී සිටීමට වගබලාගැනීමට අන්තර්ජාලයට ආවේණික වූ හා නොවන සියලුම අන්තර්ජාල මාධ්‍යය ක්‍රියාමාර්ග ගතයුතුයි.

## ශාස්ත්‍රීය නියැලීම් සඳහා නිර්දේශ

- සමීක්ෂණ හා පර්යේෂණ දේශීයකරණය, දේශීය භාෂාවන්ට පරිවර්තනයට සීමා නොවී ඉන් ඔබ්බට ගමන් කළ යුතුය. දේශීයව භාවිතවන හා අවබෝධවන පදමාලාවන් භාවිත කර, අත්දැකීම ලේඛනගතවන ප්‍රජාවන්ගේ අනුදැනුම සහිතව පමණක් ඒවා භාවිත විය යුතුය.

- මෙම පර්යේෂණයේ විෂය පථයෙන් පිටත වූ අනතර්ජාලය හා LGBTQ+ ප්‍රජාවේ මානසික සෞඛ්‍යය අතර ඇති සබඳතා ගවේෂණය කරන්න.

# හැඳින්වීම

2019 සිට 2020 දක්වා වූ කාල වකවානුවේ අපි ශ්‍රී ලංකාවේ LGBTQ+ ජනතාව මෙන් ම විවිධාකාර වූ සමාජභාව අනන්‍යතා හා ප්‍රකාශන ඇති අය අන්තර්ජාලය භාවිත කරන ආකාරය වටහාගැනීම සඳහා ගමනක් ආරම්භ කළෙමු. තවමත් ශ්‍රී ලංකාවේ විෂම සම්මත නොවන ලිංගික අනන්‍යතා හා චර්යා සාපරාධී ලෙස සැලකෙන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 හා 365අ වගන්තිවල "ස්වභාවධර්මයට විරුද්ධව කාමුක සංසර්ගයේ යෙදීම" හා "තදබල අශෝභන ක්‍රියා" මෙන් ම 399 වගන්තියේ එන "අනෙකෙකු ලෙස පෙනීසිටීමෙන් වංචා කිරීම" ට අනුකූලවයි. 2016 වර්ෂයේදී නඩු තීන්දුවක් තුළින් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ "වත්මන් චින්තනයට අනුව වැඩිහිටියන් අතර ඒකමතිකව සිදුවන ලිංගික එක්වීම් රජය මගින් නියාමනය නොවිය යුතු බව හා කෙනෙකු සාපරාධීකරණය කිරීමට කාරණයක් ලෙස භාවිත නොවිය යුතු බවත්", එම ලිංගික ක්‍රියාකාරකම් සිදුවන්නේ ඒකමතික වැඩිහිටියන් අතර නම් අත්අඩංගුවට නොගෙන අත්හිටවූ සිර දඬුවමක් ලබා දිය යුතු බවයි. මෙය LGBTQ+ ජනතාවගේ ස්ථාවරයට උපකාරී වන අතර මින් පෙනීයන්නේ දණ්ඩ නීති සංග්‍රහය මෙන් ම අයාල ආඥාපනත හා අසැබි ප්‍රකාශන පනත වැනි නීති ද අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමටත් අවලංගු කිරීමටත් ලක්විය යුතු බවයි.

ශ්‍රී ලංකාවේ ජනතාවට මුහුණපෑමට සිදුවන වෙනස් කොට සැලකීම්, නිගාකිරීම් හා ප්‍රචණ්ඩත්වය මෙන් ම ඒවා සිදු කරන රජය ඇතුළු පීඩකයන් භුක්ති විඳින නිර්දෝෂීබව ද නිරන්තරයෙන් ලේඛනගත වෙයි (Human Rights Watch, 2016) මේ වන විට සමලිංගිකත්වය නිරපරාධීකරණය කිරීමට ප්‍රයත්න (Sri Lanka Brief) හා ආමන්ත්‍රණයන් (Women and Media Collective, 2016) මෙන් ම ජනාධිපති අපේක්ෂකයකු LGBTQ+ ජනතාවගේ අයිතිවාසිකම් සුරැකීමට ඇති අවශ්‍යතාව පිළිබඳව ප්‍රසිද්ධියේ පිළිගැනීම (Ceylon Today, 2019) වැනි කුඩා වූවත් ප්‍රගතිශීලි නිමිති ද පවතියි. කෙසේවෙතත්, බොහෝදුරට LGBTQ+ ප්‍රජාවගේ ජීවිතත්, ඔවුන්ගේ පැවැත්මත් තවමත් අදිසිකරණය කෙරෙයි (ජයසිංහ, 2019).

තිස් වසරක ජනවාර්ගික අර්බුදයෙන් පසුව පැමිණි දශකයේ, පශ්චාත්යුධමය ශ්‍රී ලංකාව ආණ්ඩු හා රාජ්‍යතන්ත්‍ර මාරු දෙකක්, නවලිබරල් ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රගුණනය (කදිරගාමර්, 2013), වැඩෙන සෝදිසිය (Human Rights Watch, 2020) වැඩෙන ලිංගික ගතානුගතිකත්වය (වික්‍රමසිංහ, 2020) හා වැඩෙන වාර්ගික-ආගමික ජාතිකවාද ද (පෙරේරා, 2016) දැක ඇත. මෙම කාලවකවානුවේ විශේෂත්වය වන්නේ අන්තර්ජාලය, විශේෂයෙන් ම සමාජ මාධ්‍යය සිංහල බෞද්ධ ජාතිකවාදයේ නැගීම හා එහි සාධාරණීයකරණය (ඉවාර්සන්, 2019) ඇතුළු ඉහත සඳහන් සියල්ලේ ම යම්කිසි භූමිකාවක් රඟ දක්වා තිබීමයි. ඇත්ත වශයෙන් ම, ශ්‍රී ලංකාවේ අන්තර්ජාල පිවිසුම හා භාවිතය අඩු මට්ටමක පැවතියත්, පර්යේෂණ දක්වන්නේ ශ්‍රී ලංකාවේ සෑම අන්තර්ජාල පරිශීලකයකු පාහේම සමාජ මාධ්‍ය පරිශීලකයන් ද වන බවයි (ගල්පාය සහ පිරිස., 2019). මිනිසුන් ඔවුන්ගේ දේශපාලනික හා සමාජීය ජීවිත ගත කරන අඛණ්ඩතාවයේ කොටසක් ලෙස අන්තර්ජාලය සැලකිය හැකිනම්, මෙය LGBTQ+ ජනතාවට ද බලපැවැත්වේ. ඔවුන් ක්‍රියාකාරීත්වය සඳහා අන්තර්ජාල භාවිතය මීට පෙර ලේඛනගත කර ඇතත් (දේශප්‍රිය සහ පිරිස, 2017), මෙම අධ්‍යයනයෙන් අපි වටහාගන්නට තනන්නේ ක්‍රියාකාරීත්වයෙන් ඔබ්බට LGBTQ+ ප්‍රජාවේ එදිනෙදා අන්තර්ජාල භාවිතය හා ඔවුන්ගේ අන්තර්ජාල පැවැත්ම තුළින් ඔවුන් ලබන්නට තැත් දරන කාරකත්වය කුමනාකාරයේ එකක් ද කියායි.

**අප බලාපොරොත්තුවන්නේ අපේ සොයාගැනීම් මෙන් ම මෙම අධ්‍යයනයේ ලේඛනගත වී ඇති LGBTQ+ ජනතාව හා වෙනත් අයගේ අත්දැකීම් හා මෙනෙහි කිරීම් තුළින් විවිධත්වයකින් යුතු ලිංගික දිශානති හා සමාජභාව අනන්‍යතා හා ප්‍රකාශන (SOGIE)**

අන්තර්ජාලය, සමාජභාවය, ලිංගිකත්වය, ජනවර්ගය ආදියේ ඡේදනයන් ගවේෂණය කරන පර්යේෂණ කිහිපයක් අතර මෙම වාර්තාව සමාගම සොයනු ඇත (ඇමුණුම 2). අප බලාපොරොත්තුවන්නේ අපේ සොයාගැනීම් මෙන් ම මෙම අධ්‍යයනයේ ලේඛනගත වී ඇති LGBTQ+ ජනතාව හා වෙනත් අයගේ අත්දැකීම් හා මෙනෙහි කිරීම් තුළින් විවිධත්වයකින් යුතු ලිංගික දිශානති හා සමාජභාව අනන්‍යතා හා ප්‍රකාශන (SOGIE) ඒ හා බැඳුණු අපකීර්තියෙන් මුදවාලීම වෙනුවෙන් ක්‍රියාකිරීමටයි. මෙම අධ්‍යයනය පැවැත්වූයේ ප්‍රගතිශීලි සන්නිවේදන සමාගමේ ස්ත්‍රී අයිතිවාසිකම් වැඩසටහන යටතේ එරොටික්ස්: ලිංගිකත්වය පිළිබඳ ගවේෂණාත්මක රචනා හා අන්තර්ජාල ව්‍යාපෘතියේ කොටසක් ලෙස වන අතර, එයට ඇම්ප්ලිෆයිචේන්ජ් (Amplify Change) ආයතනය සහාය දැක්වීය. අවසාන වශයෙන්, මෙම අධ්‍යයනය සම්පූර්ණ කෙරුණේ දැනට පවතින කෝවිඩ්-19 වසංගතය හා ඒ සබැඳි මහජන සෞඛ්‍යය පියවරවලට පෙරයි. එම නිසා වසංගතය අතරතුර අන්තර්ජාල භාවිතය පිළිබඳව විශේෂිත වූ පර්යාලෝක මෙම අධ්‍යයනයේ විෂය පථයෙන් බැහැර වූ නිසා මෙම වාර්තාවේ ඇතුළත් කර නොමැත.

# ක්‍රමවේද, සීමා හා අභියෝග

මෙම අධ්‍යයනය කොටස් දෙකකට සිදුවිය: පළමු කොටස වූයේ ප්‍රමාණාත්මක සමීක්ෂණයකි (ඇමුණුම 1), දෙවන කොටස වූයේ තෝරාගත් ප්‍රතිචාරකයන් කිහිප දෙනෙකු හා ගැඹුරු ගුණාත්මක සම්මුඛ සාකච්ඡා මාලාවකි.

## ප්‍රමාණවත් පර්යේෂණ

මෙම සමීක්ෂණය මුලින් අන්තර්ජාලයේ පමණක් සිදු කරන්නට සිතුවත්, එයට බාධක කිහිපයක් බලපෑවේ ය. උදාහරණ ලෙස, ක්‍රියාකාරී අවකාශවල නොවූ LGBTQ+ පුද්ගලයන් වෙත හෝ විෂමසම්මතයෙන් පිටතට අත්දැකීම් පතිතවන ලිංගික ශ්‍රමිකයන් වෙත අන්තර්ජාලය ඔස්සේ සමීක්ෂණ මෙවලමකින් පමණක් පිවිසීමට හැකි වේ යැයි අපි විශ්වාස නොකළෙමු. තවද, නොයෙකුත් තාක්ෂණික බාධා ඇති වූයේ සමහර ප්‍රතිචාරකයන්හට අන්තර්ජාලයට පිවිස, මෙම සමීක්ෂණය පුරවන්නට නොහැකි වූ බැවින් මෙන් ම මෙම සමීක්ෂණයයේ සිංහල, දෙමළ යන දේශීය භාෂාවන්ගෙන් යොදාගත් පාරිභාෂික පදමාලා සමග උද්ගත වූ අභියෝග හේතුකරගෙන ය (පහත සීමා අංශයේ මෙය විස්තර කර ඇත). ඒ හේතුවෙන් අප තීරණය කළේ මුහුණට මුහුණ හමුවීම් සංවිධානය කිරීමටත්, ප්‍රජාමූලික අවකාශයන්වල ඒ වන විට තිබූ හමුවීම්වලට එක් වී සමීක්ෂණයේ ඝන පිටපත් බෙදා දීමටත් ය. එවැනි රැස්වීම් 5ක් පැවැත්විණි. ප්‍රතිචාරකයන්ට සමීක්ෂණය පිරවීමටත්, එහි ආකෘතිය හා අන්තර්ගතය පිළිබඳව ප්‍රතිචාර ලබා දීමටත්, LGBTQ+ භාෂාවේ දේශපාලනය පිළිබඳ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගිවීමටත් හැකි විය. මුහුණට මුහුණ පැවැති රැස්වීම්වල ප්‍රතිචාර අන්තර්ජාල සමීක්ෂණ ආකෘතියට එක් කෙරුණේ අවසාන විග්‍රහය සඳහා ය. මෙහි දී ඇතිවූ LGBTQ+ භාෂාවල දේශපාලනය පිළිබඳ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් සමූහමූලික වූ 'සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමාජභාවය හා ලිංගික දිශානතිය සඳහා වූ පාරිභාෂික පදමාලාව' ඇති විය.

සමීක්ෂණ මෙවලම ඉංග්‍රීසියෙන් සාදා දෙමළ හා සිංහල භාෂාවන්ට පරිවර්තනය කෙරුණි. මෙ මගින් එය දේශීය

**විශේෂයෙන් ම එය තවත් එක් අහඹු සමීක්ෂණයක් බවට පත් නොවූයෙන් ප්‍රතිචාරකයන් හා විශ්වාසයක් මෙන් ම හිතවත්කමක් ගොඩනගාගැනීමටත් අපට හැකිවිය.**

පදමාලාවලට අභියෝග ඇති කළ අයුරු පහත අංශයේ දී සාකච්ඡා කෙරේ. අන්තර්ජාල සමීක්ෂණ මෙවලම භාෂා තුනෙන් ම වට්සැප් කණ්ඩායම්, පෞද්ගලික හා පොදු සමාජ මාධ්‍ය පිටු ඔස්සේ, ෆේස්බුක් හා ට්විටර් ඔස්සේ, ඊ තැපෑල මෙන් ම ප්‍රජාමූලික ආයතනවල ජාල ඔස්සේ ද බෙදා හැරුණි. මෙම හුවමාරු ක්‍රමය වාසි කිහිපයක් ගෙන ආවේ ය. විශේෂයෙන් ම එය තවත් එක් අහඹු සමීක්ෂණයක් බවට පත් නොවූයෙන් ප්‍රතිචාරකයන් හා විශ්වාසයක් මෙන් ම හිතවත්කමක් ගොඩනගාගැනීමටත් අපට හැකිවිය. එ තුළින් හරවත් සාකච්ඡාවලට ද මග සැලසුණි. මෙම සමීක්ෂණය ප්‍රජාවෙන් යමක් ලබාගන්නා- එක් අතකට පමණක් සීමා වූවක් නොකර, ව්‍යාපෘති අරමුදල භාවිත කරමින් ප්‍රජාමූලික අවකාශ හා ආයතනයන්ට උපකාරී වීමට ද අපට හැකිවිය.

සමූලයක් වශයෙන්, සමීක්ෂණය මුළුමනින් ම සම්පූර්ණ කළ ප්‍රතිචාරකයන් 103ක් විය, එහෙත් තවත් 9 දෙනෙකු අනිවාර්ය ප්‍රශ්න අසම්පූර්ණව තැබූ නිසා ඔවුන්ගේ ප්‍රතිචාර අවසාන විග්‍රහයේ යොදා ගැනීමට නොහැකි විය.

## ගුණාත්මක පර්යේෂණ

ඉහත සඳහන් අයුරින් ප්‍රමාණාත්මක සමීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා අපි ප්‍රතිචාරකයන් හා හමුවීම් 5කට එක් වුණෙමු/සංවිධානය කළෙමු. මින් සමහර හමුවීම් සැකසී තිබුණේ අප හමුවීම සංවිධානය කළ ආයතනය හෝ කණ්ඩායමට අනුව ඔවුන් හා සබඳතා පැවැත් වූ විවිධ කණ්ඩායම්වලිනි. එක් හමුවීමක් සංක්‍රාන්තිලිංගික කාන්තාවන් හා පුරුෂයන්ගෙන් පමණක් ද, තවෙකක් සංක්‍රාන්ති නොවන ස්ත්‍රී ලිංගික ශ්‍රමිකයන්ගේ ද, අනෙක්වා LGBTQ+ වර්ණාවලිය හරහා මිශ්‍ර වූ අයගේ සහභාගීත්වයෙන් ද පැවැත්විණි.

සෑම හමුවීමකදී ම ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක් පැවතුණු අතර ඒවා තුළින් සහභාගීවූවන්හට ප්‍රශ්න පැහැදිලි කිරීම, පරිවර්තන හා පද පැහැදිලි කිරීම මෙන් ම සමීක්ෂණය පිළිබඳව ප්‍රතිපෝෂක ලබාගැනීම ද සිදුවිය. ඔවුහු ඒ ප්‍රතිපෝෂක අතර අපට තවත් ගැඹුරින් පර්යේෂණය කළ හැකි දෑ පවසමින්, භාෂා දේශපාලනය පිළිබඳ සාකච්ඡා අරඹමින්, අන්තර්ජාලය සුරක්ෂිතව හා තෘප්තිය දනවන අයුරින් භාවිත කිරීමට අවශ්‍ය හැකියා වර්ධනය සඳහා ඇති අවශ්‍යතාව පිළිබඳව ද අප හා පැවසූහ.

මෙම ඉලක්ක කණ්ඩායම් හමුවීම් පවත්වන විට අප උගත් දෙයක් වූයේ ආයතනමය පසුබිමක සාකච්ඡා පැවැත්වීම එකිනෙකා සමග කාලය ගත කරන අනාකෘතික අතික්‍රාන්ත ජනතාව සම්බන්ධ කරගැනීමට හොඳ ම මාර්ගය නොවන බවයි. මෙය දැනගත් පසු අපි අතික්‍රාන්ත-හිතකර ස්ථානයක ප්‍රජා සමාජ හමුවක් සංවිධානය කළෙමු. මෙහිදී එකිනෙකා සමග සමාජානුයෝජනය වෙමින් සමීක්ෂණය පිරවූ සහභාගී වූවෝ, එහි වූ පාරිභාෂික පද පිළිබඳව සාකච්ඡා කරමින් පදමාලාවට අලුත් පද එක් කිරීමට ද හවුල් වූහ. අපි මෙම හමුව කාන්තාවන් ලෙස තමන්ව ම හඳුනාගන්නා අයට පමණක් සීමා කළේ "වෙනත් පෙදෙස්වල මෙන් ම ලංකාවේ ද අතික්‍රාන්ත ව්‍යාපාරවල ඉතිහාස බොහෝවිට කියැවෙන්නේ පුරුෂ සමලිංගික ඉතිහාසවල දෘෂ්ටිවලින්" (විජේසිරිවර්ධන, 2017) බැවින් ය. චලනතාව මෙන් ම වෙනත් ආකාරයේ නිදහස් මත ද පැනවුණු පිතෘමූලික බාධක, ස්ත්‍රීන් හා කාන්තාවන්ට හමුවීමටත් සමාජානුයෝජනයටත් ඇති අවස්ථා මත සීමා පනවයි සමලිංගික ද්විලිංගික අතික්‍රාන්ත කාන්තාවන් අතර අන්තර් පරම්පරා සබඳතා ගොඩනැගීමට මෙම සමාජ හමුව ඇතුළු ඉලක්ක කණ්ඩායම් වැදගත් වී ය. 2012 කාන්තා සහයෝගීත්ව කණ්ඩායම (WSG) විසිර යෑමත්

සමග ම LBQ කාන්තා සංවිධානවල පරතරයක් ඇති විය. තරුණ LBQ කාන්තාවන් අනාකෘතිකව පහුගිය වසර කිහිපයේ දී සංවිධානය වුව ද, ඔවුන්ට පෙර පරම්පරා හා සම්බන්ධ වීමට අවස්ථා ඇති නොවීය. එම නිසා මෙම රැස්වීම් එකිනෙකා හමුවීමට, සම්බන්ධ වීමට, මෙන් ම කතා හා අත්දැකීම් හුවමාරුවට ද ඉඩකඩ සලසාදීම පිළිබඳව අපි සතුටු වෙමු.

**සමීක්ෂණ ප්‍රතිචාරකයන් 103න් 50ක් පැවසූයේ අන්තර්ජාලයේ ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව තවදුරටත් අප හා කතාකිරීමට උනන්දු බවයි.**

සමීක්ෂණ ප්‍රතිචාරකයන් 103න් 50ක් පැවසූයේ අන්තර්ජාලයේ ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව තවදුරටත් අප හා කතාකිරීමට උනන්දු බවයි. භාෂාව මත සලකා එම ප්‍රතිචාරකයන් අතරින් 13 දෙනෙක් (දෙමළ-5, සිංහල-4, ඉංග්‍රීසි -4) තෝරාගත් අතර, මෙම නියැදිය තුළ නියෝජනය වන අනන්‍යතාවල විවිධත්වය සහතික කිරීම, ඔවුන්ගේ ප්‍රතිචාර තවත් ගැඹුරින් ගවේෂණය කිරීමට ඇති හැකියාව ආදී දේ මත එම තේරීම පදනම් විය. සහභාගී වූ සියල්ලන්ගේ ම නම් මෙම වාර්තාව තුළ වෙනස් කර ඇත්තේ ඔවුන්ගේ පෞද්ගලිකත්වය සුරැකීමටයි. මෙම සම්මුඛ සාකච්ඡා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ක්‍රියාත්මක වූයේ ඔවුන්ගේ කැමැත්ත පාදක කරගෙ නයි. දෙමළෙන් හා සිංහලෙන් පැවැති සම්මුඛ සාකච්ඡා ඉංග්‍රීසියට ද පරිවර්තනය කෙරුණි.

පහත සොයාගැනීම් දක්වා ඇත්තේ සමීක්ෂණ දත්ත විශ්ලේෂණය කිරීමෙන් ලබාගත් තේමා යටතේ වන අතර-ඒවා තව දුරටත් විස්තර කිරීමටත්, ඒවාට සහයවීමටත් ගුණාත්මක සම්මුඛ සාකච්ඡා භාවිත කෙරේ. LGBTQ+ පදය මෙම අධ්‍යයනයේ යොදාගෙන ඇත්තේ සහභාගිවූවන්ගේ අනන්‍යතා ගම්‍යවන ලෙසයි. ඒ තුළ එක්තරා විදියකට පමණක් තමන්ව ම හඳුනාගැනීමට අකැමැති වූ අය මෙන් ම තමා ද්වීමය (නොන්-බයිනරි නොවන) බව

පැවසුවන් ද ඇතුළත් වේ. මෙම සමීක්ෂණය හා ඒ හා බැඳුණු සාකච්ඡා සම්මත නොවන ලිංගිකත්ව හා ලිංගික චර්යා සහිත ඕනෑම අයෙකුට විවෘත වූ නිසා උදාහරණයක් ලෙස ලිංගික ශ්‍රමිකයන් වැනි අය ද මේ වාර්තාවට අදාළ බව සඳහන් කර ඇත.

## සීමා සහ අභියෝග

මෙම පර්යේෂණයේ සොයාගැනීම් දෙස බැලිය යුත්තේ සීමා හා අභියෝග කිහිපයක් ඇති සන්දර්භයකයි. මූලික සීමාවක් ලෙස සැලකිය හැක්කේ මෙම සමීක්ෂණයේ පළමු සැකැස්ම (රටවල් 3ක් සඳහා වූ බැවින් එය APC අතින් නිමවුණි) ප්‍රතිචාර සඳහා LGBTQ+ ප්‍රජාව හා බෙදා ගැනීමට කාලය වෙන් කර තිබුණත් පාලනය කළ නොහැකි හේතූන් නිසා සිදු වූ ප්‍රමාදවීම් හේතුවෙන් එසේ කිරීමට නොහැකි විණි. මේ නිසා සමීක්ෂණයේ ඉදිරිපත් කර තිබූ අනන්‍යතා කාණ්ඩවල සීමා ඇති වූයෙන් සමහර ප්‍රතිචාරකයන්හට ඒ කිසිවක් හා හඳුනාගැනීමට අපහසු වියි උදාහරණයක් ලෙස, ඇතැම් සංක්‍රාන්තිලිංගිකයන් සංක්‍රාන්ති නොවන විකල්ප භාවිත කළේ සමීක්ෂණය තුළ ඔවුන්ගේ හඳුනාගත් සමාජභාවය ගම්‍යවන පිළිතුරක් නොතිබුණු නිසාවෙනි. සමීක්ෂණයේ ජනවර්ග රාමු කර ඇති ආකාරය සමග ද ඇතැම් දමිළ ප්‍රතිචාරකයන් එකඟ නොවී ය.

සමීක්ෂණය බෙදාහැරීමට ප්‍රජා වෙත යොමුවීමට තිබූ ඵලදායී ම ක්‍රමය වූයේ ප්‍රජා සංවිධාන හා ඒවායේ ජාල ඔස්සේ ය. කෙසේ වෙතත් එවැනි ක්‍රියාකාරී අවකාශවල නොසිටි එහෙත් අනාකෘතිකව සමාජීයව සංවිධානය වූ LGBTQ+ ජනතාව ද සිටියහි එමෙන් ම LGBTQ+ යන පුළුල් පදය තුළට නොවැටෙන නිසා හැමවිට ම (විවිධ සමානකම් තිබුණත්) එම ජාලවල හෝ ප්‍රජා සංවිධානවල ඇතුළත් නොවන, විෂම සම්මතයෙන් ද පිටතට වැටෙන ලිංගික ශ්‍රමික කණ්ඩායම් වැනි අයගේ අත්දැකීම් හා චර්යා ද මේ අතර වේ. මෙය සිහි තබාගත් අපි, එයට යෙදූ පිළියම වූයේ අපගේ සබඳතා පැතිරවීමේ සැලැස්ම තුළින් නොයෙක් ක්‍රම ඔස්සේ මෙම අධ්‍යයනයේ විෂය පථය තුළ අපට ඇතුළත් කළ හැකි තරමක් පුද්ගල කණ්ඩායම් හා එකතු වීමයි කෙසේවෙතත් මෙය සීමාවක් ලෙස පවතී.

සමීක්ෂණය දෙමළ හා සිංහල භාෂාවන්ට පරිවර්තනය කිරීමේ දී අපට අභියෝග කිහිපයකට මුහුණ දීමට සිදුවූයේ මෙහි යෙදුණ 'queer' හෝ 'non-binary' වැනි සමහර ඉංග්‍රීසි පාරිභාෂික පද දේශීය භාෂාවන්ට හෝ වැටහීමට අනුකූලව පහසුවෙන් පරිවර්තනය කිරීමට නොහැකි වූ බැවිනි ප්‍රජාව මගින් මෙහි පළමු සැකැස්මේ ගුණදොස් විවේචනය කරගැනීමට හැකි වූවා නම් මෙම තත්ත්වය මගහරවා ගන්නට ඉඩකඩ තිබුණි. සමීක්ෂණයේ දමිළ පරිවර්තනයේ දී කාර්මික දෝෂයක් මතුවූයේ සමීක්ෂණ පරිපාලකයා විසින් එක ම ප්‍රශ්නය දෙවරක් සඳහන් කර, තවෙකක් ඉවත්කර ඇති බැවිනි. මේ හේතුවෙන් තමන්ගේ උපකරණ පාලනය කිරීමේ හැකියාව කොපමණ දුරට තිබුණේ දැයි ඇසූ පැනයට ප්‍රතිචාරකයන් 30ක් පමණ පිළිතුරු ලබා දී නැත.

ආරම්භයේ දී මෙම සමීක්ෂණය ප්‍රධාන වශයෙන් අන්තර්ජාලයේ පැවැත්වීමට තීරණය කර තිබුණ ද ඉහත හේතු නිසා මෙන් ම අපගේ ඇතැම් ප්‍රතිචාරකයන්ට අන්තර්ජාල සමීක්ෂණයට පිවිසීමට හා එය පිරවීමට ඇති තාක්ෂණික හැකියා පිළිබඳවත් සිතූ අපි මුහුණට මුහුණ රැස්වීම් සංවිධානය කිරීමටත්, දැනට ප්‍රජා මූලික අවකාශවල පැවැත්වෙන රැස්වීම්වලට සහභාගි වී සමීක්ෂණවල ඝන පිටපත් බෙදා හැරීමටත් තීරණය කළෙමු. සමීක්ෂණය පිරවීමටත්, එහි ආකෘතිය හා

අන්තර්ගතය පිළිබඳ අදහස් දැක්වීමටත් LGBTQ+ භාෂාව පිළිබඳ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගි වීමටත් ප්‍රතිචාරකයන්හට අවස්ථාව ලැබුණි. මෙම ප්‍රජා රැස්වීම්වලට සීමිත ප්‍රේක්ෂක පිරිසක් සහභාගි වූ අතර, සහභාගීත්වය තීරණය වූයේ සුරක්ෂිතබව, ආරක්ෂාව හා රැස්වීම්වලට සහභාගිවීමට ඔවුන්ට ඇති කැමැත්ත මතයි. එම නිසා එය ද මෙම අධ්‍යයනයේ වූ එක්තරා සීමාවක් ලෙස ද සැලකිය හැකිය. කෙසේ වෙතත්, මෙම අන්තර්ජාල සමීක්ෂණය සමාජ මාධ්‍ය කණ්ඩායම් හා ජාලවල බෙදා හැරුණේ පුළුල් ප්‍රේක්ෂක පිරිසක් අතර පැතිරවීමේ අරමුණෙනි.

සාකච්ඡා අතරතුර මෙම සමීක්ෂණයේ තවත් සීමා ඇති බවට හෙළිදරව් විය. ඇතැම් ප්‍රතිචාරකයන් දැක්වූයේ සමීක්ෂණයේ සංක්‍රාන්ති නොවන හෝ සංක්‍රාන්ති යනුවෙන් සමාජභාවය සඳහා විකල්ප පිළිතුරු දෙකක් තිබුණ ද, ඔවුන් සිස්-සමාජභාව නොවූවද තමාව නිතැතින් ම ස්ත්‍රී පුරුෂ ලෙස හඳුනාගත් බවයි. එම නිසා ඔවුනට හැඟී ඇත්තේ සමීක්ෂණයේ තමන්ගේ අනන්‍යතාවට ඉඩකඩ නොතිබූ බවයි. නැගෙනහිර පළාතේ ඉලක්ක කණ්ඩායමක අනන්‍යතාව තෝරාගැනීමට අවස්ථා ලැයිස්තුවක් දුන් විටක 'සුළුතර ජනවර්ගය' යන පද පිළිවෙළ පිළිබඳව ගැටලුවක් පැන නැගුණේ ඔවුන් 'ජනවර්ගය හේතුවෙන් වෙනස් ලෙස හෝ ආන්තික ලෙස සලකන අය' යන පද පිළිවෙළ වඩාත් යෝග්‍ය බව සිතූ බැවිනි. එම නිසා සමීක්ෂණය තුළ සුළුතර ජනවර්ගයක් ලෙස තමාව හඳුනා නොගැනීමට බොහෝ අය තීරණය කළහ. එම තීරණයට අප ගරු කරන්නේ එම නිසා ඒ විවිධ ජනවර්ග නියෝජනය සොයාගැනීම්වල සම්පූර්ණයෙන් ම පරාවර්තනය නොවන බව ද පිළිගනිමිනි.

අතින් සමීක්ෂණ පුරවාගනිද්දි අප මුහුණදුන් මූලික ගැටලුවක් වූයේ සියලු ම අනිවාර්ය ප්‍රශ්න පිරවේ යැයි තහවුරු කරගැනීමයි. අප මේ ගැන ප්‍රතිචාරකයන්ට නිතර මතක් කළත් LGBTQ+ භාෂාව දේශීය භාෂාවන්ට පරිවර්තනයේ දී මතු වූ අභියෝග හේතුවෙන් ද,'සමහරවිට', 'ඉඳහිට' වැනි බහුවර්ණ පිළිතුරුවලින් ඇති වූ ව්‍යාකූලතා හේතුවෙන් ද අසම්පූර්ණ වූ සමහර සමීක්ෂණ ඇතුළත් කරගන්නට නොහැකි විය. ඇතැම් ප්‍රතිචාරකයන් තෝරාගැනීමට පිළිතුරු දක්වා තිබෙද්දී ඔවුන්ගේ ම පිළිතුරු ලියා තිබුණෙන් එම පිළිතුරු ප්‍රමාණික විග්‍රහයේ ඇතුළත් කිරීමට ද නොහැකි විය.

# සොයාගැනීම්

මෙම වාර්තාව ආරම්භයේ සඳහන් වූ සොයාගැනීම් දළ විශ්ලේෂණයට අනුව ඉන් ගම්‍ය වුණු ප්‍රධාන තේමා එකිනෙකට සම්බන්ධ වන අතර ම, ඒවා තේරුම්ගත යුත්තේ ද ඒ ආකාරයෙනි. කෙසේ වෙතත්, පහත සඳහන් තේමාවලි ඔස්සේ මෙම සොයාගැනීම් කරා පිවිසිය හැකිය:

1) අන්තර්ජාල භාවිතය හා අන්තර්ජාලයේ ප්‍රකාශනය;
2) ප්‍රජාව සොයාගැනීම හා ජීවනෝපාය;
3) පිවිසියහැකිබව හා නියාමනය.

# ප්‍රතිචාරකයන් කවුරුන් ද?

## වයස

අපගේ ප්‍රතිචාරකයන්ගෙන් බහුතරයක් වයස් 18-44ත් අතර වූ අතර, ඔවුන්ගේ මධ්‍යස්ථ වයස 28ක් පමණ විය. ඔවුන්ගෙන් සීයට තිහක් වයස 25ට අඩු වූ අතර 34% වයස 25-30ත් අතර විය. 1 සිට 10 දක්වා (10 වැඩිම අගය වේ) පරිමාණයක, ප්‍රතිචාරදක්වන්නන් 100 දෙනා අතරින් 35ක් අන්තර්ජාලය ආත්ම ප්‍රකාශනයට වැදගත් අවකාශයක් යැයි පැනයට 10ක් ලබා දුන් අතර ඔවුන් අතරින් 23 දෙනෙකු වයස 30 හෝ ඊට අඩු අය විය (71%).




*රූපසටහන 01: ඔබේ වයස කීයද?*



සංක්‍රාන්ති නොවන සමලිංගික පුරුෂයකු වන මෙලනි එම පරිමාණයෙ, අන්තර්ජාලය ආත්ම ප්‍රකාශනය වෙනුවෙන් වූ අඩවියක් ලෙස ලකුණු කළේ 5වෙනි මට්ටමේ ය. වසර 10කට පමණ පෙර අන්තර්ජාලය භාවිත කිරීම ඇරඹූ ඔහු වසර 20ක් පමණ ඩ්‍රැග් රංගනවල යෙදී ඇති නිසා ඔහුව හඳුන්වන්නේ ඔහුගේ රංගන නාමයෙනි. එම නිසා අන්තර්ජාලය ඔහු ආත්ම ප්‍රකාශන කරන තවත් එක් තැනක් පමණි. එය ඔහුගේ ආත්ම ප්‍රකාශනයට වඩාත් ම වැදගත් අවකාශය ද නොවේ.



නමුත් ද්වීමය නොවෙන්නෙකු ලෙස තමන්ව ම හඳුනාගන්නා 30 හැවිරිදි විරාන් අන්තර්ජාලය භාවිත කර ඇත්තේ ඔවුන්ගේ ළමා කාලයේ සිටයි. ඔවුන්ගේ අනන්‍යතාව වටහාගත්, වැළඳගත් ඒ වගේ ම තමන් ලෙස සම්පූර්ණයෙන් ම පෙනී සිටීමට ද හැකි වූ අවකාශය වූ නිසා ඔවුන් අන්තර්ජාලයට 10ක අගයක් ලබා දුනි. වයස යනු මෙලනිගේ හා විරාන්ගේ ආත්ම ප්‍රකාශය වෙනුවෙන් අන්තර්ජාල භාවිතය හා අත්දැකීම තීරණය කළ එක ම සාධකය නොවුණත්, ඔවුන් අන්තර්ජාල භාවිතය ඇරඹූ වයස ඔවුන් එය ප්‍රකාශන අවකාශයක් ලෙස දැකීම කෙරෙහි බලපා ඇත.

## රැකියාව

අපගේ ප්‍රතිචාරකයන් 39.8% රාජ්‍ය නොවන ආයතනවලින් පැමිණි අය හෝ ක්‍රියාකාරීන් වේ. ප්‍රතිචාරකයන්ගෙන් 60% වෙනත් අංශවලිනි. මෙය විශේෂිත වන්නේ අපි එන්.ජී.ඕ අංශයෙන් පිටත උන් ප්‍රතිචාරකයන් හා සම්බන්ධ වූයේ හිතාමතාම වූ නිසයි. ඒ පෙනිසිටීම හා ක්‍රියාකාරීත්වයට එපිටින් සිටි LGBTQ+ පුද්ගලයන් අන්තර්ජාලය තුළ මුහුණදුන් අත්දැකීම් ගොනු කිරීමටයි. ප්‍රතිචාරකයන්ගෙන් 7.8% රැකියා විරහිත වුව ද 'වෙනත්' යැයි ලකුණු කළ බොහෝ දෙනෙක් විස්තර කළේ ඔවුන් 'දැනට රැකියාවක් නොකරන'. බවයි නැතිනම් 'දැනට වෙළඳාම් නොකරන බවයි". මෙය පෙන්වාදුන්නේ 'රැකියා විරහිත, යන්න ඔවුන්ගේ රැකියා තත්ත්වය නිශ්චිත ලෙස විස්තර කිරීමට අපොහොසත් වූ බව හෝ ඔවුන් එම පදය හා ඇසුරුවීමට කැමැත්තක් නොදැක්වූ බවයි.



*රූපසටහන 02: ඔබගේ රැකියාව කුමක්ද?*


- නිදහස්/ ස්වාධීන 7.8%
- පෞද්ගලික අංශය 5.8%
- රාජ්‍ය නොවන සංවිධාන 36.9%
- අධ්‍යයන හෝ පර්යේෂණ ආයතන 6.8%
- ශිෂ්‍ය 5.8%
- කලාකරුවෙක් 6.8%
- රාජ්‍ය අංශයේ 7.8%
- වෙනත් 11.7%
- රැකියා විරහිත 7.8%
- මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්නෙක්/ක්‍රියාකාරියෙක් 2.9%

## ලිංගික දිශානතිය හා සමාජභාව අනන්‍යතාව හා ප්‍රකාශනය (SOGIE)

බැලූ බැල්මට බහුතරයක් ප්‍රතිචාරකයන් සංක්‍රාන්ති නොවන විෂමලිංගික කතුන් බවට පෙනී ගියත්, එය වටහාගත යුත්තේ සමීක්ෂණය පුරවද්දී ඔවුන්ට මුහුණ දීමට සිදුවුණු සීමා හා අභියෝග කිහිපයක් ඔස්සේ ය. පශ්චාත් ශල්‍ය පුද්ගලයන් ඇතුළු එහෙත් ඔවුන්ට පමණක් සීමා නොවූ සමහරදෙනාට හැඟුණේ සංක්‍රාන්ති නොවන හෝ සංක්‍රාන්ති ලෙස (cis or trans) තෝරාගැනීමට තිබීම සීමා පනවන්නක් බවත්, ඔවුන් සැකෙවින් ම පුරුෂ හෝ කාන්තා යනුවෙන් හඳුනාගැනීමට කැමැත්ත පළ කළ බවත් ය. එම නිසා සමහර අය සංක්‍රාන්ති නොවන යන්න තෝරා ගත්තේ උපතේ දී තීරණය වූ සමාජභාවය නොසලකා හරිමිනි. එම නිසා විෂමලිංගික යයි හඳුනාගන්නා අයගෙ න් බහුතරයක් වටහාගතයුත්තේ මෙම සන්දර්භය තුළයි. ඒ ඔවුන් සංක්‍රාන්ති නොවන සමාජභාවයේ සම්මත නිර්වචනය තුළ ම නොසිටිය හැකි බව සලකමිනි. ඒ වගේ ම තවත් සැලකිය යුතු කරුණක් වන්නේ සමහර ප්‍රතිචාරකයන්ගේ ලිංගික චර්යා ඔවුන්ගේ ලිංගික දිශානතිය පිළිබඳ ප්‍රතිචාරවලින් තේරුම්ගත නොහැකි බවයි. එහි 'වෙනත්' කියා සඳහන් වන කොටසට අදාළ සමහර ප්‍රතිචාරවල ඩෙමිරොමෑන්ටික්/ඩෙමි ලිංගික, බොහෝදුරට ද්වීලිංගික හා සංක්‍රාන්ති/ස්තිථීක ද අදාළ වේ.

ලිංගික දිශානතිය


| | |
|---|---|
| විෂමලිංගික | 51.3% |
| සමලිංගික පුරුෂ | 8.0% |
| සමලිංගික කාන්තා | 6.2% |
| ද්වීලිංගික/ සර්වලිංගික | 12.4% |
| ක්වියර් | 8.0% |
| වෙනත් | 4.4% |
| නොකියා සිටීමට කැමතියි | 9.7% |



රූපසටහන 03: ලිංගික දිශානතිය

සමාජභාවය

| | |
|---|---|
| සංක්‍රාන්ති නොවන කාන්තා | 52.4% |
| සංක්‍රාන්ති නොවන පුරුෂ | 17.5% |
| සංක්‍රාන්ති කාන්තා | 15.5% |
| සංක්‍රාන්ති පුරුෂ | 1.9% |
| බයිනරි නොවන | 2.9% |
| Genderqueer/ Non-conforming | 1.9% |
| වෙනත් | 4.9% |
| නොකියා සිටීමට කැමතියි | 2.9% |



රූපසටහන 04: සමාජභාව අනන්‍යතාව

## පිහිටීම


සමීක්ෂණයේ තමාගේ පිහිටීම දිස්ත්‍රික්කය හෝ පළාත අනුව නම් කිරීමට අසා නොතිබුණත්, බස්නාහිර හා නැගෙනහිර පළාත්වල අපි සංවිධානය කළ ප්‍රජා රැස්වීම්වලට බස්නාහිර, උතුර මෙන් ම නැගෙනහිර පළාත්වල පිරිස ද සහභාගි විය. විශේෂයෙන් ම බස්නාහිර පළාතට රට තුළ සංක්‍රමණ සිදුවන බැවින්, සමහරක් ප්‍රතිචාරකයන් වෙනත් පළාත්වලින් මෙහි පැමිණිය අය වීමට ද ඉඩකඩ තිබේ කාලය හා සම්පත් සීමා වූයෙන් අනෙක් පළාත්වල පිරිස් අන්තර්ජාලය ඔස්සේ හැර එකතු කරගැනීමට අපට ඉඩකඩ නොලැබිණි කෙසේවෙතත් බස්නාහිර, උතුර හා නැගෙනහිර පළාත් තෝරාගැනුණේ හිතාමතාම ය. බස්නාහිර පළාත තෝරාග ැනීමට හේතු වූයේ අගනුවර බස්නාහිර පළාතේ පිහිටීම, අන්තර්ජාලයට නාගරික පිවිසියහැකිබව,



*රූපසටහන 05: පිහිටීම*

දිනපතා අන්තර්ජාල භාවිතය හා බැඳි නාගරික දිවිපෙවෙත මෙන් ම බොහෝ අතික්‍රාන්ත කණ්ඩායම් මෙන් ම පර්යේෂණ කණ්ඩායමත් එම පළාතේ පදනම් වී තිබීමයි. කෙසේවෙතත් වෙනත් පළාත්වල අන්තර්ජාල භාවිතය ජනවාර්ගික, සංස්කෘතික, වාග්විද්‍යාත්මක හා භූගෝලීය වශයෙන් වෙනස්වෙයි. විශේෂයෙන් ම උතුරු හා නැගෙනහිර වැනි බහුතරයක් දමිළ භාෂාව භාවිතවන පළාත්වල, රාජ්‍ය ආවේක්ෂණය හා හමුදා පෙනීසිටීම් ඉහළ අගයක් ගන්නා අතර එය 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව තීව්‍ර වී ඇත. ඒ සමග ම ඉහත දැක්වූ හේතු මෙන් ම රටේ සමලිංගිකත්වය සාපරාධීයැයි සැලකීම ද මෙම පළාත්වල ඇති අතික්‍රාන්ත සංවිධානත්ව කෙරෙහි බලපායි. එම නිසා එවැනි පළාත්වල අතික්‍රාන්ත ජනතාවගේ අත්දැකීම් සමීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ඔස්සේ සටහන් කිරීම වැදගත් ය.

*2012 ජනගහණ හා නිවාස සංගණනයට අනුව, පළාත්වල ජනවාර්ගික සැකැස්ම පහත දැක්වේ:*





*රූපසටහන 06: ජනවර්ගය හා පළාත අනුව ජනගහණය (2012)*

# අන්තර්ජාලය හා පියවි ලෝකය:

# අසත්‍ය විභේදනයක් ද නැති ද?

**අපි පියවි ලෝකයේ දකින ප්‍රචණ්ඩත්වය ම අන්තර්ජාලයේ පරාවර්තනය වී ඇත**




*රූපසටහන 07: අපි පියවි ලෝකයේ දකින ප්‍රචණ්ඩත්වය ම අන්තර්ජාලයේ පරාවර්තනය වී ඇත*

ඔවුන් අන්තර්ජාලය ද්වීමයක් (binary) ලෙස හෝ එක ම අඛන්ඩතාවක කොටස් දෙකක් ලෙස දකිනවා දැයි මෙම සමීක්ෂණයේ සෘජුවම නොඇසුවත්, මෙම වර්ගයේ සමහර පැන ඇසීම ම ඔවුන්ව මේ ගැන ද්වීමයක් ලෙස සිතීමට පොළඹවයි. සම්මුඛ සාකච්ඡා අතරතුර අප උගත් කරුණක් වූයේ අන්තර්ජාලය හා පියවි ලෝකය අතර මායිම බොඳවන බව දැන දැන ම ඔවුන් ආත්ම ප්‍රකාශන කිරීමට, විශේෂයෙන් ම සමාජභාව අනන්‍යතා හා ලිංගිකත්ව වෙනස් හා උපක්‍රමශීලි ක්‍රමවලින් ප්‍රකාශ කිරීමට මේවා වෙන් වෙන් අවකාශ වශයෙන් භාවිත කිරීමට සිතාමතා ම තීරණය කළ බවයි.



හිරාන්, සංක්‍රාන්ති නොවන පුරුෂයෙකි ඔහු අන්තර්ජාලය හා ඉන් පිටත පැහැදිලි ද්වීමයක් නොදැක්කත් ඔහු අන්තර්ජාලයේ ප්‍රකාශ කිරීම පිළිබඳව පියවි ලොවේ තරම් සැලකිලිමත් නොවූ බව පෙනී ගියේ ය. කුඩා කල සිට ම ඔහුට ඕනෑ වී තිබුණේ නළුවෙකු වීමට වුවත් ඔහු පාසලේ දී ඒ ගැන මද උනන්දුවක් පෙන්වා සුළු චරිතයකට හැර නාට්‍යවලට සහභාගි නොවුයේ ය. ඔහු නිහඬව හිඳීමට තීරණය කළේ සමලිංගිකයකු ලෙස පිටත පැමිණ නොසිටියත් විෂමලිංගිකයකු ලෙස තමාව අන් අය නොදුටුවෙන් තමාගේ පෞද්ගලික ආරක්ෂාව පිළිබඳව ඇති වූ ගැටලු හේතුවෙනි. එහෙත් මේ ගැටලු ම තමන්ගේ ම යූටියුබ් චැනලයක් පිහිටුවා එහි ප්‍රථම වීඩියෝව පළ කිරීමේ දී ඇති නොවීය, පාසල් නාට්‍යයක නැති තරම් පුළුල් ප්‍රේක්ෂක පිරිසකට ඔහු නිරාවරණය වුවත්, විද්‍යුත් ප්‍රේක්ෂකයන් භෞතිකව අසළ නොසිටීම තුළින් එක්තරා සුරක්ෂිතබවක් ඇතිවිය. වීඩියෝවක් පළ කිරීමේ ප්‍රතිවිපාක ගැන ඔහු දුරදිග නොසිතූ බවත, එය අපේක්ෂාවන්ගෙන් තොරව සිදුකළ එකක් බවත් ඔහු පිළිගත්තේය.

සංක්‍රාන්ති නොවන විෂමලිංගික පුරුෂයකු වන විජේට අන්තර්ජාලය යනු සැබෑ ලෝකයේ සැබෑ සබඳතා ගොඩනැගීමට, 'සැබෑ ප්‍රජාව' හා එක්වීමට බාධක පමුණුවන්නකි. ඔහු පවසන්නේ "මට සමහරවෙලාවට හිතෙන්නේ මට කාමරෙකට වෙලා විතරක් ඉඳං, එළියට නොයා ම හැමදේම කරගන්න පුළුවන් කියලා. ඒ හින්දා මට හිතෙන්නේ මේක (අන්තර්ජාලය) සැබෑ ප්‍රජාව එක්ක සම්බන්ධ වෙන්න බාධාවක්.ඒ නිසා,මම සමහර වෙලාවට හිතන දෙයක් තමයි ඒක අනිත් හැම දේකින් ම අපිව ඉවතට හරවනව ද කියලා". ඔහු මෙය දකින්නේ අන්තර්ජාලයේ එක්තරා ඍණාත්මක අංගයක් ලෙසය.





සංක්‍රාන්ති නොවන කාන්තාවක්වන සෙල්වි ඇගේ ලිංගික දිශානතිය බෙදා ගැනීමට අකමැත්තක් දැක්වූවා ය. සෙල්විට අනුව අන්තර්ජාලය හා 'සැබෑ ජීවිතය' වෙනස්වන්නේ සැබෑ ජීවිතයේ මුහුණට මුහුණ සිටින මිනිසුන් සෑමවිට ම ඔවුන්ට කියන්නට ඇවැසි දෙය නොකියන නිසා බවයි ඔවුන්ට අපයෝජනාත්මක ලෙස හැසිරීමට ඕනෑ වුවත්, කෙනෙකුට හිරිහැර කිරීමට ඕනෑ වුවත් එසේ නොකරන්නේ පොලිස් අත්ඩංගුවට පත්වීමට ඇති ඉඩකඩ නිසා බවත් ඈ කියයි. ඈට අනුව, උදාහරණයක් ලෙස ෆේස්බුක්හි ඔවුන්ට ව්‍යාජ අනන්‍යතා පසුපස සැඟවී, නොදන්නා කෙනෙකු හා කතා කරන විට සිතේ තියෙන දේ එලෙස ම කියන්නට නිදහසක් දැනෙන නිසා ඔවුන් පහසුවෙන් ම කාන්තාවන් හා සංක්‍රාන්ති පුද්ගලයන් මෙන් ම වෙනත් අය ද අපයෝජනය කරන බවයි.



සංක්‍රාන්ති නොවන ද්විලිංගික අතික්‍රාන්ත කාන්තාවක් වන සාරා අන්තර්ජාලය සහ පියවි ලෝකය යන දෙබෙදුම (හෝ නොවන) පිළිබඳව දැක්වූයේ වෙනත් ම අදහසකි. ඈ කතාකළේ 'අන්තර්ජාල ක්‍රියාකාරිනිය' හෝ 'අන්තර්ජාල ස්ත්‍රීවාදිනිය' වැනි යෙදුම් ඍණාත්මක අරුත්ගත් හා එය අපහාසාත්මක ලෙස භාවිත වූ අයුරු පිළිබඳවයි. මීට හේතුව වූයේ මූලිකව ම අන්තර්ජාලයේ උගත් දේශපාලනයක් සමාජය දකිනුයේ යම්කිසි ඌනතාවකින් යුත්තක් ලෙස වීමයි. ස්ත්‍රීවාදය හා අතික්‍රාන්ත න්‍යාය පිළිබඳ දේශපාලනය බොහෝ දුරට අන්තර්ජාලයෙන් උගත් සාරාට අන්තර්ජාලයත් පියවි ලෝකයත් අතර නිශ්චිත බෙදුමක් නොතිබුණේ ඒ දෙක ම පරිපූර්ණව එක්වී ඇගේ යථාර්ථය ගොඩනැගූ බැවිනි.




ක්‍රිෂාණි (ස්තිරීක ලෙස තමන්ව හඳුනාගත් බොහෝ දුරට සංක්‍රාන්ති නොවන ද්වීලිංගික කාන්තාවක්) හා දිව්‍යා (සංක්‍රාන්ති නොවන, ද්වීලිංගික කාන්තාවක්) කතා කළේ ඩිජිටල් ඇබ්බහියේ අනතුරුදායක බව පිළිබඳවයි



එසේ කතා වූයේ නැවතත් අන්තර්ජාලය හා පියවි ලෝකය අතර මායිම බොඳවී යාම පිළිබඳව හා අන්තර්ජාලය නැතිනම් ඩිජිටල් අවකාශය වැඩි වැඩියෙන් අපගේ ජීවිත ආක්‍රමණය කිරීම පිළිබඳව ප්‍රශ්න නගමිනි.

ඒ අනුව, මින් පෙනීයන්නේ බොහොමයක් ප්‍රතිචාරකයන් අන්තර්ජාලය විසින් ඔවුන්ට ලබා දෙන මේ පරස්පරය තුළ වෙසෙන බවයි. එක් අතකින්, කැස්ටල්ගේ ජාලගත සමාජයක න්‍යාය ඔස්සේ කියැවෙන අයුරින් (කැස්ටල්ස්, 2000) ධනාත්මක මෙන් ම සෘනාත්මක බලපෑම් ද කරමින් තාක්ෂණය විසින් අවකාශයත් කාලයත් අභිබවා යයි. අනෙක් අතින් අන්තර්ජාලයේ වෙනත් අය වීමට හැකියාව හා වෙනත් ලෝකවල විසීමට ඇති හැකියාව අන්තර්ජාලයත් පියවි ලෝකයත් අතර පැහැදිලි බෙදීමක් ඇති කරවයි. මීළඟ අංශයේ දක්වා ඇති පරිදි, මෙය විශේෂයෙන් ම අවශ්‍යවන්නේ සමාජභාව හා ලිංගිකත්වය ඇතුළු විවිධ අනන්‍යතා ප්‍රකාශ කළ යුත්තේ කෝහේද කෙසේ ද කියා තෝරාගැනීමට හා උපක්‍රමශීලිවීමටයි.




# අන්තර්ජාල භාවිතය හා අන්තර්ජාලයේ ප්‍රකාශන

*අනන්‍යතාව, ප්‍රකාශනය හා රංගනය*

## සමාජභාව අනන්‍යතාව හා ලිංගිකත්වය


ඔවුන්ගේ සමාජභාවය හා ලිංගික අනන්‍යතා අන්තර්ජාල භාවිතයට බලපානවාදැයි ඇසූ විට, ප්‍රතිචාරකයන්ගෙන් සුළුතරයක් පවසා සිටියේ අනිවාර්යයෙන් ම යැයි කියා ය. බහුතරයක් පිළිතුරු දුන්නේ 'සමහරවිට' කියා.



**ඔබ අන්තර්ජාලය භාවිත කරන ආකාරයට ඔබේ සමාජභාව අනන්‍යතාව බලපා තිබේද?**

| | |
|---|---|
| අනිවාර්යයෙන්ම | 27.2% |
| නැත | 19.4% |
| ඇතැම්විට | 37.9% |
| නොදනිමි | 15.6% |

*රූපසටහන 08: ඔබ අන්තර්ජාලය භාවිත කරන ආකාරයට ඔබේ සමාජභාව අනන්‍යතාව බලපා තිබේද?*




**ඔබ අන්තර්ජාලය භාවිත කරන ආකාරයට ඔබේ ලිංගික අනන්‍යතාව බලපා තිබේද?**


| | |
|---|---|
| අනිවාර්යයෙන්ම | 17.5% |
| නැත | 24.3% |
| ඇතැම්විට | 35.9% |
| නොදනිමි | 22.3% |

*රූපසටහන 09: ඔබ අන්තර්ජාලය භාවිත කරන ආකාරයට ඔබේ ලිංගික අනන්‍යතාව බලපා තිබේද?*

ප්‍රතිචාරකයන් 50%ට වැඩි පිරිසක් එකඟ වූයේ අන්තර්ජාලයට පිවිසියහැකිබව ඔවුන් සමාජභාවය හා ලිංගිකත්වය වටහාගන්නා විධියත්, විවිධ සමාජභාව හා ලිංගිකත්වය දකින විධියත් වෙනස් කළ බවයි.




සංක්‍රාන්ති ලිංගික පුරුෂයකු වන ශමාල් පවසා සිටියේ ඔහුට ඉපදෙන විට පවරාදුන් සමාජභාවයත් සමග ඔහුට ඇති වූ දුෂ්කරතා තේරුම්ගැනීමට අන්තර්ජාලය උපකාරී වූ බවයි. අන්තර්ජාලය ඔස්සේ සමාජභාව අනන්‍යතාව මෙන් ම සංක්‍රාන්ති ක්‍රියාවලිය පිළිබඳව වැදගත් තොරතුරු ඔහුට හමුවූවත්, ඔහු මේ විස්තර සොයන අවදියේ මෙම තොරතුරු සියල්ලක් ම පාහේ තිබුණේ ලංකාවෙන් පිටත ය. එම තොරතුරු වෙතට පිවිසෙන්නට සෑහෙන ඉංග්‍රීසි ඔහු දැන සිටියත් එය අභියෝගාත්මක විය. ඔහු ජාතික සංක්‍රාන්තිලිංගික ජාලය හා වෙනස හා සම්බන්ධ වූයේ වෛද්‍ය ශිෂ්‍යයෙකු වූ ඔහුගේ මිතුරෙකු ඔස්සේ ය. ඉන්පසුව ඒ ආයතන හරහා ඔහු ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති පුරුෂයන් සඳහා ශල්‍යකර්ම සිදුකෙරෙන බව දැනගත්තේ ය.



**අන්තර්ජාල පිවිසුම ඔබ වෙනත් සමාජභාව හා ලිංගික අනන්‍යතා ඇති පුද්ගලයන් දෙස බලන ආකාරය වෙනස් කර තිබේද?**

| | |
|---|---|
| අනිවාර්යයෙන්ම | 53.4% |
| නැත | 13.6% |
| ඇතැම්විට | 19.4% |
| නොදනිමි | 13.6% |

*රූපසටහන 10: අන්තර්ජාල පිවිසුම ඔබ වෙනත් සමාජභාව හා ලිංගික අනන්‍යතා ඇති පුද්ගලයන් දෙස බලන ආකාරය වෙනස් කර තිබේද?*



**අන්තර්ජාල පිවිසුම ඔබ සමාජභාව හා ලිංගික අනන්‍යතා වටහාගන්නා ආකාරය වෙනස් කර තිබේද?**

| | |
|---|---|
| අනිවාර්යයෙන්ම | 53.4% |
| නැත | 15.5% |
| ඇතැම්විට | 23.3% |
| නොදනිමි | 7.8% |

*රූපසටහන 11: අන්තර්ජාල පිවිසුම ඔබ සමාජභාව හා ලිංගික අනන්‍යතා වටහාග න්නා ආකාරය වෙනස් කර තිබේද?*



සංක්‍රාන්ති නොවන විෂමලිංගික කාන්තාවක් වන හසිනි පවසා සිටියේ සමාජභාවය හා ලිංගික අනන්‍යතාව පිළිබඳව ඇගේ වටහාගැනීමේ දී අන්තර්ජාලය විශේෂ භූමිකාවක් නොගත් බවයි. 1 යනු කිසිදු සම්බන්ධයක් නැත යැයි හඟවන පරිමාණයක, ඇය අන්තර්ජාලයේ භූමිකාවට 10න් 4ක් වැනි අගයක් ලබා දෙයි. මෙහිදී සැලකිය යුතු කාරණයක් වන්නේ 'සමාජභාවය හා ලිංගික අනන්‍යතාව යන්න ඉබේ ම වටහා ගැනුණේ සංක්‍රාන්ති හා විෂමලිංගික නොවන ලෙස බවය, එම නිසා එම ප්‍රශ්නය සංක්‍රාන්ති නොවන-විෂම කියා හඳුනාගන්නා එම අනන්‍යතාව ප්‍රශ්න නොකරන අයෙකුට අදාළ නොවේ, ඇය පවසා සිටියේ ඇය එසේ ප්‍රශ්න නොකරන බවයි. කෙසේවෙතත් හසිනි පවසා සිටියේ අන්තර්ජාලය ඇයට ඇගේ බුද්ධිමය විබල්‍යතාවකින් යුතු සොයුරිය මුහුණ දෙන සමාජභාව හා ලිංගිකත්වය ආශ්‍රිත ගැටලු වටහාගැනීමට උපකාරී වූ බවයි.

අන්තර්ජාලය හා සමාජභාවය හා ලිංගිකත්වය අතර සම්බන්ධය, ඔවුන්ගේ වටහාගැනීම්වලට උපකාරී වීමේ දී අන්තර්ජාලයේ අගය ගැන ප්‍රතිචාරකයන් ඉතා පැහැදිලි අදහස් දැක්වුව ද, මීළඟ කොටසින් දැක්වෙන්නේ එම සබඳතාව ඉබේ ම අන්තර්ජාලයේ දී නිදහස් ප්‍රකාශනයකට නොහැරෙන බවයි.

**ප්‍රතිචාරකයන් 50%ට වැඩි පිරිසක් එකඟ වූයේ අන්තර්ජාලයට පිවිසියහැකිබව ඔවුන් සමාජභාවය හා ලිංගිකත්වය වටහාගන්නා විධියත්, විවිධ සමාජභාව හා ලිංගිකත්වය දකින විධියත් වෙනස් කළ බවයි**

## ආත්ම ප්‍රකාශනය හා ස්වයං-වාරණය

ආත්ම ප්‍රකාශනය පිළිබඳ අප ඇසූ ප්‍රශ්න සමාජභාව අනන්‍යතා හෝ ලිංගිකත්වය ප්‍රකාශනයට හෝ රංගනයට සීමා නොවීය. එම නිසා මෙම කොටස අන්තර්ජාලයේ සිදුවන විවිධ වර්ගයේ ප්‍රකාශන සලකා බලයි.


සිස් (සංක්‍රාන්ති නොවන) - කාන්තාවන් 32% ක් ද, සංක්‍රාන්ති කාන්තාවන් 50% ක් ද අන්තර්ජාලය (10 වැඩිම වූ 1 සිට 10 දක්වා පරිමාණයක) 10ක් ලෙස ලකුණු කර ඇත්තේ එය ඔවුන්ගේ ආත්ම ප්‍රකාශනය රඟදක්වන භූමිකාව නිසාවෙනි. එහෙත් එම ප්‍රශ්නයට ම පිළිතුරු දැක්වූ සිස් (සංක්‍රාන්ති නොවන)-පුරුෂයින් අතරින් අන්තර්ජාලයේ භූමිකාවට 10ක් ලබා දුන්නේ 22%ක් පමණි. එම පරිමාණයේ ම ප්‍රතිචාරකයන් 100 දෙනාගෙන් 35ක් ආත්ම ප්‍රකාශනයට වැදගත් අවකාශයක් ලෙස දක්වමින් 10 ක් ලබා දුන් අතර, ඔවුන් අතරින් 23 දෙනෙකු (71%) වයස 30 හෝ ඊට අඩු වීය. කෙසේ වෙතත් අන්තර්ජාල භාවිත කිරීමේ අත්දැකීම් කොපමණ තෘප්තිමත් දැයි ඇසූ විට බහුතරයක් දෙනා එයට 1 සිට 10 දක්වා වූ පරිමාණයක 5ක් ලෙස ලකුණු කර ඇත. ප්‍රතිචාරකයන් 100ක් අතරින් 25ක් වූ ඒ ප්‍රතිචාරකයන්ගෙන් 48% ක් වයස 30 හෝ ඊට අඩු අය විය. අනෙක් ප්‍රතිචාර අතරින් බොහොමයක් සාපේක්ෂව 6ත් 10ත් අතර සමානව බෙදී තිබුණෝ, අන්තර්ජාල භාවිතයෙන් ලැබුණු අගය එක්තරා දුරකට මිශ්‍ර එකක් බව දක්වමිනි එය පහත ප්‍රස්තාරයෙන් දැක් වේ.

**වයස්කාණ්ඩවලට අනුව 1 සිට 10 දක්වා පරිමාණයක ආත්ම ප්‍රකාශනය සඳහා අන්තර්ජාලයේ වැදගත්කම**




*රූපසටහන 12: වයස්කාණ්ඩවලට අනුව 1 සිට 10 දක්වා පරිමාණයක ආත්ම ප්‍රකාශනය සඳහා අන්තර්ජාලයේ වැදගත්කම*

**1 සිට 10 දක්වා පරිමාණයක, වයස්කාණ්ඩවලට අනුව අන්තර්ජාල භාවිතයේ අත්දැකීම කෙතරම් සතුටුදායක ද?**




*රූපසටහන 13: 1 සිට 10 දක්වා පරිමාණයක, වයස්කාණ්ඩවලට අනුව අන්තර්ජාල භාවිතයේ අත්දැකීම කෙතරම් සතුටුදායක ද?*

< 25 | 25–30 | 31–35 | 36 – 40 | > 40

සම්මුඛ සාකච්ඡාවල ප්‍රතිචාරවලින් පෙනී ගියේ අන්තර්ජාලයේ ආත්ම ප්‍රකාශනය සහ/හෝ ස්ව වාරණයට හේතුවන දෑ සංකූල වන බවත් කෙනෙකුගෙන් තවත් කෙනෙකුට ඔවුන්ගේ විවිධ අනන්‍යතා මත මෙන් ම ඡේදනය වන වරප්‍රසාද. පීඩන හා විෂමතා අනුව වෙනස්වන බවත් ය. උදාහරණයක් ලෙස, සංක්‍රාන්ති නොවන සමාජභාවයක් ඇති බව සංක්‍රාන්තිලිංගික වනවාට වඩා ප්‍රකාශන අවකාශයක් ඔබට ලබා දුන්නද, ඒ තුළ, ඔබ පුරුෂයෙකු ද කාන්තාවක ද යන කරුණ මත ඔබට ලබා දෙන ප්‍රකාශන මට්ටම විවිධ අගයන් ගනී.



සංක්‍රාන්ති නොවන කාන්තාවක් වන හසිනිට හැඟෙන්නේ ඇයට මතයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් අන්තර්ජාලය ඔස්සේ බොහෝ දෙනා සමග එය ප්‍රකාශ කරනවාට වඩා මුහුණට-මුහුණ කතාබහ කිරීමට තමා ප්‍රිය කරන බවයි. ඒ ඇයට එවිට සුරක්ෂිත බවක් හැඟෙන බැවිනි  එහෙත් සංක්‍රාන්තිනොවන විෂම පුරුෂයකුවන, සුළුතර ජනවර්ගයකට අයත් විජේට හැඟුණේ ඔහුගේ අනන්‍යතාව ඔහුගේ අන්තර්ජාලය වෙත පිවිසීමේ හැකියාවට බල නොපාන බවයි, ඔහු විශේෂයෙන් ම මෙය දකින්නේ සංක්‍රාන්තිනොවන විෂම පුරුෂයෙකු ලෙස ඔහුගේ වරප්‍රසාදය දෙස බලනවිටයි.

*“ඒ කියන්නේ මගේ කිසිම අනන්‍යතාවකට අන්තර්ජාල භාවිතය නවත්තන්න කියලා කවුරුත් මට කියලා නෑ. ඒත් රජය තහනමක් ගෙනාවොත් ඒක හැමෝටම බලපානවා. ඒ නිසා පෞද්ගලික මට්ටමකින් මම කියන්නේ කිසිදේකට ඒක බලපාලා නෑ”.*

විජේ අන්තර්ජාලයෙන් තොරතුරු ලබාගැනීමට හැකි වේගය, වේගවත් සන්නිවේදනයක් උදෙසා එම වේගයට දුරස්ථබවේ බාධක බිඳ දැමීමට ඇති හැකියාව වැනි දෑ තවත් අන්තර්ජාලයේ ප්‍රකාශනයට දිරිදෙන සාධක ලෙස දකියි.



හිරාන් යනු තම චැනලයේ ආරම්භයේ සිට ම තම අතික්‍රාන්තභාවය පිළිබඳව විවෘතව කතා කළ ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ යූටියුබර් කෙනෙකි. ඔහුගේ සමාජභාව අනන්‍යතාවටත් ලිංගිකත්වයටත් අන්තර්ජාලය බලපෑ අයුරු විස්තර කිරීමට පැවසූ විට ඔහු තමාගේ අනන්‍යතාව භාරගැනීමත්  තමන්ගේ අනන්‍යතාව සුවපහසුවෙන් සම්පූර්ණයෙන් ප්‍රකාශ කිරීමට හැකිවීමත් අතර වෙනසක් ගෙනහැර පෑවේ ය. ඔහු පැවසුයේ වයසින් වැඩීමත් සමග ම තමාගේ ලිංගිකත්වය සමග එකඟ වීමට තමාට හැකිවුණත් (භාරගැනීම), තමාගේ අනන්‍යතාව ප්‍රකාශ කිරීමට තරම් සැප පහසුවක් දැනවූයේ යූටියුබ් වීඩියෝ හා සමාජ මාධ්‍ය පෙනිසිටීම්වලට ලැබුණු ප්‍රතිචාර බවයි.



විෂමලිංගික කාන්තාවක් ලෙස තමාව ම හඳුන්වන ලක්ෂ්මී උදාහරණයක් ලෙස පවසා සිටියේ ෆේස්බුක් වැනි වේදිකාවල කාන්තාවක් ලෙස ඇගේ අනන්‍යතාව එම වේදිකාව භාවිතය අපහසු කරවන බවයි. ඇය පවසන්නේ අනෙක් කාන්තාවන් මෙන් තමා ද තවත් පින්තූර පළකිරීමට ආසා බවයි. ඒහෙත් ඔවුනට ලැබිය හැකි කමෙන්ටු හා ප්‍රහාර වර්ග ගැන දන්නා බැවින් ඇයත් ඇය දන්නා වෙනත් කාන්තාවනුත් නිතර එලෙස නොකර සිටින බවයි. පින්තූරයක් පළ කිරීමට පෙර ඈ කිහිපවරක් ඒ ගැන සිතිය යුතු ය. ඇගේ ස්ත්‍රීවාදී දේශපාලන උනන්දුව දැක්වෙන ලිපියක් බෙදාගත් විට ඇයට ‘අනවශ්‍ය කමෙන්ටු’ බොහොමයක් ලැබෙයි.





**අපි දන්නවනේ මතවාද තදබල නොවෙන්න පුළුවන් මිනිස්සු ඒවා ගණන් ගන්නේ නැතිවෙන්නත් පුළුවන්, ඒත මං හිතන්නේ මිනිස්සු මාව දකින විදිය ඒ දකින විදියෙන් ඇතිවෙන විපාක වගේ ඔක්කොම මං ඔළුවට දාගන්නවා - හසිනි**

*"සමහරවෙලාවට ඒ වගේ කමෙන්ට් මගහරින්න මම ෆේස්බුක් එකේ මුකුත් ශෙයා කරන්නේ නෑ. අනවශ්‍ය කමෙන්ට් මගහරින්න සමහර දේවල් ගැන නොලියා හිටියත්, මං තවමත් ලියනවා"*

ලක්ෂ්මි සිතන්නේ අන්තර්ජාලය ආත්ම ප්‍රකාශනයට උපකාරීවන බවය. එහෙත් එය ඇය තමාව ම ප්‍රකාශ කරන එක ම අවකාශය නොවේ. ඇය කණ්ඩායම් සාකච්ඡා වැනි මුහුණට මුහුණ හමුවීම් පිළිබඳව වැඩි කැමැත්තක් දක්වනවා. ඒ ඇයට තමාව පැහැදිලිව, ආත්ම විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කිරීමට හැකියාවක් ඇති නිසා යි. මූලිකව ම ඉංග්‍රීසියෙන් කතාකරන, අන්තර්ජාලය ඉංග්‍රීසියෙන් භාවිත කරන හසිනි පවසන්නේ ඇය හේතු තුනක් නිසා සිය අන්තර්ජාල භාවිතය සීමා කර ඇති බවයි: "මම ගැහැනියක්, මම ඉන්නේ පුංචි නගරෙක, මගේ ව්‍යාපාරය කුඩා ළමයි ඉන්න එකක්." එහෙත් ඇය එයට එක් කළේ කාංසාවෙන් පෙළෙන පුද්ගලයෙකු වශයෙන් ඇය අන්තර්ජාලය දකින්නේ සිය මානසික සෞඛ්‍යය උග්‍රකරන්නක් ලෙස බවයි. එම නිසා ඇය තම අන්තර්ජාල භාවිතය හා සම්බන්ධය සීමා කිරීමට කැමැත්තක් දක්වයි.

*"මං හිතන්නේ මට පොඩ්ඩක් කාංසාව වගේ තියනවා ඉතින් මං මට සීමාවක් දාගන්නේ මට ලැබෙන ප්‍රතිචාර එක්ක ගනුදෙනු කරන්නවත්, එහා මෙහා වාද කරගන්නවත්, මිනිසුන් එක එක දේ දකින විදිය දැනගන්නවත් මට අවශ්‍ය නැති හින්දයි. මිනිස්සුන්ට කොහොමත් ඔයා කියන්න හදන දේ තේරෙන්නේ නෑ- ඔයා යටත්විජිත විරෝධී යමක් පළ කළොත්, එයාලා*



අහනවා ඇයි ඔයා සුද්දන්ට වෛර කරන්නේ කියලා? සමහරවෙලාවට මට ඒකට අවශ්‍ය ඉවසීම නෑ"

"අපි දන්නවනේ, මතවාද තදබල නොවෙන්න පුළුවන් මිනිස්සු ඒවා ගණන් ගන්නේ නැතිවෙන්නත් පුළුවන්, ඒත මං හිතන්නේ මිනිස්සු මාව දකින විදිය, ඒ දකින විදියෙන් ඇතිවෙන විපාක වගේ ඔක්කොම මං ඔළුවට දාගන්නවා. ඒ කාංසාව අනිත් ඒවාට එකතු වෙනවා- මං ගෑනියක්, එයාලා මං ඉන්න තැන දන්නවා, මෙහෙම වුණොත්, මෙහෙම වුණොත්, මෙහෙම වුණොත්. දැන් මොකක් වෙයිද! මේක මොනවහරි පළ කළා ම ඇතිවෙන්න පුළුවන් හරිම අනවශ්‍ය මානසික තත්ත්වයක් ඉතින් මං දැන් පෝස්ට කරන එක අඩු කරලා තියෙන්නේ"



ඊට පරස්පර විරෝධී ලෙස දිව්‍යාට අවශ්‍ය වී ඇත්තේ ඇයට අන්තර්ජාලයේ හමු වී ඇති සමහර ප්‍රජාවන් හා එක්වී සැපපහසුවේ කතා කිරීමට තරම් අනතුරුවෙනසුළු යැයි හැඟෙන තත්ත්වයකට එන්නයි. ඇය හඳුනාගත්තේ අන්තර්ජාලයේ සහයෝගී කණ්ඩායම් සමග ඇයට සහකම්පනය සොයාගත හැකි බවයි. ඇය විටෙක ප්‍රථම පුරුෂයෙන් බෙදාගත් පෞද්ගලික අත්දැකීමක් පාදක කරගෙන ඇය හා සම්බන්ධවූවෙක් කියා ඇත්තේ එය ඔවුන්ට කොපමණ සහයෝගයක් වූවාද යන්න යි. සංවෘත කණ්ඩායමක් තුළ යමක් පළ කළොත් විවේචනය වෙනුවට සහයෝගයත් සහකම්පනයත් සොයාගත හැකි බව ඈ කියයි. කෙසේවෙතත්, ඇය කියා සිටියේ තරමක් දුරට ඇය ඇගේ අන්තර්ජාල ජීවිතය මත යැපීම එක්තරා ආකාරයක අරගලයක් වූ බවයි. ඇය එසේ කියා සිටියේ මෑතක දී ඉබේ ම ඇගේ එක් ප්‍රොෆයිලයක් ක්‍රියාවිරහිතවීමත් සමගම ඇයට 'වෙන්න පුළුවන් නරක ම දේ' එය බව හැඟුණු බවයි.

"මගෙ ඔලුව අවුල් වුණා වගේ - ඒක දැනුණෝ මට වෙන්න පුළුවන් නරක ම දේ වගේ-මට හිතුණෝ ආයෙත් අර වගේ මහන්සිවෙලා යාළුවෝ හොයාගන්න නම් බෑ කියලා - තව මට තේරුණා මං මගේ නිපැයුම් කිසි එකක් බැකප් කරලත් නෑ කියලා. ඉතින් ආයෙත් ප්‍රොෆයිල් එක ලැබුණා ම මට හිතුණෝ ඒක කොච්චර අවුල් ද කියලයි. ඒක හරිම විකාරයක්-- එච්චර ඒ මත්තෙ ම යැපීම ගැන මට බයක් දැනුණා."



අන්තර්ජාල සමීක්ෂණයේ ආත්ම ප්‍රකාශනයේ අවකාශයක් ලෙස (1 සිට 10 දක්වා පරිමාවේ) අන්තර්ජාලයට 5ක් ලබා දුන් සෙල්වි,සම්මුඛ සාකච්ඡාවේ දී එය 3කට පහත දැමුවා ය. ඈ කියා සිටියේ අන්තර්ජාලය නිදහසේ තමාව ම ප්‍රකාශනය කිරීමට අපහසු තැනක් බවයි. ඇයගේ ෆේස්බුක් එකේ සිටින මිතුරන් අනිවාර්යයෙන් ම සැබෑ ජීවිතයේ ඇගේ මිතුරන් නොවේ 'සැබෑජීවිතේ මිතුරන්' සමාජ මාධ්‍යවල නැත. එම නිසා ඇයට හුරුපුරුදු මුහුණට මුහුණ හමුවීම්වල වඩාත් හොඳින් ආත්ම ප්‍රකාශනය කිරීමයි. එම නිසාම අන්තර්ජාලය ඇයගේ ආත්ම ප්‍රකාශනය සඳහා එතරම්ම වැදගත් ස්ථානයක් නොවේ කියා හැඟුණු ඇය තවදුරටත් අන්තර්ජාලයේ පෝස්ට් හා තොරතුරු හුවමාරුව අඩුකර ඇත.

සංක්‍රාන්ති නොවන විෂමලිංගික කාන්තාවක් වන ක්‍රිෂාණි නිදහස ඇත්තේ ඇය ප්‍රවේසමෙන් තෝරගත් පිරිසකගෙන් සෑදුනු බුබුලක බව දැනසිටියත්, අන්තර්ජාල අවකාශය ඇයට ලබාදෙන්නේ පියව් ජීවිතයේ නිතර විඳින්නට ලැබෙන්නේ නැති නිදහසකි. ඈ පවසා සිටින්නේ ඇය දන්නා අය ඇයට කියන්නට ඇති සමහර දෙයින් අමනාප වීමට ඉඩකඩ ඇති නිසා ඇය පියව්





**"මේක හරි ම හරි ම අමාරුයි. අපිට ෆෝන් එකෙන් තොරතුරු හුවමාරු කරගන්න බැරි නිසා හමුවෙනකම් ඉන්නවා. ඒකට කල් යනවා මොකද අපිට හමුවෙන්නත් හැමෝම වෙලාව හදාගන්න ඕනෙ නිසා. මේක වෙනස් වෙන්න ඕනේ. සුරක්ෂිත ප්‍රකාශන නිදහසක් තියෙන්න ඕනේ" - ආර්යා**

ජීවිතයේ ස්වයං-වාරණයක යෙදෙන බවය. එහෙත් ඇයට අන්තර්ජාලයේ දී එතරම් දුරට එසේ කරන්නට අවශ්‍ය නොවේ - ඇගේ කාලරාමුවේ ඈ පවසන දේ පාලනය කිරීමට ඇයට හැකිය, ඇයට අවශ්‍ය නම් යම් දෙයකට විරුද්ධ විය හැකිය. "මට ම කියලා හඬක් තියෙනවා' මං අන්තර්ජාලයේ පියවි ජීවිතයට වඩා ආත්ම ප්‍රකාශන කරනවා. මගේ ටයිම්ලයින් එකේ යමක් ශෙයා කරන එක හෝ අන්තර්ජාලයේ යමක් ගැන හිතන්න ඒ ගැන කියන්න ඇති හැකියාව ගොඩක් පහසුයි, අවදානම් අඩුයි, ඒකට අවරගැස්මත් අඩුයි. කෙසේවෙතත්, ඇගේ කාලරාමුවෙන් පිටත ඇයට බොහොමයක් අවරගැස්මට මුහුණදෙන්නට සිදුවන බවත් ඇය දනියි.

කවුරුන් හෝ තමාව අධීක්ෂණය කරනවා දැයි ආර්යාට සැකයක් තිබේ, තමාව හැක් කරාවි යැයි බියක් ඇති නිසා ඇය ඇගේ දුරකථනයේ වැඩි තොරතුරක් තබා නොගනියි, ඒවා ඩිලීට් කර දමයි. ඇය වට්සැප් භාවිතය ද නවතා එම වේදිකාවේ වැඩි තොරතුරු බෙදාගැනීම නවතා දමා ඇත. ආරක්ෂක හේතූන් මත, ඇයත් අනෙක් සංක්‍රාන්ති පුද්ගලයනුත් තීරණය කර ඇත්තේ මුහුණට මුහුණ හමුවී ඔවුන්ට ඇති හෝ කතා කිරීමට අවශ්‍ය ප්‍රශ්න සාකච්ඡා කිරීමටයි.

*"මේක හරි ම හරි ම අමාරුයි. අපිට ෆෝන් එකෙන් තොරතුරු හුවමාරු කරගන්න බැරි නිසා හමුවෙනකම් ඉන්නවා. ඒකට කල් යනවා මොකද අපිට හමුවෙන්නත් හැමෝම වෙලාව හදාගන්න ඕනෙ නිසා. මේක වෙනස් වෙන්න ඕනේ. සුරක්ෂිත ප්‍රකාශන නිදහසක් තියෙන්න ඕනේ"*



විජේ කතා කළේ පෞද්ගලික ආරක්ෂාවට හා සුරක්ෂිතභාවයට බලපාන අන්තර්ජාල අවකාශ

අධීක්ෂණයත්, පාලනයත් ගැනයි.ඔහු මෙම පාලනය දුටුවේ "දේශපාලනික හෝ නොවන" ලෙසයි ඒ වගේ ම "සියල්ලක් ම රේකොර්ඩ් කරනවා' අධීක්ෂණය කරනවා. සියලු ම අධිකාරීන් ඒ ගැන දැන ගනියි" කියායි ඒ හේතුවෙන්, ඔහු ඔහුගේ අන්තර්ජාල අවකාශය භාවිතය වෙනස් කර ඇත්තේ අන්තර්ජාලයේ ස්වයං වාරණය කරමිනි. "මම දැන් අන්තර්ජාලයේ ගොඩක් ප්‍රවේසම්වෙනවා" ලිංගිකත්වය සම්බන්ධ ප්‍රශ්නවලට අන්තර්ජාලයේ ආරක්ෂිත තැන් තියෙනවා, ඒත් දේශපාලන ප්‍රශ්නවලට ආවා ම අන්තර්ජාලය හරිම අනාරක්ෂිතයි කියලයි මට හැගෙන්නේ"





අන්තර්ජාලයේ පෙනිසිටීමත්, ප්‍රකාශනයත් සීමා කරන තවත් හේතුවක් ලෙසට පවුල දැක්විණි. සංක්‍රාන්ති විෂමලිංගික කාන්තාවක් වන ආර්යා තම අන්තර්ජාලයේ ප්‍රකාශනය සීමා කරන හේතු ලෙස දැක්වූයේ ඇගේ දෙමාපියන් හා පෙම්වතායි. හසිනිට-



*'මගේ නැන්දම්මායි මාමණ්ඩියි සෝෂල් මීඩියාවල ඉන්නවා, එයාල මං තරම් ලිබරල් නෑ. ඉතින් මොනවහරි උනාම එයාල හිතන්නේ වෙන ම දෙයක්- අපෝ එයාගෙ කට වැඩියි, අපෝ එයා ක්‍රියාකාරිනියක්."*



දිව්‍යා ට්විටර් හා ටම්බ්ලර්වල වඩාත් සැපපහසුවේ ඉන්නේ ඒවායේ ඇගේ පවුලේ අය නොමැති නිසයි. එවිට ඇයට ද්විලිංගික පුද්ගලයෙකු ලෙස ඇගේ ලිංගික දිශානතිය ඇතුළු අනන්‍යතාව පිළිබඳව නිදහසේ සිටීමට පුළුවන්. ඇය ඇගේ ෆේස්බුක් හා ඉන්ස්ටාග්‍රෑම් ගිණුම් ක්‍රියාවිරහිත කළේ ඒ වේදිකාවල ඇගේ පවුල සිටි නිසාත් - ඇය පිළිබඳ යමක් පළ කිරීමට හෝ යමක් ප්‍රකාශ කළහොත් තමාගේ රහස හෙළිවේ යැයි වූ බිය වී නරඹන්නෙකු බවට පමණක් පත්වූ නිසාත් ය. LGBTQ+ ප්‍රජාවගේ ගැටලු හා සම්බන්ධව වැඩ කළ බව දැන සිටියත් ඇයත් ද්විලිංගික බව ඇගේ පවුල නොදනී.



සංක්‍රාන්ති විෂමලිංගික කාන්තාවක්වන ශිරානිටත් තිබුණේ ආර්යාට පවුල පිළිබඳව තිබූ ගැටලුමයි. සංක්‍රාන්තියට පෙර ඇය සංක්‍රාන්ති නොවන පුරුෂයෙක් ලෙස ෆේස්බුක් සිටි නිසා, සංක්‍රාන්තිය ඇරඹීමත් සමග ඇය ඉඳහිට සාරියක් ඇඳ සිටි පින්තූර පළ කර ඇත. කෙසේවෙතත්, ඇයගේ සමාජභාව අනන්‍යතාව ප්‍රකාශ කළාට ඇයට ලැබුණේ සෘනාත්මක ප්‍රතිචාරයකි. ඉන් සමහරක් ප්‍රතිචාර අතික්‍රාන්ත ප්‍රජාව අතරින් ම ඇති වූ බව ඇය පැවසුවා ය. ඒ වගේ ම ඇගේ සමාජභාව අනන්‍යතාවට වැඩි අවධානයක් ලැබුණොත් එය ඇගේ සැමියාගේ පවුලට නිගාවක් වේ යැයි යන කාරණය ඇගේ වත්මන් ෆේස්බුක් ගිණුමේ ස්වයං වාරණයට හේතු වී ඇත. ඇය දැනට එච්.අයි.වී ප්‍රතිකාර හා සංක්‍රාන්ති පුදගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ලිපි බෙදා ගැනීමට ඇගේ ගිණුම යොදාගත්තත් සෘනාත්මක කමෙන්ටු ලැබිය හැකි පෞද්ගලික ඡායාරූප පළ කිරීමෙන් වැළකී සිටියි.

සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ ඇතැම් අය සිය ජනවර්ගය අන්තර්ජාල අවකාශය හා ඡේදනය වූ අයුරු පිළිබඳ අත්දැකීම් බෙදාගත්හ. එහෙත් පෙර මෙම අධ්‍යයනයේ සීමා අතර කියූ පරිදි, ජනවාර්ගික සුළුතරයක් ලෙස හඳුනාගැනීමට මැළි වූ පිරිස හේතුවෙන් සමීක්ෂණ ප්‍රතිචාර, පහසුවෙන් කියවීමට හැකි පින්තූරයක් ලබා



නොදෙයි. දිව්‍යා ෆේස්බුක් සිටිද්දී ඇගේ නම වෙනස් කළේ ඇගේ නම ඈ දෙමළ කියා හඳුනාගැනීමට භාවිත වීමෙන් දැනුණු අපහසුතාවය නිසා ය. ඒ ඇය එය තමාගේ සම්පූර්ණ අනන්‍යතාව ලෙස නුදුටු බැවිනි.

ලංකාවේ නැගෙනහිරෙන් පැමිණි සෙල්වි අන්තර්ජාල කතාබහක ඇගේ දමිළ අනන්‍යතාව පැටලුණු ආකාරය පිළිබඳ අප හා උදාහරණයක් බෙදාගත්තා ය. 2018 දිගන පැවැත්වුණු මුස්ලිම් විරෝධී කෝලහලවලට පසුව ඇය අන්තර්ජාල පෝස්ටුවක මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව ප්‍රශ්න නගා ඇත. ඈ පැවසුවේ ඇගේ පෝස්ටුව මත හා පෞද්ගලික පණිවුඩවල දෙමළ ජනතාව ඇය මුස්ලිම් අයට සහයෝගය දෙන්නේ ඇයි ද කියා ප්‍රශ්න කළ බවයි, මේ ගැන ඇයට අන්තර්ජාලයේ පහර එල්ලවිය. තවත් ඇය පැවසුයේ මෑතක දී මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කරන ලෙස ඉල්ලා දමිළ හා මුස්ලිම් ක්‍රියාකාරීන් සිදුකළ විරෝධයකට සහභාගි වූ ඇය එහි පින්තූර අන්තර්ජාලයේ පළ කර විට ප්‍රජා දෙකෙන් ම අවරගැස්මක් ඇතිවූ බවයි. "සමහර දෙමළ මිනිස්සු මගෙන් ඇහුවේ මං මුස්ලිම් ප්‍රශ්නවල පැටලෙන්නේ ඇයි කියලයි, මොකද ඒක මට අදාළ නැති දෙයක් ලු. මුස්ලිම් කීපදෙනෙකුත් මට එහෙම කිව්වා"



ක්‍රිෂාණි අන්තර්ජාලයේ තමා පවසන දේ ගැන ප්‍රවේසම් වුණත් ඈට හැඟෙන්නේ තමා සිංහල පුද්ගලයෙකු වීම වාසිදායක බවයි. උදාහරණයක් ලෙස, පශ්චාත් යුධ-ප්‍රතිසංධානය පිළිබඳව අන්තර්ජාලයේ සැරිසරන විඩියෝවක් පිළිබඳව විවෘතව කතා කරන්නට ඇයට හැකිවුවත්, ඇයට පෞද්ගලිකව කතා කළ දෙමළ හා මුස්ලිම් මිතුරන් කියා ඇත්තේ අන්තර්ජාලයේ ජනවර්ගය පදනම් කරගත් ප්‍රහාරවලට ලක්වේ යැයි බියෙන් ඔවුන්ට එසේ කළ නොහැකි බවයි

## ප්‍රකාශනය හා රඟදැක්වීම

සම්මුඛ සාකච්ඡා අතරතුර, සමහර ප්‍රතිචාරකයන් අන්තර්ජාලය තුළ ප්‍රකාශනය රංගනයක් බවට පෙරළීමේ අගයත් අභියෝගත් පිළිබඳව මෙනෙහි කළේ සමහර ප්‍රකාශන වර්ග ඇත්ත වශයෙන් ම රංගන බවත් සලකා බලමිනි.



දිව්‍යා පැවසුවේ අන්තර්ජාලයේ 'නිතර තමාව සංස්කරණය කිරීම' යන කරුණ ඉන් බැහැර ජීවිතය දක්වාත් ගලා යන බවයි.

> *"තව කෙනෙක් එතෙන ඉන්නවා නම් අපි හදන්නේ කරන දේ තවත් වැඩි කරලා පෙන්නන්න- හොඳ හෝ නරක ලෙස පෙන්වන්නයි- කෙනෙක් ඔයා දිහා බලා ඉන්නවා කියලා දන්න නිසා ඔයා හදන්නේ ලොකු උත්සාහයක් දරන්න, මොකද ඔන්ලයින්වල හැම තිස්සෙ ම සිදුවෙන අධීක්ෂණය ඔයාගේ ඕෆ්ලයින් පෞරුෂත්වයටත් බලපාලා. ඔයා සැබෑ ජීවිතයේ කෙනෙක්ට කථා කරද්දිත් නිතර ම තමන්ව ම සංස්කරණය කරනවා. අපි ඒක හිතල ම කරන දෙයක් නොවුණත්, ඒක ඉබේ ම එතැන වෙන දෙයක්"*




සැබෑ ජීවිතයේ මෙන් නොව අන්තර්ජාලයේ දී සිය අනන්‍යතාව හසුරුවීම පිළිබඳව එතරම් සංකුල නොවන ද්වීමය නොවන අනන්‍යතාවක් ඇති විරාන් කතා කළේ දිව්‍යා පැවසූ දේ අනෙක් පස මෙනෙහි කරමිනි. "සැබෑ ජීවිතයේ දී සමාජභාව රංගනය කියන්නේ තීරණයක් නෙමේ, ජීවිතය ගැට ගසාගන්න අත්‍යාවශ්‍ය දෙයක්." ඔවුන් එසේ කියා සිටියේ, සියලු ම සමාජභාව ප්‍රකාශනයන් මූලිකව ම



**"සැබෑ ජීවිතයේ දී සමාජභාව රංගනය කියන්නේ තීරණයක් නෙමේ, ජීවිතය ගැට ගසාගන්න අත්‍යාවශ්‍ය දෙයක්" - විරාන්**

රංගන වුවත්, අන්තර්ජාලය එම රංගනයේ දී වඩාත් සත්‍යගරුක වීමට ඉඩකඩ ලබා දෙන බව හැඟෙන්නෙ පියවි ලෝකයේ දී කැපී නොපෙනෙන්නට නම් ඔබට සමාජයට ගැළපෙන ලෙස රඟන්නට සිදුවන බැවිණි.

එම නිසා, ඉන් පැහැදිලි වූයේ ප්‍රතිචාරකයන් ඔවුන්ගේ ම සමාජභාව හා ලිංගික අනන්‍යතා වටහාගැනීමටත්, අන් අය වටහාගන්නා ආකාරය හෝ දකින ආකාරය වෙනස් කිරීමටත් අන්තර්ජාලය හා අන්තර්ජාල අවකාශ සිදුකරන කාර්යයේ අගය දුටු බවයි. කෙසේ වෙතත්, ඔවුන්ගේ අත්දැකීම් සැලකිය යුතු විවිධත්වයක් ගත්තේ අන්තර්ජාලයේ ආත්ම ප්‍රකාශන කිරීමට ඔවුන්ට කෙතරම් නිදහසක් දැනුනේ ද යන කාරණය ඔස්සේ ය. සමහරක් දෙනාට ඔවුන්ගේ ආරක්ෂාව, සුරක්ෂිතබව හා හිතේ සැනසිල්ල වෙනුවෙන් (මේවාට ජනවර්ගය වැනි වෙනත් සාධක ද බලපායි) සම්මුතියකට එළඹෙන්නට සිදුවිය. ප්‍රතිචාරකයන් ආත්ම ප්‍රකාශනයට කෙතරම් කැමති ද යන්න බැඳී තිබුණේ ප්‍රචණ්ඩත්වය, හිරිහැරය හා අපයෝජනය පිළිබඳ ඔවුන්ට තිබූ අත්දැකීම් ද සමග ය. මෙය මීළඟ කොටසින් සාකච්ඡා කෙරේ.




# අන්තර්ජාල භාවිතය හා අන්තර්ජාලයේ ප්‍රකාශන

## *ප්‍රචණ්ඩත්වය, හිරිහැර හා අපයෝජනය*

2019 වසරේ ඝෝෂා, ග්‍රවුන්ඩ් වීව්ස් හා හෑෂ්ටැග් ජෙනරේෂන් එක් ව සිදු කළ වාර්තාවක සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පැවති ශ්‍රී ලාංකික ෆේස්බුක් පිටු සෝදිසි කරමින් කාන්තාවන් හා LGBTQ+ ජනතාව ඍජු හා වක්‍ර ආකාරවලින් හිරිහැරයට ලක් කරන ලිංගවාදි, සමලිංගිකවාදි හා සංක්‍රාන්තිලිංගිකවාදි කථා රටා නිරීක්ෂණය කෙරුණා. දණ්ඩ නීති සංග්‍රහය වැනි දැනට පවතින නීති මේ ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් හා කටයුතු කරද්දී භාවිත කරන්නට හැකිවූවත් (3වෙනි ඇමුණුම) එම දණ්ඩ නීති සංග්‍රහයම LGBTQ+ ජනතාව සාපරාධී ලෙස සලකන නිසා, නීති හා නීති ක්‍රියාත්මක කරන අධිකාරීන් පෙනී යන්නේ සහනයකට එළඹිය හැකි මාර්ගයන් ලෙස නොවේ.

ප්‍රතිචාරකයන්ගෙන් 62% අපයෝජානාත්මක කමෙන්ටු ලබා ඇත. මෙය වාර්තා වී ඇති ඉහළ ම ප්‍රචණ්ඩත්ව ප්‍රතිශතය නියෝජනය කරයි. දෙවෙනි ස්ථානය (56%) ලබාගත් ප්‍රචණ්ඩත්වය වූයේ අනවශ්‍ය ලිංගික ප්‍රකාශන සහිත පණිවුඩ හා ප්‍රචණ්ඩත්වය ඔස්සේ ස්ත්‍රීන්ට අවමන් කරන නොයෙකුත් අසභ්‍ය රූප ලැබීමයි.



**අපවාදාත්මක කමෙන්ටු**

ඔව් 62.1%

නැත 37.9%

*රූපසටහන 14: අපවාදාත්මක කමෙන්ටු*

**අවසරයකින් තොර පෞද්ගලික තොරතුරු හුවමාරු**

ඔව් 39.8%

නැත 60.2%

*රූපසටහන 15: අවසරයකින් තොර පෞද්ගලික තොරතුරු හුවමාරු*


**කාන්තාවන් පහත් කර සැලකීම සඳහා අසභ්‍ය හෝ ප්‍රචණ්ඩ රූප භාවිතය**

ඔව් 56.3%

නැත 43.7%

*රූපසටහන 16: කාන්තාවන් පහත් කර සැලකීම සඳහා අසභ්‍ය හෝ ප්‍රචණ්ඩ රූප භාවිතය*

## අන්තර්ජාලයේ හිරිහැර විඳින්නේ කාන්තාවන් පමණයි




*රූපසටහන 17: අන්තර්ජාලයේ හිරිහැර විඳින්නේ කාන්තාවන් පමණයි*



ඉහත ප්‍රකාශයට තමන්ගේ පෞද්ගලික අත්දැකීම හා දැනුමට අනුව පරිමාවක් ලබා දෙන ලෙස පැවසූ විට ප්‍රතිචාරකයන්ගෙන් 50% ක් එකඟ වූයේ අන්තර්ජාලයේ දී හිරිහැරයට ලක්වන්නේ කාන්තාවන් පමණක් නොවන බවයි. කෙසේ වෙතත් 20% පමණ සිතුවේ එය ඇතැම්විට සිදුවිය හැකි දෙයක් බවයි. විජේ පවසා සිටියේ අන්තර්ජාලයේ ඔහු දකින ප්‍රචණ්ඩත්වය, එදිනෙදා පියවි ජීවිතයේ ප්‍රචණ්ඩත්වය ම පරාවර්තනය කරන්නක් බවයි. ඔහු පවසා සිටියේ ඔහුගේ කාන්තා මිතුරියන් ඒ ගැන කතා කරන බවත්, ඔවුන් අන්තර්ජාලයේ මුහුණ දෙන ප්‍රචණ්ඩත්වයට එරෙහිව පිහිට පතන බවත්, ඔහු තොරතුරු තාක්ෂණ (IT) අංශයේ සේවය කළ නිසා ඔහුගෙන් උපකාර ලබාගන්නට ඔහු වෙත පැමිණෙන බවත් ය. ඔහු පැවසූයේ

*"ඔව් කාන්තාවන් අන්තර්ජාලයේ හිරිහැරයට මුහුණ දෙන බව හැමෝම හොඳින් දන්නා ඇත්තක්. ඒ වගේ ම ඒක සමාජභාව/ලිංගික සුළුතර කණ්ඩායම්වලටත් සිදුවන දෙයක්. ඒ වගේ අවස්ථාවල මම ඔවුන්ට නීතිමය උපකාර ගන්න වගේ ම වෙනත් ආකාරවලිනුත් උපකාර කරලා තියෙනවා."*

හසිනි පවසන්නේ වරප්‍රසාද පරිමාණයේ පහළට යන්න යන්න ම, මිනිසුන්ට මුහුණ දෙන්නට සිදුවන හිරිහැර වැඩිවන බවත් ඒවා විශේෂයෙන් ම කාන්තාවන්ට පමණක් මුහුණ දීමට සිදුවන දෙයක් නොවන බවත් ය. අන්තර්ජාලයේ සිදුවන උසුළුවිසුළු, දාමරිකකම් හා හිරිහැර දරාගන්නට නොහැකි අය ගැන ඇය සැලකිල්ලක් දැක්වූවා.





ලක්ෂ්මි පැවසුයේ ඇගේ අන්තර්ජාල නිරීක්ෂණවල දුටුවේ පුරුෂ හෝ කාන්තා යන ද්වීමයෙන් ඔබ්බට ගිය සමාජභාව අනන්‍යතා ඇති, නැතිනම් විෂම ලිංගික නොවන ලිංගික දිශානතියක් ඇති පුද්ගලයන් අන්තර්ජාලයේ ප්‍රකාශන කළ විට සැලකියයුතු හිරිහැර හා විවේචනවලට ලක්වන බවයි. "ඒ සමහර කමෙන්ටු දකින එකත් දරාගන්න අමාරුයි, එච්චරට ම නරකයි" ඇය කීවා ය. ඇගේ අත්දැකීමට අනුව ඈ දැක ඇති සියලු ම සෘණාත්මක කමෙන්ටු පුරුෂයින් විසින් පළ කළ ඒවා ය. ලක්ෂ්මිට අනුව, අන්තර්ජාලයේ අයහපත් ම කොටසවන්නේ කාන්තාවන්ට මුහුණ දීමට සිදුවන හිරිහැරයයි. ඇයට අවශ්‍ය වූයේ එම අපවාදාත්මක කමෙන්ටු අවහිර කිරීමට නැතිනම් එම අවකාශ සුරක්ෂිත කිරීමට දැඩි ප්‍රතිපත්ති අනුගමනය කිරීමටත් මගකි.



ඔහුගේ අතික්‍රාන්තබව ගැන විවෘතව කථා කරන ප්‍රසිද්ධ යූටියුබර් කෙනෙකු වන හිරාන් පවසා සිටියේ ඔහුගේ විඩියෝවලට මුලින් ම ලැබුණු ප්‍රතිචාරය ධනාත්මක වූ බවත්, ඉන් ඔහුට අනුබල ලැබුණු බවත්, ඔහුගේ ප්‍රේක්ෂකයන් වැඩි වීමත් සමග ම සෘණාත්මක කමෙන්ටු වැඩි වූ බවත් ය. මුලින් ම, ඔහු මෙම සෘණාත්මක කමෙන්ටු පෞද්ගලික ඒවා ලෙස ගෙන ඔහුගේ චැනලය වසා දමන තරමට ම අධෛර්යමත් වී ඇත. එහෙත් හෙමින් සෘණාත්මක හා අපවාදාත්මක කමෙන්ටුවලින් වෙන් වීමට ඉගෙනගත් ඔහු කියා සිටියේ දැන් ඔහුගේ ප්‍රේක්ෂකයන් ද එම කමෙන්ටුවලට ප්‍රතිචාර දක්වමින් ඔහු වෙනුවෙන් සටන් කරන බවයි. "මම මොකුත් කියන්න ඕනේත් නෑ" යි හිරාන් කියා සිටියේ ප්‍රේක්ෂකයන් සිය කැමැත්තෙන් ම එසේ කරන බව දැක්වීමටයි.

හිරාන් නිරීක්ෂණය කළේ එක් එක් වේදිකාවන්ට අනුව ප්‍රතිචාර වෙනස් වන බවයි ඔහුගේ අත්දැකීම්වලට අනුව, වඩාත් ම සෘණාත්මක ප්‍රතිචාර ලෙස ඔහු දකින්නේ මිනිසුන් ඔහුගේ යූ ටියුබ් හා ෆේස්බුක්වල පළවන විඩීයෝවල දමන සමලිංගිකවාදි හා සංක්‍රාන්තිවාදී කමෙන්ටු බවයි. ඔහුගේ පෞද්ගලික ජීවිතයේ තතු දමන ඉන්ස්ටාග්‍රෑම් මින් වෙනස් වන්නේ එහි පළවන සෘණාත්මක යැයි සිතිය හැකි ප්‍රතිචාර වුවත් ශීලාචාර භාෂා ශෛලියකින් ලියැවී ඇති බව ඔහු දකින නිසා ය. හිරාන් ඉන්ස්ටාග්‍රෑම් එකට එක්වීමට ගත් තීරණය පහදා දුන්නේ "මම හිතන්නේ ඒක විවෘත මනසින් යුත් මිනිස්සුන්ට හදපු සමාජ මාධ්‍යය වේදිකාවක්" කියා ය.



දිව්‍යා (ඇය ඉංග්‍රීසි හා දෙමළ භාෂා දෙකෙන් ම පෝස්ට් පළකරයි - දළ වශයෙන් ඇගේ අන්තර්ගතවලින් 40% පමණ දෙමළ බසින් වේ) චිත්‍රකතා වැනි පුරුෂයන් අතර වඩාත් ප්‍රචලිත යැයි සිතන විෂය පිළිබඳව ඇති පුරුෂ මූලික පිටු තුළ - විශේෂයෙන් ම කාන්තාවන්ව - පීඩාකිරීම් හා සුළුකොට තැකීම් සිදුවනු දැක ඇත. "මම හිටපු පිටුවක් තිබ්බා, ඔයා ඒකට අදාළ දෙයක් දැම්මොත් හිරිහැර කරනවා, වට්ටන්න හදනවා - මං ඒ වගේ ගොඩක් දැක්කා. එයාලා ගොඩක් දුරට නපුරු වුණේ ගෑණු ළමයින්ට. එයාලා නිතර කියනවා 'ඒක හෙන ම ගොන් කියලා' මං හිතන් හිටියේ ඒ පිටුවෙ තොරතුරු හොඳයි ඒක අපූරුයි කියලා, මට මං වගේ හිතන අය හමුවෙයි කියලා." කෙසේවෙතත්, දිව්‍යා තවත් පෙන්වාදුන්නේ එම අඩවියේ ම තමා සමහර වෙලාවට හිරිහැරයට ලක් වූ බවත් පුරුෂ සමලිංගිකයකු වීම හෝ කාන්තාවක් වීම ම කෙනෙකු හිරිහැරයට ලක්වීමට ඇති අනතුර වැඩිකරන බවත් එය ඔවුන් පෝස්ට් කරන දේ මත රඳා පවතින බවත් ය.



**"මං දන්නවා සමාජභාව සමානාත්මතාවට රුකුල් දෙන අය ඒත් එයාලා අන්තර්ජාලයේ ඒක කරන්නේ නැත්තේ අවරගැස්මක් ඇතිවෙන බව දන්න නිසයි. මගේ අතික්‍රාන්ත මිතුරන් අන්තර්ජාලයේ කිසිවක් නොදමන්නේ ඒ තුළින් වෙනස් ලෙස සැලකීමට, ප්‍රචණ්ඩත්වයට මුහුණ නොදී සිටීමටයි - දිව්‍යා**

*"මං දන්නවා සමාජභාව සමානාත්මතාවට රුකුල් දෙන අය ඒත් එයාලා අන්තර්ජාලයේ ඒක කරන්නේ නැත්තේ අවරගැස්මක් ඇතිවෙන බව දන්න නිසයි. මගේ අතික්‍රාන්ත මිතුරන් අන්තර්ජාලයේ කිසිවක් නොදමන්නේ ඒ තුළින් වෙනස් ලෙස සැලකීමට, ප්‍රචණ්ඩත්වයට මුහුණ නොදී සිටීමටයි. මං මගේ නිබන්ධනේට සංක්‍රාන්ති පුද්ගලයින් එක්ක කතා කරද්දි එයාලා කිව්වේ ඒක තීරණය වෙන්නේ එයාලව පිළිගන්වන හැටි මත කියලා. එයාලා කිව්වේ සමහර සංක්‍රාන්ති පුද්ගලයන් විචිත්‍ර බවත් අනෙක් අය එසේ නොවන බවත් ය. එයාලා කිව්වේ ඔයා විචිත්‍රව පෙන්නන්න ගියෝතින් හිරිහැරයට ලක්වෙනවා වැඩියි කියලයි - මං ඒකට එකඟ නෑ, ඒත් ඒක තරමක් දුරට ඇති. කෙනෙක් එයාලගේ අනන්‍යතාව ගැන ක්‍රියාශීලී නම් නිතර ප්‍රකාශ කරනවා නම් එයාලා හිරිහැරයට ලක්වීමේ ඉඩකඩ වැඩියි."*

දිව්‍යා පවසන්නේ තමන්ගේ ජනවාර්ගික අනන්‍යතාව නිසා විශේෂයෙන් ම ලැබුණු අවරගැස්මක් දැක නැතත්, පැහැදිලිව ම පිරිස අතර සෘනාත්මක ප්‍රතිචාර ඇතිකරාවි යැයි සිතිය හැකි දේ තිබෙන බවයි. ඇෘ පළ කරන දේ අනුව අවරගැස්ම ඇතිවන බව දැක ඇත; උදාහරණයක් ලෙස ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය හා අයිතිවාසිකම්, LGBT ගැටලු, කාන්තා ලිංගේන්ද්‍රි ඡේදනය පිළිබඳව. අවරගැස්මේ සැලකියයුතු ප්‍රමාණයක් ආගම හා සංස්කෘතියට සම්බන්ධ කර ඇත්තේ - 'මෙය දෙවියන්ට පටහැනියි' හෝ 'මේක සදාචාරත්මක නැහැ' හෝ 'අපි කළ යුත්තේ මෙය නොවේ යනුවෙනි ඇෘ පවසන්නේ මෙය දෙමළ බසින් පළකළ විට ඇතැම් අවරගැස්ම ඇතිවන්නේ ඇය ඇගෙ ම ප්‍රජාව පිළිබඳව සෘනාත්මකව කතා කරන බැවිනි- "මොකද මම මේක ගැන කතා කරන 'අපේ ම කෙනෙක්"



ඇය දෙමළෙන් පෞද්ගලික කිසිවක් පළ නොකරයි.



සෙල්වි කියා සිටියේ කාන්තාවක් විදියට ඇගේ අනන්‍යතාවට පහර ගසා ඇත්තේ ඇය තරුණ කණ්ඩායම් හා කරන වැඩවල කොටසක් ලෙස ලිංගික දිශානති හෝ අනන්‍යතා පිළිබඳ කුමක් හෝ පළකළ විට බවයි. මිනිසුන් ඇයට ප්‍රතිචාර දක්වෙන්නේ "ඇයි ඔයා මෙහෙම පෝස්ට් කළේ; ඔයාගේ ලිංගික අනන්‍යතාව හා දිශානතිය මොකක්ද; ඇවිත් මාත් එක්ක බුදියනවද?" යනුවෙනි ඇය ඒවාට ප්‍රතික්‍රියා කර ඇත්තේ ඔවුන්ව නොතකා හැර මෙන් ම ඇතැම් විටෙක පොලිසියට පැමිණිලි කරමින් ය. ඇතැම්විට යම් කෙනෙක් සමග සාධනීයව සම්බන්ධ වීමට කමෙන්ටු හරහා අවකාශයක් තිබේ යැයි හැඟුනු අවස්ථාවල ඈ එසේ ද කර ඇත.

ප්‍රචණ්ඩත්වයට මෙවැනි ප්‍රතිචාර දැක්වූයේ සෙල්වි පමණක් නොවේ. අපි සොයාගත්තේ ප්‍රචණ්ඩත්වයට මුහුණ පෑ විට බහුතරයක් ප්‍රතිචාරකයන් එය සිදු වූ වේදිකාවට වාර්තා කිරීමට තීරණය කළ බවයි. බොහෝ දෙනා එය නොතකා සිටීමට ද තීරණය කර ඇති අන්තර්ජාලයේ සිදුවුණු ප්‍රචණ්ඩත්ව නෛතික පද්ධතියකට වාර්තා කළේ අතලොස්සකි. සාකච්ඡා තුළ මෙයට හේතු කිහිපයක් හෙළි විය; අන්තර්ජාලයේ වූ ප්‍රචණ්ඩත්වය නීතියට ගෙන යාමට තරම් දරුණු නැතැයි සිතීම, අපගේ නීති තුළින් අන්තර්ජාලයේ ප්‍රචණ්ඩත්වයට ක්‍රියාමාර්ග ගත හැකි බව නොදැන සිටීම, නෛතික පද්ධතිය පිළිබඳ විශ්වාස රහිත බව, ප්‍රචණ්ඩත්වය පෙර පැවති ආදර හෝ ලිංගික සබඳතාවක් තුළ වූවා නම් එය වාර්තා කිරීමට මැළි බව, පොලීසියට වාර්තා කිරීමේ දී දණ්ඩ නීති සංග්‍රහය යටතේ ඔවුන්ව ම අත්අඩංගුවට පත්වේ යැයි බිය. ප්‍රචණ්ඩත්වයට තවත් ප්‍රතිචාරයක් වූයේ අපයෝජකයන් බ්ලොක් කිරීමයි.

## අපයෝජනයට එරෙහිව ගත් ක්‍රියාමාර්ග



**නොතකා හැරියා**

ඔව් 46.6%
නැත 53.4%

*රූපසටහන 18: නොතකා හැරියා*

**එම වේදිකාවට වාර්තා කළා**

ඔව් 58.3%
නැත 41.7%

*රූපසටහන 19: එම වේදිකාවට වාර්තා කළා*

**නෛතික පද්ධතියකට වාර්තා කළා**

ඔව් 9.7%
නැත 90.3%

*රූපසටහන 20: නෛතික පද්ධතියකට වාර්තා කළා*

**ආපස්සට කතා කළා**

ඔව් 27.2%
නැත 72.8%

*රූපසටහන 21: ආපස්සට කතා කළා*



මම මේක වාර්තා කරනවා කියලා එයාලා ස්ක්‍රීන්ශොට් එකක් අරං ඒක අන්තර්ජාලයේ පළ කළේ මගේ ප්‍රොෆයිල් පින්තූරෙත් එක්කමයි, මගේ නොම්මරෙත් පෙනුණා. මට පුද්ගලයෙක් කුණුහරපෙන් බැන්නා. මේ පෝස්ට් එක 140 දෙනෙක් දැකලා, 30 පාරක් විතර ශෙයා කරලා. අන්තිමට (මේ හිරිහැරයෙන් ඈත්වෙන්න) මට මගේ ප්‍රොෆයිල් පින්තූරෙත් මාරු කරන්න වුණා."

– ක්‍රිෂාණි



ක්‍රිෂාණි ද තවත් කතා කළේ යම් කෙනෙක් ඔවුන් අකැමැති කමෙන්ටුවක් හෝ පෝස්ටුවක ස්ක්‍රීන්ශොට් ලබා ගෙන එය අන්තර්ජාලයේ පළ කිරීමෙන් ඇතිවන 'නම් කිරීමේ හා අපහාස කිරීමේ' සංස්කෘතියක් පිළිබඳවයි. මෙය ඇයට ද මුහුණ දීමට සිදුවූ පෞදගලික අත්දැකීමකි.

*"මේ මම දන්න කෙනෙකුට වට්සැප් එකේ යවපු දේශපාලනික මතවාදයක්. ඒක මම ඉස්කෝලේ ගිය කෙනෙකුට පෞද්ගලිකව යවපු දෙයක්. මට තේරුණේ නෑ මං මීට කලින් ඔවුන් එක්ක කතා කරලා නැහැ කියලා, ඒත් එයාලා මගේ කන්ටැක්ටස්වල ඉඳලා. එයාලා මගේ නොම්මරේ අඳුනගන්නේ නැතුව කිව්වා 'කවුද මේ, මම මේක වාර්තා කරනවා කියලා. එයාලා ස්ක්‍රීන්ශොට් එකක් අරං ඒක අන්තර්ජාලයේ පළ කළේ මගේ ප්‍රොෆයිල් පින්තූරෙත් එක්කමයි, මගේ නොම්මරෙත් පෙනුණා. මට පුද්ගලයෙක් කුණුහරපෙන් බැන්නා. මේ පෝස්ට් එක 140 දෙනෙක් දැකලා, 30 පාරක් විතර ශෙයා කරලා. අන්තිමට (මේ හිරිහැරයෙන් ඈත්වෙන්න) මට මගේ ප්‍රොෆයිල් පින්තූරෙත් මාරු කරන්න වුණා."*

මෙවැනි අත්දැකීම් පෙර කොටසේ සාකච්ඡා වූ පරිදි ප්‍රකාශනයටත් අන්තර්ජාල භාවිතයටත් බලපායි. කාන්තාවක් ලෙස සෙල්විට, "ලිංගිකත්වය, අපි සංසර්ගය දකින විදිය, ලිංගික අධ්‍යාපනය, කාන්තා සිරුරු ගැන පෝස්ටු" බෙදා ගැනීමට ඇත්තේ ඉතාමත් කුඩා ඉඩකඩකි.

*"ගැහැනියක් නිසා මට ඕනේ වුණත් මේවා ෆේස්බුක් එකේ ශෙයා කරන්න බෑ. මම දන්න සමහර කාන්තාවෝ මේවා ශෙයා කරලා තියෙනවා ඒත් ඒවායේ ස්ක්‍රීන්ශොට් ගහලා*

*බොරු අනන්‍යතා වලින් ශෙයා කරලා ඒ කාන්තාවන්ට අන්තර්ජාලයේ හිරිහැර කරලා.”*



ව්‍යාජ ගිණුම් භාවිත කරන පුද්ගලයින් හඹා ගොස්, හඳුනාගැනීමටත් හිරිහැර කිරීම්වලට තිත තැබීමටත් සෙල්වි කැමැත්තක් දක්වයි. ඇය පවසන්නේ ශ්‍රී ලංකාවේ උතුරේත් නැගෙනහිරත් සිටින්නේ මෙය කිරීමට සමත් දැනුම ඇති එක ම එක පුද්ගලයෙකු පමණක් බවත්, එය කාලය වැයවන නිසා ලේසි පහසු කාර්යයක් නොවන බවත් ය.


සමීක්ෂණය තවදුරටත් ප්‍රතිචාරකයන්ගෙන් අසා සිටියේ ඔවුන් කවදාක හෝ තාක්ෂණ සබැඳි ප්‍රචණ්ඩත්වයක සහභාගි වී තිබේ ද කියායි. ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන් අයට සාපේක්ෂව ගණන කුඩා වුවත්, පහත ප්‍රස්තාර පෙන්වන්නේ මේ අතරින් ඇතැම් අය ප්‍රචණ්ඩත්වය, අපයෝජනය හා හිරිහැර කිරීම්වලට සහභාගිවී ඇති බවයි.

ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා අතරතුර දී, අපවාදාත්මක කමෙන්ටු පළ කළ, ප්‍රචණ්ඩ තර්ජන කිරීමට සහභාගි වූ අය කියා සිටියේ බොහෝ විට ඒවා ඔවුන්ට මුහුණ

**අපවාදාත්මක කමෙන්ටු**

ඔව් 14.6%
නැත 85.4%


රූපසටහන 22: අපවාදාත්මක කමෙන්ටු



**ප්‍රචණ්ඩකාරී සෘජු තර්ජන, ලිංගික හා/හෝ ශාරීරික ප්‍රචණ්ඩකාරී තර්ජන ද ඇතුළු**

ඔව් 5.8%
නැත 94.2%


රූපසටහන 23: ප්‍රචණ්ඩකාරී සෘජු තර්ජන, ලිංගික හා/හෝ ශාරීරික ප්‍රචණ්ඩකාරී තර්ජන ද ඇතුළු



**සමාජ මාධ්‍ය පෝස්ටු හෝ/හා ඊතැපැලෙන් ලැබෙන නිරන්තර වෛරී ප්‍රකාශන**

ඔව් 8.7%
නැත 91.3%


රූපසටහන 24: සමාජ මාධ්‍ය පෝස්ටු හෝ/හා ඊතැපැලෙන් ලැබෙන නිරන්තර වෛරී ප්‍රකාශන



**ලිංගවාදී හෝ/හා සමාජභාව විරෝධී කමෙන්ටු හෝ නම් අඬගැසීම්**

ඔව් 5.8%
නැත 94.2%

රූපසටහන 25: ලිංගවාදී හෝ/හා සමාජභාව විරෝධී කමෙන්ටු හෝ නම් අඬගැසීම්




දීමට සිදු වූ ප්‍රචණ්ඩත්වයන්ට දැක්වූ ප්‍රතිචාර බවයි.

> *"කවුරුහරි මට සඳසමලිංගික පුරුෂයෙකු සඳහා සිංහලෙන් භාවිත වන අපහාසාත්මක පදයක් කියලා කිව්වොත්, මම අනිත් පැත්තට කියන්නේ මම එහෙම නම් එයාලත් එහෙමයි කියලා"*

එක් ප්‍රතිචාරකයෙක් සාකච්ඡාව අතරතුර පැවසුවේ ය කෙසේ වෙතත් ඔවුන් නිරීක්ෂණය කළේ LGBTQ+ ජනතාවටත් වෙනත් ඕනෑම කෙනෙකු මෙන් ජනවර්ග, ආගම, සමාජභාවය ආදිය පාදක කරගත් වෛරී ප්‍රකාශන කළ හැකි බවත්, සමහර විට ඔවුන් අන්තර්ජාලයේ උණුසුම් විවාද හා වාදවල පැටලෙන බවත් ය. පසන් ජයසිංහ පෙන්වාදෙන අයුරින්,"බොහෝ විට, ඇතැම් විට කර්කශ ලෙස, අතික්‍රාන්ත ජනතාව විසින් ඔවුන් වෙනුවෙන් කතා කරන මුස්ලිම් හෝ වෙනත් ජනතාව වෙත සමලිංගිකවිරෝධී අපහාස සිදුකරනු ලැබේ. මෙයින් බාගවිට කියැවෙන්නේ ශ්‍රී ලාංකික අනන්‍යතා අතරේ, අනෙකුත් අනන්‍යතා වසා දමන ප්‍රධාන පදනමක් ලෙස ජාතිය පවතින බවයි. (ජයසිංහ, 2019)

**අපවාදාත්මක කමෙන්ටු පළ කළ, ප්‍රචණ්ඩ තර්ජන කිරීමට සහභාගි වූ අය කියා සිටියේ බොහෝ විට ඒවා ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා අතරතුර දී ඔවුන්ට මුහුණ දීමට සිදු වූ ප්‍රචණ්ඩත්වයන්ට දැක්වූ ප්‍රතිචාර බවයි.**



# ප්‍රජාව සොයාගැනීම හා ජීවනෝපාය


## ප්‍රජාව සොයාගැනීම හා

## ක්‍රියාකාරීත්වය පිහිටුවීම

ප්‍රතිචාරකයන්ගෙන් 70%කට ආසන්න සංඛ්‍යාවක් කියා සිටියේ අන්තර්ජාලය ඔවුන්ව ඉතාමත් පහසුවෙන් මිනිසුන් සමග සම්බන්ධ කරන බවයි. මෙය ක්ෂණිකව ම ස්මාර්ට් ෆෝන් ඔස්සේ එකිනෙකා හා සම්බන්ධවීමට හැකි ආකාරය සලකාබලද්දී ප්‍රමාණවත් සරල පිළිතුරක් සේ පෙනීගිය ද, ඇතැම් ප්‍රතිචාරකයන් හා අප පැවැත් වූ සංවාද ඔවුන්ගේ පිළිතුරු පසුපස තිබූ සූක්ෂ්ම හේතු හෙළි කළේය. ප්‍රතිචාරකයන්ගෙන් බහුතරයක් පැවසූයේ විවිධාකාර පුද්ගලයින් අන්තර්ජාලය තුළ විවාද හා සංවාදවල යෙදෙන බවයි. ඉන් 63% ක් එය නිසැක බව පවසන අතර 29% ක් සමහරවිට එය එසේ වන බව පවසති හැඳින්වීමෙහි සඳහන් කළ පරිදි, මෙම පර්යේෂණය තුළින් LGBTQ+ ක්‍රියාකාරීන් ක්‍රියාකාරීත්වය සඳහා අන්තර්ජාලය භාවිත කරන ආකාරයෙන් ඔබ්බට යෑමට උත්සාහ ගත් අතර□ ඒ වෙනුවට ඉන් ගවේෂණය වූයේ ශ්‍රී ලංකාවේ LGBTQ+ පුද්ගලයින් එදිනෙදා ජීවිතයේ දී අන්තර්ජාලය භාවිතා කරන්නේ කෙසේද යන්නයි. කෙසේවෙතත්, අන්තර්ජාලයේ ක්‍රියාකාරීත්වය අපගේ ප්‍රතිචාරකයන්ගෙන් බොහෝමයක් දෙනාගේ එදිනෙදා ජීවිතයේ ම කොටසකි. පහත දැක්වෙන ඔවුන්ගේ අත්දැකීම්වලින් පෙන්නුම් කරන අයුරින්, අන් අයට අන්තර්ජාලය ඔස්සේ ප්‍රජාව සොයාගැනීමට උපකාර කිරීම මෙම ක්‍රියාකාරිත්වයේ ප්‍රධාන අංගයකි. සියලුම ප්‍රතිචාරකයන් තමන් ක්‍රියාකාරීන් ලෙස හෝ තමා කරන දේ ක්‍රියාකාරීත්වයක් යැයි නොසැලකුවත්, ප්‍රජාව සහ ක්‍රියාකාරීත්වය එකිනෙකට සමීපව බැඳී ඇති නිසා මෙම අංශයෙන් ඒවා එක්කොට සලකා බලන්නට පුළුවනි.

**අන්තර්ජාලය පහසුවෙන්ම මාව අන් අය හා සම්බන්ධ කරයි**


| | |
|---|---|
| අනිවාර්යයෙන්ම | 68.0% |
| ඇතැම්විට | 20.4% |
| නැත | 8.7% |
| නොදනිම් | 2.9% |



රූපසටහන 26: අන්තර්ජාලය පහසුවෙන්ම මාව අන් අය හා සම්බන්ධ කරයි

**අන්තර්ජාලයේ විවාද/ සාකච්ඡාවල විවිධ පුද්ගලයන් සහභාගී/සම්බන්ධවනවා**

| | |
|---|---|
| අනිවාර්යයෙන්ම | 63.1% |
| ඇතැම්විට | 29.1% |
| නැත | 4.9% |
| නොදනිම් | 2.9% |



රූපසටහන 27: අන්තර්ජාලයේ විවාද/ සාකච්ඡාවල විවිධ පුද්ගලයන් සහභාගී/සම්බන්ධවනවා



ආර්යා ගැන ඇගේ ෆේස්බුක් ගිණුමෙන්, පිටුවෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් අසා ඇති ඩයස්පෝරා දමිළ ජනතාව□ ඔවුන් කොළඹට පැමිණි විට ඈ හමුවීමට උත්සාහ දරණ අතර, ඈට හැඟී ඇත්තේ සංක්‍රාන්ති ලිංගිකයන් සම්බන්ධ ගැටලු ගැන කතාකිරීමට ද ඔවුන් කෙමෙන් විවෘත වන බවයි. මෙය සාපේක්ෂව අලුත් සිදුවීමකි. ඇයගේ අනන්‍යතාවය ප්‍රකාශ කිරීම සඳහා අවකාශයක් ලෙස අන්තර්ජාලය භාවිතය තුළින් ඈ මෙන් ම හැඟුණු වෙනත් අයටත් අන් අය හා එක්වීමට මෙන් ම සම්බන්ධවීමට ද අවශ්‍ය විශ්වාසය ඈ විසින් ලබා දී ඇත. ඈට අනුව, සෘනාත්මක කමෙන්ටු, අනවසරයෙන් ඇගේ පින්තූර බෙදාගැනීම, ඇගේ පින්තූර භාවිත කළ ව්‍යාජ ගිණුම් ආදිය ඇය සංක්‍රාන්ති ප්‍රජාව වෙනුවෙන් කරන කාර්යයවලටත් ඇගේ ක්‍රියාකාරීත්වයටත් බලපා ඇත.



ශමාල් තමාගේ නිල සමාජ මාධ්‍ය ගිණුම් භාවිත කරන්නේ සංක්‍රාන්ති අනන්‍යතාවය හා ක්‍රමවේද පිළිබඳව තොරතුරු සොයන පුද්ගලයින්ට එම තොරතුරු දේශීය භාෂාවලින් ලබාගැනීමට හැකි වේ යැයි සහතික කිරීමට ය. සිය ජංගම දුරකථන අංකය ඇගේ පෞද්ගලික හා කාර්යාල සමාජ මාධ්‍ය ගිණුම්වල සඳහන් කර ඇති ශිරානි පැවසූයේ අන්තර්ජාලය විසින් තමාට "සමාජයට හා ඥාතම ප්‍රජාවට තොරතුරු ලබාදීමට විශාල අවස්ථාවක් ලබා දෙන" බවයි. "ඉස්සර අපිට වැඩියෙන් ම ලැබුණේ වැරදි තොරතුරු" කියා ශිරානි පැවසුවේ තමාත් තම ප්‍රජාවේ වෙනත් අයත් කාලෝචිත



මෙන් ම නිවැරදි තොරතුරු ලබාදීමේ භූමිකාව කෙතරම් වැදගත් ලෙස සලකනවාදැයි කියා විශේෂයෙන් සඳහන් කරමිනි. ඇය තවදුරටත් පැවසූයේ කොළඹ හා රටේ වෙනත් පළාත්වල තරුණතරුණියන් ඔවුන්ගේ සමාජභාවය පිළිබඳ තොරතුරු සෙවීම සඳහා අන්තර්ජාලය භාවිතා කරන බැවින්, ත්‍රෛභාෂික සහයෝගය අන් කවරදාකටත් වඩා වැදගත්වන්නේ ඔවුන්ට සැපයෙන්නේ නිවැරදි තොරතුරු බව තහවුරු කිරීමට බවයි. ඇයට මධ්‍යම රාත්‍රියේදී පවා ඇමතුම් ලැබෙන්නේ සමාජභාව අනන්‍යතාව පිළිබඳ ව්‍යාකූලතා හෝ තැවීම මිනිසුන්ගේ මානසික සෞඛ්‍යයට අහිතකර බලපෑම එල්ල කරන නිසාත්, ඔවුනට විශාල තනිකමක් දැනෙන විට ප්‍රජාව සොයාගැනීමේ අවශ්‍යතාව ඇතිවන නිසාත් ය.



දිව්‍යාට අන්තර්ජාලය උපකාරී වූයේ අන්තර්ජාලයේ මෙන් ම පියවි ලොවේත් අතික්‍රාන්ත පුද්ගලයන් හමුවීමට වන අතර, ඒ තුළින් ඇයට සැලකිය යුතු වෙනසක් සිදු වී තිබෙනවා. ඈ පැවසූයේ අන්තර්ජාලය හරහා අලිංගික ප්‍රජාව වැනි අයව වඩාත් හොඳින් වටහාගැනීමට ඇයට හැකි වූ බවයි.

*"මං හිතං හිටියේ 'අලිංගික' කියන්නේ අසත්‍යයක් කියලයි- මං හිතුවේ එයාලා ලිංගිකව හැසිරෙන්න කැමති නැතිවීමට මොකක් හරි හේතුවක් ඇති කියලයි. ඒත් මං අන්තර්ජාලයේ අලිංගික පුද්ගලයන් කීප දෙනෙකුට කතා කළා ම හොඳටම පුදුමවුණා! ඒකෙන් මම දකින විදිය ගොඩක් වෙනස් වුණා□ මට තේරුණා සමාජයේ සබඳතාවලටත්, හිතමිතුරුකම්වලටත් අපි නොදන්නා පැතිකඩ ගොඩක් තියෙන්න පුළුවන් කියලා."*

ඇයට තවත් පෙනීගිය දෙයක් වූයේ මිනිසුන්ට මුහුණට මුහුණ හමුවීමට වඩා අන්තර්ජාලයේ ප්‍රකාශන කිරීමේදී නිදහසක් දැනෙන බවයි.

*"මට පියවි ලෝකයේ සාකච්ඡාවල හරි සම්මන්ත්‍රණවල හරි වෙනත් අතික්‍රාන්ත අය හමුවුණත් අප අතර කතාව නිතර ම සමලිංගිකත්වය නිතීවිරෝධී වීම, ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආදියට සීමාවෙනවා. ඒත් අන්තර්ජාලයේදී ඊට වඩා ගොඩක් දේ ඔවුන් කතා කරනවා-ආල සබඳතා පැවත්වීමට නොහැකිවීම ගැන, ලිංගික හා සමාජභාවය ප්‍රකාශ කිරීමට ඇති අපහසුතා ගැන, අඳිනපලඳින දේ ගැන, ටින්ඩර් එකේ මුහුණදෙන ප්‍රශ්න ගැන - මේක ගොඩක් විශේෂ වුණේ පියවි ජීවිතේ මේ වගේ දේවල් ගැන හමුවෙලා කතා කරනවා අත්දැකලා නැති නිසයි".*

පුද්ගලයන් හා නිර්නාමිකව ටම්බ්ලර් වේදිකාවේ කතා කිරීම ඇරඹූ ඇය, එක්තරා ආකාරයක විශ්වාසයක් ගොඩනගාගත් පසු වට්සැප් හා ඉන්ස්ටාග්‍රෑම්වලට එම කතාබහ ගෙන ගියා ය. ඇතැම් වෙලාවට එදිනෙදා ජීවිතයේත්, වෙනත් රටවලත් හමුවුණු ඇතැම් පුද්ගලයන් සමග ඈ නිතර කතාබහ කළා ය. "ඔයා එක්කෙනෙක් හමුවුණාම ඇති, ඉබේ ම අනෙක් අය ඔයාව හොයාගන්නවා". අන්තර්ජාලයේ සිටීමෙන් ඇතිවුණු හොඳම ප්‍රතිඵලය ලෙස දිව්‍යා දුටුවේ ඇගේ ගතානුගතික පසුබිම නිසාවෙන් අවශ්‍ය පුද්ගලයන් හමුවීමට ඉඩකඩ එතරම් නොවූයෙන් ඈට කවදාවත් හමුනොවේවි යි කියා සිතූ විවිධාකාරයේ පුද්ගලයන් හමුවීමයි. සීමිත කණ්ඩායම් තුළ මෙන් ම අන්තර්ජාල සමාජශාලා තුළ ද නොයෙක් අනන්‍යතා තිබූ පුද්ගලයන් හමුවීම තුළින් තමා පිළිබඳව හොඳක් හැඟීමටත් "තනිකම අඩුවීමටත්" උපකාරී වී ඇත. "මුහුණට මුහුණ හමුවනවාට වඩා, අන්තර්ජාලයේ කාටහරි කතාකරන කොට මට පහසුවක් දැනෙනවා, හමුවෙලා කතා කරද්දි හුඟක් දේ දැනෙන නිසා ස්ක්‍රීන් එකක් හරහා කෙනෙක්ට කතා කරන එක ලේසියි"



**"ඔයා එක්කෙනෙක් හමුවුණාම ඇති, ඉබේ ම අනෙක් අය ඔයාව හොයාගන්නවා" - දිව්‍යා**



සෙල්වි කියා සිටියේ තමා සමාජභාව හා ලිංගික අනන්‍යතා පිළිබඳ පෝස්ට් පළ කළ විට, ඈ වෙත පැමිණි පුද්ගලයන් ඔවුන්ගේ කතා ද බෙදාගත් බවත් එ තුළින් අන්තර්ජාලයේ සිටි වෙනත් අය හා සම්බන්ධ වුණු බවත් ය. ඈට හැඟෙන්නෙ ඔවුන් ආරක්ෂිතව කතා කළ හැකි කෙනෙකු ලෙස ඈව දකින බවයි.

හිරාන් සිතන්නේ ඔහුගේ අනුගාමිකයන් හා ප්‍රේක්ෂකයන් සමාජභාව අනන්‍යතාව හා ලිංගිකත්වය දකින ආකාරය ඔහුගේ වීඩියෝ තුළින් පෝෂණය වී ඇති බවයි. ඔහු කියා සිටියේ ශ්‍රී ලංකාවේ ප්‍රකට සංස්කෘතියේ LGBTQ+ චරිත මෙන් ම, ප්‍රසිද්ධ මාධ්‍යයේ



LGBTQ+ ජනතාව දකින්නේ සෘනාත්මක හා පහත් ලෙස බවයි. ඔහු සොයාගෙන ඇත්තේ, සිය විඩියෝ සමාජභාව අනන්‍යතා හා ලිංගිකත්වය වෙත සෘජුව ම යොමු නොවූ ව ද, ඔහු රඟ දක්වන චරිත, ඔහුගේ විඩියෝවල තේමාවල යොමුව වන එදිනෙදා ජීවිතයේ ගැටලු මෙන් ම ඔහුගේ පෞද්ගලික ජීවිතයෙන් බෙදාගන්නා අත්දැකීම් සමාජභාව අනන්‍යතාව හා ලිංගිකත්වය පිළිබඳ මිනිසුන්ගේ අවබෝධ පෝෂණය කරන බවයි. LGBTQ+ පුද්ගලයන් පිළිබඳ ඔවුන්ගේ ආකල්ප හොඳ අතකට වෙනස් කිරීමට ඔහුගේ විඩියෝ උපකාරී වූ බව කියා ලියූ ප්‍රේක්ෂකයන් හා අනුගාමිකයන් මෙන් ම ඔහුගේ විඩියෝ දැකීමෙන් පසු ප්‍රජාව සොයාගැනීම පිළිබඳව ඔහුට ලියූ සංක්‍රාන්ති හා විරුද්ධ-ලිංගිකයන් ලෙස ඇඳ පැළඳගන්නා අය ආදී පුද්ගලයන් පිළිබඳව ද ඔහු උදාහරණ ලබා දුන්නේ ය.

මෙම උදාහරණ පෙන්වාදෙන්නේ LGBTQ+ පුද්ගලයන් අන්තර්ජාලයේ දී විවිධ ක්‍රම ඔස්සේ ප්‍රජාව නිර්මාණය, ලබාදීම මෙන් ම සොයාගැනීම කරන බවත් ඒවා සෑමවිට ම සමාජභාව අනන්‍යතාවේ හා ලිංගිකත්වයේ මුහුණුවර නොගන්නා බවත් ය. අන්තර්ජාලය තුළ ඕනෑම මාතෘකාවක් ආශ්‍රිතව ප්‍රකාශන කරන අතික්‍රාන්ත හෝ සංක්‍රාන්ති පුද්ගලයන් දැකීම ම ප්‍රජාව සොයා සම්බන්ධකම් ගොඩනගාගැනීමට ජනතාවට රුකුලක් වන බව මින් පෙනී යයි.



**මගේ අනුගාමිකයන් හා ප්‍රේක්ෂකයන් සමාජභාව අනන්‍යතාව හා ලිංගිකත්වය දකින ආකාරය මගේ විඩියෝ තුළින් පෝෂණය වී ඇත - හිරාන්**




# ප්‍රජාව සොයාගැනීම හා ජීවනෝපාය

## ජීවනෝපාය

**නිපැයුම් පරිභෝජකයෙකු ලෙස ඔබ කොපමණ අන්තර්ජාලය භාවිත කරනවාද?**

ප්‍රතිචාරකයන්ගෙන් 30% ක් පමණ තමන් කෙදිනකවත් තම ජීවනෝපාය සඳහා අන්තර්ජාලය භාවිත නොකරන බව පැවසුවත් බහුතරයක් කියා සිටියේ ඔවුන් සෑමවිටම හෝ සමහරවිට ජීවනෝපායන් සඳහා එය භාවිත කරන බවයි. නූතන සේවාස්ථාන වැඩි වැඩියෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් මත යැපෙන බැවින් මෙය පුදුමයක් නොවේ ය. කෙසේවෙතත්, අපට අවශ්‍ය වූයේ LGBTQ+ පුද්ගලයන් ජීවනෝපාය ගෙනයාමටත්, ඒවා වර්ධනය කිරීමටත් අවකාශයක් ලෙසත් අන්තර්ජාලය භාවිත කරන ආකාරය මෙන් ම එසේ භාවිත කිරීමේ දී ඔවුන් මුහුණදෙන අවස්ථා හා අභියෝග පිළිබඳව ද අවබෝධයක් ලබා ගැනීමටයි.




*රූපසටහන 28: ඔබ ජීවනෝපායක් සඳහා අන්තර්ජාලය භාවිත කරනවාද?*



කුඩා කල සිට ම නළුවෙකු වීමට ආශා කළ හිරාන්ට සිනමා කර්මාන්තයේ කොටසක් වීමට සිහිනයක් තිබුණි. කෙසේවෙතත්, ඔහු පාසලේ දී මේ පිළිබඳ අඩු උනන්දුවක් දක්වා සුළු චරිතයකට හැර පාසල් නාට්‍ය නිෂ්පාදනවල සහභාගී නොවීය. පසුකාලයේ, ඔහු සාම්ප්‍රදායික නවයේ සිට පහ දක්වා දිවෙන රැකියාවන් කිහිපයක් කිරීමට උත්සහ කළත් එවැනි දිනචර්යාවක් ගෙවීම ඔහුට අභියෝගයක් විය. තවමත් සිනමාවේ කොටස්කරුවෙකු වීමට සිහින දුටු ඔහු චිත්‍රපට අධ්‍යක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරුවේ ය. ඔහු යූටියුබ් චැනලයක් සාදා එහි ලිලී සින්ග් වැනි අය හා ප්‍රසිද්ධ වූ, චරිත නිරූපණ ශෛලියෙන් තම ප්‍රථම වීඩියෝව පළ කිරීමට තීරණය කළේ මීළඟට කුමක් කරන්නට දැයි කියා ඉලක්ක රහිත බවක් දැනුණු විටයි ඔහුගේ චැනලය එක රැයෙන් උද්වේගයක් බවට පත්වූයේ එය ඒ වර්ගයේ ලංකාවේ පළමු චැනලය වූ නිසා වෙන්නට ඇති. ඔහුගේ එම චැනලය අර්ධ නමුත් ස්ථාවර ආදායම් මාර්ගයක් කරගැනීමට සමත්වීය.

හිරාන්ට අවශ්‍යවන්නේ ඔහුගේ වීඩියෝ නිපැයුම් ප්‍රධානධාරාවට ගෙනගොස් පූර්ණකාලීනව ඒ හා කටයුතු කරමින් වෙළඳ සන්නාම ප්‍රවර්ධනය තුළින් වැඩි ආදායමක් ලබා වරප්‍රසාද වෙත පිවිසීමටයි. කෙසේවෙතත් ඔහුට හැඟී ඇත්තේ විෂමසම්මත ප්‍රකාශන හෝ රංගන සිදුකරන අයට මෙන් නොව ඔහු වැනි අයට අවස්ථා ලබා ගැනීම පහසු නොවන බවයි. ඔහු කීවේ "සාරියක් ඇඳගත්තු පිරිමියෙක්" යනු ශ්‍රී ලංකාවේ බොහොමයක් සන්නාමවලට දිරවීමට පහසු රූපයක් නොවන බවයි. ඔහුගේ අන්තර්ජාල සාර්ථකත්වය සිනමාවට එක්වීමේ ආශාව දැනට වෙනතක හරවා තිබෙන අතර ඔහු තවමත් සිටින්නේ බලාපොරොත්තු සහගතවයි ශ්‍රී ලංකාවේ වර්තමාන යූටියුබ් සැකැස්මේ ඔහුට ම සුදුසු ස්ථානයක් ඔහු සතුව ඇති බව ඔහුට හැඟේ.



ආත්ම ප්‍රකාශනය සඳහා අන්තර්ජාලය ලබා දී ඇති අවකාශය ආර්යාට එක්තරා ධනාත්මක පිළිගැනීමක් ලබා දී ඇති අතර එ තුළින් විදේශ රටවල පුහුණු වැඩසටහන්වලට සහභාගීවීමට, කණ්ඩායම් වශයෙන් කථා කිරීමට අවස්ථාව ලැබීමෙන් ඇය වැඩිදුර දැනුමක් ලබා ඇත. අන්තර්ජාල වේදිකා ලබාදෙන අවකාශය තිබියදීත්, හැකි සෑම විටම ඇය මුහුණට මුහුණලා කටයුතු කිරීමට කැමැත්තක් දක්වයි -

*"මං එහෙම අවකාශවල වැඩියෙන් ප්‍රකාශන කරන්නේ එතකොට මට එයාලගේ මුහුණු කියවන්න පුළුවන් නිසයි. එයාලට තේරුණා ද, ප්‍රශ්න ඇතිවුණා ද කියල මට එතකොට නිසැකයෙන් ම දැනගන්න පුළුවන්. ඒ නිසයි මට මුහුණට මුහුණ හමුවක දී මාව වැඩියෙන් ම ප්‍රකාශ කරගන්න පුළුවන්".*

ලිංගික ශ්‍රමය වෙත ද අන්තර්ජාලයෙන් ප්‍රබල බලපෑමක් ඇති වී තිබේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා හා සම්මුඛ සාකච්ඡාවලදී අප හා කතා කළ ලිංගික ශ්‍රමිකයන් එකඟ වූයේ මූලික ස්මාර්ට් ජංගම දුරකතනයක් ලබාගෙන වෙබ්අඩවි, වට්ස්ඇප්, වයිබර් යනාදිය භාවිත කිරීමට ඉගෙනගත් අයට, අන්තර්ජාලය බොහෝ දුරට මුහුණට මුහුණ ගනුදෙනු කතා කිරීමට ආදේශයක් වී ඇති බවයි. ශ්‍රී ලංකාව තුළ ලිංගික ශ්‍රමය පැහැදිලිවම සාපරාධී කියා පවසා නැතත්, ප්‍රසිද්ධියේ ලිංගික ගනුදෙනු කිරීම හා ගණිකානිවාස පවත්වාගෙන යාම නීතිමය වරදකි (Lanka Standard, 2012). ඔවුන්ගේ අනන්‍යතා සාපරාධීකරණය හේතුවෙන් LGBTQ+ ලිංගික ශ්‍රමිකයන් තවදුරටත් වෙනස් කොට සැලකීම්වලට ලක් වේ. මෙම නීති මගහරිමින් ලිංගික ශ්‍රමයෙන් ජීවිකාව

උපයා ගැනීමට අන්තර්ජාලය උපකාරී වන ක්‍රම කිහිපයක් ගැන ලිංගික ශ්‍රමිකයෝ මෙනෙහි කළහ. කාන්තා ලිංගික ශ්‍රමිකයන් (සංක්‍රාන්තිනොවන සහ සංක්‍රාන්ති) පැවසූයේ සේවාදායකයන්ට සෘජුව ම සම්බන්ධ විය හැකි ජංගම දුරකථනයක් තිබීම හා එ තුළින්  ඔවුන්ට සාමාන්‍ය සේවාදායකයින් සමග සබඳතා පවත්වා ගත හැකිවීම හේතුවෙන් සේවාදායකයන් හා ප්‍රසිද්ධියේ ගනුදෙනුකිරීමේ අවශ්‍යතාව අඩු වී ඇති බවයි. ස්මාර්ට් ෆෝන්වල පණිවුඩහුවමාරු ඇප් ඔස්සේ මුහුණට මුහුණ පෙනී සිටීමේ අවදානමකින් තොරව සේවාදායකයන් හා අනාගත සේවාදායකයන් සමග ඡායාරූප මෙන් ම වීඩියෝ ද හුවමාරු කරගත හැකිය. අන්තර්ජාලය මගින් සන්නිවේදනය (ලිංගික ශ්‍රමය හා වෙනත් දේ) කිරීමෙන් ඇතිවන ඩිජිටල් මග සලකුණු පිළිබඳව තරමක් දුරට අවබෝධයක් තිබුණත්, ලිංගික ශ්‍රමිකයන් තවමත් අන්තර්ජාලයෙන් ඇතිවන වාසි තකයි මේ අතර තමන්ගේ ජීවනෝපාය පවත්වාගැනීමේ දී වැඩෙන ස්වාධීනත්වය ඉන් ඇතිවන අවදානමට වඩා වැදගත් ලෙස සැලකේ. ඔවුන්ගේ මතය මෑතකදී තවදුරටත් තක්සේරු වූයේ මහේස්ත්‍රාත්වරයෙකු "සිය ජීවනෝපාය සඳහා ස්වාධීනව ගණිකා වෘත්තියේ යෙදෙන කාන්තාවකට එරෙහිවන කිසිදු නීතියක් යටත්විජිතකාලයේ සිට මේ වනතුරු පැවතී නැත" යැයි පවසා ඉන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් නඩු තීන්දුවක් (Colombo Times, 2020) තුළින් ය.

**ලිංගික ශ්‍රමිකයන් එකග වූයේ මූලික ස්මාර්ට් ජංගම දුරකතනයක් ලබාගෙන වෙබ්අඩවි, වට්ස්ඇප්, වයිබර් යනාදිය භාවිත කිරීමට ඉගෙනගත් අයට, අන්තර්ජාලය බොහෝ දුරට මුහුණට මුහුණ ගනුදෙනු කතා කිරීමට ආදේශයක් වී ඇති බවයි.**

සංක්‍රාන්ති නොවන සමලිංගිකයෙකු වන මෙලනි පැවසූයේ, මීට වසර 10 කට පෙර අන්තර්ජාලයට පිවිසීමෙන් පසු, කෙමෙන් ලිංගික ශ්‍රමිකයකු ලෙස ඔහුගේ කටයුතු අන්තර්ජාලයට මාරුකළ බවත්, දැන් ඔහුගේ සේවාදායකයන් 100% ක්ම ඔහු හා එක්වන්නේ අන්තර්ජාලය ඔස්සේ බවත් ය. ඔහු ක්‍රම කිහිපයකින් අන්තර්ජාල




ගනුදෙනු පවත්වයි. සමීක්ෂණ ප්‍රතිචාරකයන් හා එම වෙබ්අඩවි භාවිතකරන්නන්ගේ රහස්‍යභාවය සුරැකීමට අප මේ වාර්තාවේ සඳහන් නොකරන දේශීය වෙබ්අඩවි කිහිපයක ඔහු සිය වෙළඳ දැන්වීම් පළ කරයි. මාසිකව වෙළඳ දැන්වීමකට ශ්‍රී ලාංකික රුපියල් 500 ක් පමණ (දළ වශයෙන් ඇමරිකානු ඩොලර් 2.75 ක්) වැය වුවත් මෙලනි පැවසූයේ සිය ආදායම මෙම පිරිවැය අවලංගු කර දමන බවයි. ඔහු පැවසූ පරිදි මෙම වෙබ්අඩවි තුළින් ම සිය අනාගත ගනුදෙනුකරුවන් සොයාගන්නේ ඔවුන්ගේ දැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීමෙන් වන අතර, එක් එක් අඩවියේ සිටින සේවාදයකයන්ගේ වයස, පංතිය පිළිබඳ නිරීක්ෂණ ද ඔහු අප හමුවේ තැබුවේ ය. ෆේස්බුක්හි පෙනිසිටීම තුළින් ද සේවාදායකයන් සොයාගන්නා මෙලනිගේ පැරණි ෆේස්බුක් ගිණුම (රජය හා වේදිකා මගින් නියාමනය. නම් වූ කොටසේ සඳහන් කළ ඇති පරිදි, එය ෆේස්බුක්හි සැබෑ නාම ප්‍රතිපත්තිය නිසා අත්හිටුවන ලදි) තුළ සිටි 4000ක් පමණ වූ මිතුරන් ඔස්සේ ඔහුට විශාල ජාලයකට පිවිසිය හැකි විය. වෙබ්අඩවිවලට අමතරව ඔහු පණිවුඩහුවමාරු ඇප් භාවිත කරන්නේ සේවාදායකයින් හා ඡායාරූප හුවමාරුවට හා සම්බන්ධ වීමටයි.

එබැවින්, මින් පෙනීයන්නේ වෙනත් අන්තර්ජාල පරිශීලකයන් මෙන්ම, LGBTQ+ පුද්ගලයින්ද ඔවුන්ගේ ජීවනෝපාය සඳහා මෙවලමක් හා/හෝ අවකාශයක් ලෙස අන්තර්ජාලය භාවිත කරන බවත් ඔවුන්ගේ සමාජභාව හා ලිංගිකත්වයට විශේෂිත වූ අභියෝග හා අවස්ථාවන් ඉන් ඇතිවන බවත් ය. කෙසේ වෙතත්, අන්තර්ජාලය මත පදනම් වූ දිවිපැවැත්මක් පවත්වා ගැනීම එක්තරා දුරකට අඩමාන ය- විශේෂයෙන් ම එයට හේතුවූයේ සහභාගීවූවන් භාවිත කළ වේදිකා අයත්වන්නේ, ක්‍රියාත්මකවන්නේ, පාලනය කරන්නේ තුන්වැනි පාර්ශවයක් මගින් වන අතර ම මින් සමහරක් වේදිකා

**එබැවින්, මින් පෙනීයන්නේ වෙනත් අන්තර්ජාල පරිශීලකයන් මෙන්ම, LGBTQ+ පුද්ගලයින්ද ඔවුන්ගේ ජීවනෝපාය සඳහා මෙවලමක් හා/හෝ අවකාශයක් ලෙස අන්තර්ජාලය භාවිත කරන බවත් ඔවුන්ගේ සමාජභාව හා ලිංගිකත්වයට විශේෂිත වූ අභියෝග හා අවස්ථාවන් ඉන් ඇතිවන බවත් ය.**

සිතාමතා හෝ නොමැතිව LGBTQ+ පුද්ගලයින්හට වෙනස් ලෙස සලකන ප්‍රතිපත්ති ද සහිතවන නිසාය.




# ප්‍රජාව සොයාගැනීම හා ජීවනෝපාය

## අන්තර්ගතය: පරිභෝජකයන් හා නිෂ්පාදකයන්

අන්තර්ජාල භාවිතයේ ස්ත්‍රීවාදී මූලධර්මයන්ට (Feminist Principles of the Internet) අනුව, "කේත කිරීමට, සැලසුම් කිරීමට, අනුවර්තනය වීමට හා විචාරාත්මකව හා තිරසාර ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීමට, නිර්මාණශීලිත්වය හා ප්‍රකාශනය සඳහා වූ වේදිකාවක් ලෙස තාක්ෂණයට නැවත හිමිකම් කීමට මෙන් ම, සියලු ම අවකාශයන්වල ලිංගවාදී හා වෙනස් කොට සැලකීමේ සංස්කෘතීන්ට අභියෝග කිරීමට ද කාන්තාවන්ට හා අතික්‍රාන්ත පුද්ගලයන්ට අයිතියක් ඇත." අප පරිභෝජනය කරන ප්‍රමාණයට ම අන්තර්ගතය නිපැයීමේ අයිතියක් තිබුණ ද, ශ්‍රී ලංකාවේ LGBTQ+ පුද්ගලයන් ඉදිරිපත් කළේ මෙම අයිතිය සැබැවින් ම ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ට මුහුණදීමට සිදුවූ අත්දැකීම් ය.


ප්‍රතිචාරකයන්ගෙන් බහුතරයක් (82%) තමන් දිනපතා අන්තර්ජාලයේ පරිභෝජකයන් ලෙස දුටුව ද ඉන් බොහෝ දෙනෙක් තමන් දිනපතා ම (30%) අන්තර්ගත නිෂ්පාදකයන් ලෙස සලකන්නේ නැත. මෙ මගින් ඔවුන් තොරතුරු පරිභෝජනය කරන්නේ අක්‍රීයව ද එසේ නම් එයට හේතුව කුමක් ද මෙන්ම, ඔවුන් අන්තර්ගත නිෂ්පාදනය හෝ නිර්මාණය කිරීම දකින්නේ හා වටහාගන්නේ කෙසේද යන්න පිළිබඳව ද ගැටලු මතු විය. සම්මුඛ සාකච්ඡා අතරතුර දී ප්‍රතිචාරකයන් මේ පිළිබඳව මෙනෙහි කළහ. තමා අන්තර්ගත නිෂ්පාදකයෙක් ලෙස සලකන අය මේ ආකාරයෙන් සිතුවේ තමන්ගේ ම කලාකෘති නිපැයූ නිසා, ඒවාට සමාජීය වටිනාකමක් තිබූ නිසා මෙන් ම සමාජයේ සුවසෙත උදෙසා ඒවා නිපැයූ බැවිනි.

**නිපැයුම් පරිභෝජකයෙකු ලෙස ඔබ කොපමණ අන්තර්ජාලය භාවිත කරනවාද?**




*රූපසටහන 29: නිපැයුම් පරිභෝජකයෙකු ලෙස ඔබ කොපමණ අන්තර්ජාලය භාවිත කරනවාද?*

**නිපැයුම් නිෂ්පාදකයකු ලෙස ඔබ කොපමණ අන්තර්ජාලය භාවිත කරනවාද?**




*රූපසටහන 30: නිපැයුම් නිෂ්පාදකයකු ලෙස ඔබ කොපමණ අන්තර්ජාලය භාවිත කරනවාද?*




හිරාන් නම් වූ යූටියුබ් තරුව පැහැදිලිව ම අන්තර්ගත නිර්මාණකරුවෙකි. හිරාන් සිය යූටියුබ් චැනලයේ පළ කළ පළමු වීඩියෝව විදුලිවේගයෙන් පැතිරී ගිය අතර ඔහු එයට හේතුව ලෙස දකින්නේ එය ලංකාවේ මේ ආකාරයේ විඩියෝවක් සෑදූ පළමු අවස්ථාව විය හැකි බැවිනි. විරුද්ධලිංගිකයන් ලෙස ඇඳපැළඳගැනීම් හා රංගනයේ යෙදෙන විවෘත සමලිංගිකයෙකු ලෙස හිරාන් ලිලී සිං විසින් නිෂ්පාදනය කරන ලද විඩියෝවලින් පෙළඹී ඇති අතර, ඔහු සිහිකළේ ශ්‍රී ලංකාවේ එවකට වඩාත් ම ජනප්‍රිය යූටියුබ් තරු වූයේ ජෙහාන්ආර් සහ ගප්පියා වැනි සංක්‍රාන්ති නොවන විෂමලිංගික පුරුෂයන් බවයි. ඔහුගේ පළමු වීඩියෝව සෑදීම ගැන මතක්කරන අතර ඔහු කියා සිටියේ එය එතරම් සැලසුම් නොකළ බවත්, ඒ අවස්ථාවේ ඔහුට හැඟුණු ආකාරය අනුව කළ බවත්ය; ඔහුට "කිසිවක් නොකිරීම නතර කර, යමක් ඕනෙ ම දෙයක් හදන්නට" ඕනෑ විය. ඔහු සිය ලැප්ටොප් වෙබ් කැමරාව භාවිතයෙන් එම වීඩියෝව නිපදවා ඇති අතර එය අදවන විටත් ඔහුගේ ජනප්‍රිය ම වීඩියෝවක් ලෙස පවතී.



ආර්යාට අනුව අන්තර්ජාලයේ හොඳම කොටසවන්නේ සෙවුම් අඩවියි, ඒ ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරක් සොයාගැනීමට, ඔබට නව හැකියා ඉගෙනගැනීමට ද හැකි බැවිනි.

*"මීට කලින් මං වැටි කරන්නවත් දැනං හිටියේ නැහැ. ඊත් පස්සේ මං ඉන්ටර්නෙට් එකේ තනියෙන් ම ඉගෙනගත්තා. ඒ වගේ ඉන්ටර්නෙට් එකෙන් තනියම ඉගෙනගන්න පුළුවන් දේවල් ඕනේ තරම් තියෙනවා. අනිත් එක ගූගල් මැප්ස්! මට කොහේහරි යන්න ඕනෙ නම්, මං ඇප් එක දැම්මොත් මට දන්නේ නැති තැනකට වුණත් ලේසියෙන් යන්න පුළුවන්"*

**සමාජයේ අසම්මත/තහනම් යැයි සැලකෙන දේ ගැන මට අන්තර්ජාලයේ තොරතුරු සොයාගත හැකියි**




*රූපසටහන 31: සමාජයේ අසම්මත/තහනම් යැයි සැලකෙන දේ ගැන මට අන්තර්ජාලයේ තොරතුරු සොයාගත හැකියි*

රටේ උතුරේ නගරයක දෙමළ භාෂාවෙන් සංක්‍රාන්ති ගැටලු ගැන ලියමින්, අන්තර්ගත නිෂ්පාදන කරන්නියක ලෙස ආර්යා තමාව ම දුටුවාය. දෙමළ භාෂාවෙන් අන්තර්ගත පළ කළ විට, ඇගේ අනුගාමිකයන් සමග ඇති සම්බන්ධය තවත් ඉහළ යන බව ඇය සොයා ගත්තා ය. විශේෂයෙන් ම ඇගේ නගරයේ සිටින සංක්‍රාන්ති සමාජභාවී අය සඳහා ඇප් එකක් නිර්මාණය කිරීමට ඈ කැමැත්ත දක්වයි.

*“මං කැමති සංක්‍රාන්තිසමාජභාවීන්ට ඇප් එකක් හදන්න. මං කැමති ඒක හදනහැටි ඉගෙනගන්න. මට ඒ ගැන කිසිම දැනුමක් නෑ. මේ පැත්තෙන් මාව නවත්තලා තියෙන්නේ ඒ ගැන අහන්න ඕනේ කාගෙන් ද, මට ඉගෙනගන්න පුළුවන් කොහෙන්ද කියලා දන්නේ නැතිකම. ඒ වගේ ම මට ඒ පාඨමාලාවට ගෙවන්න සල්ලි නෑ.”*



විරාන් දිනපතා අන්තර්ජාලයේ අන්තර්ගතයන් පරිභෝජනය කළත් ඒවා නිපදවන්නේ කලාතුරකිනි. ඔවුන්ගේ දෛනික අන්තර්ගත පරිභෝජනයට අයත්වෙන්නේ අන් අය නිපදවන දෙයක් හා සම්බන්ධවීම හා ඉඳහිට ට්වීට් කිරීම ය, එහෙත් කලාකරුවෙකු ලෙස ඔවුන් ඒ කිසිදු අන්තර්ගතයක් නිර්මාණ ලෙස නොසලකයි. ඔවුන් ඉඳහිට නිෂ්පාදනය කරන අන්තර්ගතය වන්නේ ඔවුන් ඉන්ස්ටාග්‍රෑමයේ පළ කරන ඔවුන්ගේ ම සිතුවම් ය. "කලාකරුවෙක්ගේ පැත්තෙන් ගත්ත ම නිර්මාණය කියන්නේ තමන් හදන දෙයක්” යැයි විරාන් පැවසුවේ ය. ඔවුන් අන්තර්ජාලයේ වැඩියෙන් කරන්නට කැමති කුමක් දැයි ඇසූවිටත් ඔවුන් පවසන්නේ සිතුවම් ඇඳීම කියායි. ඔවුන්ට අවශ්‍ය තවත් චිත්‍ර අඳින්න, නව නව තේමා ගවේෂණය කරන්න, නිරන්තරයෙන් ඒවා පළ කරන්න.

**නිර්මාණාත්මක ක්ෂේත්‍රයක පූර්ණකාලීන රැකියාවක් කරන ඔවුන්ගේ කාලයත්, ශක්තියත් වැඩියෙන් ම වැයවෙන්නේ එයටයි.**

"කලාවෙන් මට ඕනෑ තරමේ ආදායමක් ලැබෙන්නේ නෑ, ඒත් ඒ මං හරියට ඒ වෙනුවෙන් කාලයවත්, ශක්තියවත් වැය කරන්නේ නැති නිසයි" අඩ-විහිළුවකින් මෙන් ඔහු පවසන්නේ එය කිරීමෙන් ඔවුන්ව නවතා දමන්නේ ධනවාදය බවයි. මෙය විහිළුවක් නොවේ නිර්මාණාත්මක ක්ෂේත්‍රයක පූර්ණකාලීන රැකියාවක් කරන ඔවුන්ගේ කාලයත්, ශක්තියත් වැඩියෙන් ම වැයවෙන්නේ එයටයි. එවිට ඔවුන්ගේ විවේකයේ දී කලා නිර්මාණ කිරීමට ඔවුන්ට එතරම් උනන්දුවක් ඇති නොවේ. තවත් හේතුවක් වන්නේ ඔවුන් මේ වනවිට චිත්‍රකරණයට උපයෝගී කරගන්නා උපකරණය ජංගම නොවීමයි. එදිනෙදා ගමනාගමනයේ දී සිතුවම්කරණය කිරීමට අයිපෑඩයක් මිලදී ගැනීමට විරාන් මේ දිනවල මුදල් එකතු කරනවා. එම නිසා අන්තර්ජාල භාවිතයේ ස්ත්‍රීවාදී මූලධර්ම විරාන්ට ද බලපෑ යුතුවුවත් උපකරණවල මිල හා කාලය යන ආදිය ඔවුන්ගේ අයිතිවාසිකම භුක්තිවිඳීමෙන් ඔවුන්ව වළක්වාලයි.



විජේ තමාව දකින්නේ අන්තර්ගත නිෂ්පාදකයෙකු ලෙසයි - බ්ලොග් කිරීම, පරිවර්තන කටයුතු කිරීම මෙන් ම අන්තර්ජාලයේ හුවමාරුකරගන්නා සංගීතය හා සාහිත්‍ය නිෂ්පාදනය කිරීම ඒ අතරවෙයි. ඔහු විකිපීඩියා හා නූලහාම් සඳහා ද අන්තර්ගත/නිෂ්පාදන කරයි.

අන්තර්ජාලය භාවිතා කිරීම, ෆේස්බුක්, වෙබ්අඩවි සහ යූටියුබ් භාවිත කරමින් ලිංගිකත්වය හා සමාජභාවය පිළිබඳ කරුණු පැහැදිලි කරගැනීමටලක්ෂ්මිට හැකිවී තිබේ. ඈ ඉගෙනගත් දේ පදනම් කර ගෙන දෙමළ භාෂාවෙන් යම්කිසි අන්තර්ගතයක් ද නිෂ්පාදනය කර තිබේ. ඇය තමාව අන්තර්ගත නිෂ්පාදකයෙකු ලෙස දකින අතර ඇගේ නිපැයුම් ලෙස ඈ ෆේස්බුක්



වැනි වේදිකාවල පළ කරන, සමාජයේ වෙනස්කොට සැලකීම හා තාඩනපීඩන පිළිබඳව ඈ ලියූ පෝස්ට් සලකයි. බොහෝවිට ඇය පළකරන සොබාදහමේ හා තමාගේ ම පින්තූර ද- ඈ දකින්නේ අන්තර්ගත ලෙසයි.



ක්‍රිෂානි පැවසුවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව අන්තර්ජාලය ඔස්සේ බොහෝ දේ ඉගෙනගෙන ඇති බවත්, LGBTQ+ ප්‍රජාව ගැන තවත් බොහෝ දේ ඉගෙනගැනීමට ද අන්තර්ජාලය ඇයට උපකාර වී ඇති බවත්ය. ඇය අන්තර්ගත නිෂ්පාදකයෙකු ලෙස තමන්ව නොදකියි, ෆේස්බුක් වැනි වේදිකාවල ඇය පළකරන දේ ද අන්තර්ගත ලෙස නොසලකයි. ඇයට අනුව, නිෂ්පාදකයන් යනු වීඩියෝ නිපදවන, බ්ලොග් ලියන මාධ්‍යය ආයතනවලට නොව පෞද්ගලිකව හා වෘත්තීයමය වශයෙන් යම් යම් දේ තමා වෙනුවෙන් ම නිපදවන ඉන්ස්ටාග්‍රෑම් ඉන්ෆ්ලුවන්සර්ස්ලා වැනි අයටයි.

"මං හිතන්නේ අන්තර්ගත නිෂ්පාදකයෙකු කියන්නේ වීඩියෝ හදන, බ්ලොග් තියෙන හෝ පෞද්ගලිකව හෝ වෘත්තීයක් විදියට ඒක එයාලගේ රැකියාව කරගත්තු ඉන්ස්ටග්‍රෑම් ඉන්ෆ්ලුවන්සර්ස්ලා වගේ අයට, ඒත් ඒක එයාලගෙ ම දෙයක්, මාධ්‍යය ආයතනයක් වෙනුවෙන් කරන දෙයක් නෙමේ"

අන්තර්ගත නිෂ්පාදනයට තමා ලබාදෙන නිර්වචනය පිළිබඳව සාරාට ද සිතුවිලි තිබිණි. ඇය නිතරම් ට්විටර් හි ට්‍රෙන්ඩ්ස් සාදනමුත් ඒවා අන්තර්ගත ලෙස සලකන්නට පුළුවන් දැයි නොදනියි.



"අන්තර්ගත කියන්නේ අනෙක් අයට බලන්න නිපදවන දෙයක්. මොකක් හරි නියැලීමක් ඇති කරන්න තමයි

අන්තර්ගත හදන්නේ. මට එහෙම අවධානයක් ඕනේ නෑ". එබැවින් මෙම නිර්වචනයේ දී, සාරා තමා අන්තර්ගත නිෂ්පාදකයෙකු ලෙස නොදකින්නේ ඇගේ ත්‍රෙඩ්ස් බොහෝ වෙලාවට ඇයට යම් දෙයක් පිට කිරීමට ක්‍රමයක් හෝ ඇගේ සිතිවිලි ධාරාවක් ලෙස ප්‍රකාශවන බැවිනි. කෙසේවෙතත්, ඈ පවසන්නේ අන් අය ඈව අන්තර්ගත නිෂ්පාදිකාවක් ලෙස දකින බවයි. ඈ ඉන්ස්ටාග්‍රෑම්හි ඇගේ බළලුන්ගේ පින්තූර පළකළත්, ඒවා ඈ ගත් ඡායාරූප වුවත, ඒවායේ යොදන විස්තරය ද ඈ ලියූවක් වුවත් ඒවාට අන්තර්ගත කියා කියන්නට පුළුවනි ද යන්න ඈට ගැටලුවකි.

අන්තර්ගත නිෂ්පාදකයෙකු ලෙස හඳුනාගැනීමට සාරාගේ ඇති පැකිලීම, අන්තර්ගත නිෂ්පාදනය යනු ඉන්ස්ටාග්‍රෑම් ඉන්ෆ්ලුවන්සර්ස් නිෂ්පාදනය කරන යම්කිසි වටිනාකමක් හෝ සමාජීය අගයක් සහිත එකක් වූ බව සලකන ක්‍රිෂානිගේ නිර්වචනය හා අනුනාද වෙයි.



හසිනි ද තමා නිෂ්පාදකයකු යැයි නොසලකන අතර ඈට අනුව නිෂ්පාදකයකු යනු තමන්ගේ ම ලියවිල්ලක්, බ්ලොග් එකක් හෝ තමාගේ ම දෙයක් පළකරන අයයි. සිත්ගන්නාසුලු ලිපියක් බෙදා ගැනීම අන්තර්ගත නිෂ්පාදනයක් නොවේ, එහෙත් එම ලිපිය පිළිබඳව මතයක් බෙදාගැනීම නිෂ්පාදනයක් වේ.




අන්තර්ජාලය තුළින් සමාජභාවය හා ලිංගිකත්වය සම්බන්ධ තේමා පිළිබඳව දිව්‍යාට පැහැදිලිකිරීමක් ලැබුණි ඒ ලැබුණු දැනුම, ඒ ගැන කතා කරන්නට අය නොමැති වූ නිසා පහසුවෙන් වෙනත් කිසිදු ආකාරයකට ලබාගන්නට හැකි වූ දැනුමක් නොවේ කෙසේවෙතත්, මූලිකව ම දෙමළ භාෂාවෙන් උගනිමින්, දෙමළ භාෂාව කතා කරන පවුලක හැදී වැඩුණු ඇය තරුණ වියේ දී මුහුණදුන් අභියෝගයක් වූයේ ඇය සොයාගත් තොරතුරු බොහොමයක් ඉංග්‍රීසි බසින් තිබීම මෙන් ම ඒවායේ වූ පාරිභාෂික යෙදුම් තේරුම්ගැනීමේ දී ඇතිවූ අභියෝගයන් ය. දෙමළ භාෂාවෙන් ඇති තොරතුරු අදටත් සීමිත වුවත් ඉංග්‍රීසි ඉගෙනගත් ඇයට මේවාට, පෙරට වඩා හොඳින් පිවිසීමට හැකි බව ඇය පැවසුවා ය. ඇය තමාව නිෂ්පාදකයෙකු ලෙස සලකයි - නිෂ්පාදනය යනු ඕනෑම ආකෘතියකින් තමන්ගේ ම දෙයක් බිහිකිරීමයි. ඈ ලියන්නට ඇරඹුයේ අන්තර්ජාල වේදිකා හා බ්ලොග්වලට නිරාවරණය වීමෙන් පසු බැවින්, ඈ කැමැත්තක් දක්වන්නේ මුහුණට මුහුණ හමු වී අදහස් දක්වනවාට වඩා අන්තර්ජාලයේ ඒවා ලබාදීමටයි.



ඈ පැවසුවේ අන්තර්ජාලයේ ප්‍රකාශ කිරීම මගින් ඈට හැඟුණේ ඇය ලියූ දේ සටහන්පොතක් හෝ වර්ඩ් ලේඛනයකට සීමා නොවී "පිටත-පවතින" බවයි.

සෙල්වි පවසන්නේ ඇය අන්තර්ගත නිෂ්පාදකයෙක් ද යන්න පිළිබඳව සැබවින් ම නොසිතූ බවයි. ඇය විවිධ දේවල් සහ ඇගේ ම ඡායාරූප අඩංගු පෝස්ට් බෙදාගත්ත ද, ඒවා ඇගේ ම අන්තර්ගත ලෙස නොසිතයි.

මෙම සාකච්ඡාවලින් පැහැදිලිවන්නේ ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය භාවිත කරන LGBTQ+ පුද්ගලයින් අන්තර්ගතය නිර්මාණය කිරීමේදී ඔවුන්ගේ කාරකත්වය තරමක් දුරට භාවිත කළ ද, එම ක්‍රියාකාරකම් නිෂ්පාදන හෝ අන්තර්ගත නිර්මාණ කිරීම් ලෙස හඳුනාගැනීමට හෝ පිළිගැනීමට ඔවුන් විරෝධයක් දක්වන බවයි. කෙසේවෙතත් සෑම ක්ලික් කිරීමකින් ම, ස්ක්‍රෝල් කිරීමකින් ම තොරතුරු නිෂ්පාදනයවන, අප ගැන විදසුන් ඇතිවන, එම වේදිකාවට ම ඉපැයීම් ලැබෙන වේදිකා ආර්ථිකයක, තමාගේ අන්තර්ජාල භාවිතයේ අරුත හා එහි ප්‍රතිඵල විචාරාත්මකව ඇගැයීමේ හැකියාව වර්ධනය කිරීම වැදගත් වේ.



# පිවිසියහැකිබව හා නියාමනය

## පිවිසියහැකිබව


ජනගහණයෙන් 40% ක් පමණක් දැනට ඩිජිටල් සාක්ෂරතාව ඇති අය ලෙස සැලකෙන බැවින් ශ්‍රී ලංකාවේ අන්තර්ජාලයට පිවිසියහැකිභාවය පවතින්නේ අඩු අගයකයි (ගල්පාය සහ පිරිස 2019) 2017 සිට ජනගහණයෙන් අන්තර්ජාලය භාවිත කරන්නේ ද 34% පමණි (International Telecommunication Union, 2017) පිවිසියහැකිබව සාකච්ඡා කිරීමට ඇති පුළුල් මාතෘකාවකි ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය එය භාවිත කරන LGBTQ+ ජනතාවට බලපාන අයුරු පහත දැක්වෙන අංශ ඔස්සේ අප සාකච්ඡා කර ඇත:

- උපකරණ පාලනය, අන්තර්ජාලයට පිවිසියහැකිබව හා ක්‍රම
- උපකරණ හා අන්තර්ජාල සබඳතාවලට අවශ්‍ය පිරිවැය
- රජය හා වේදිකා මගින් නියාමනය
- භාෂාව (භාෂාව හා පාරිභාෂික පද මාලාව යන කොටසේ සාකච්ඡා කෙරේ)

## පාලනය

ප්‍රතිචාරකයන්ගෙන් 88% අන්තර්ජාලයට පිවිසීමට ප්‍රධාන උපකරණය ලෙස භාවිත කරන්නේ ජංගම දුරකථනයය, ඉතා කුඩා ප්‍රතිශතයක් මූලික උපකරණය ලෙස ලැප්ටොප් භාවිත කරයි. මෙම සමීක්ෂණයේ සොයාගැනීම තවත් දුරටත් තහවුරු කරමින් පර්යේෂණ පෙන්වන්නේ ලංකාවේ අන්තර්ජාල භාවිතයේ ධාවකයා ස්මාර්ට් ෆෝන් බවයි (ගල්පාය සහ පිරිස, 2019).

**ඔබ නිතර අන්තර්ජාලයට පිවිසීමට භාවිත කරන උපකරණය කුමක්ද ?**




| | |
|---|---|
| ජංගම දුරකථනය | 88.1% |
| ලැප්ටොප් පරිගණකය | 8.9% |
| ටැබ් එකක් | 1.0% |
| ඩෙස්ක්ටොප් පරිගණයක් | 1.0% |
| වෙනත් | 1.0% |

*රූපසටහන 32: ඔබ නිතර අන්තර්ජාලයට පිවිසීමට භාවිත කරන උපකරණය කුමක්ද?*

සමීක්ෂණ පරිපාලක අතින් සිදු වූ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් දමිළ භාෂාවෙන් සිදුකෙරුණු සමීක්ෂණයේ මෙම ප්‍රශ්නය ඉවත් කර වෙනත් ප්‍රශ්නයක් දෙවරක් ඇසීම හේතුවෙන් එයට ප්‍රතිචාරකයන් 30ක් පමණ පිළිතුරු දී නොතිබිණි. එම නිසා, 60% වැඩි පිරිසක් ඔවුන් අන්තර්ජාලයට පිවිසීමට භාවිත

**ඔබ අන්තර්ජාලයට පිවිසීමට භාවිත කරන මූලික උපකරණය කෙතරම් දුරට පාලනය කිරීමට ඔබට හැකිද?**

- සම්පූර්ණයෙන් ම 62.7%
- පිළිතුරු නැත 30.4%
- තරමක් දුරට 6.9%



රූපසටහන 33: ඔබ අන්තර්ජාලයට පිවිසීමට භාවිත කරන මූලික උපකරණය කෙතරම් දුරට පාලනය කිරීමට ඔබට හැකිද ?

කරන මූලික උපකරණයේ පාලනය ඔවුන් සතු බව පැවසුවත් ඉන් රටාවක් හඳුනාගැනීමට අපහසු විය. අවම වශයෙන්, ඉහත සොයාගැනීම එක් කොට සැලකූ විට පෙන්වාදෙන්නේ බොහොමයක් ප්‍රතිචාරකයන්ට තමන්ගේ ම ජංගම දුරකථනයක් තිබූ බවත් එහි පාලනය ඔවුන්ට ම හිමි වූ බවත් ය.

සංක්‍රාන්තිලිංගික කාන්තාවක් වීම හේතුවෙන් ආර්යාගේ අන්තර්ජාල පිවිසුම කලකට පෙර ඇගේ දෙමාපියන් විසින්, පාසල විසින් මෙන් ම සමාජ මාධ්‍ය පිටු අධීක්ෂණය කළ ඇගේ පවුල හැඳින සිටි අය විසින් පාලනය කළ අතර දැන් එය ඇගේ පෙම්වතා විසින් ද පාලනය වෙයි. ඇගේ යොවුන් කාලයේ දෙමාපියන් ඇගේ දුරකථනය



ඔවුන් ළඟ තබාගත් නිසා ඇයට කලක් යනතුරු සමාජ මාධ්‍යයට පිවිසීමට නොහැකි විය. දැන් ඈ පළ කරන දේ පාලනය කිරීමට ඈට බොහෝදුරට හැකිවුවත් ඇගේ පෙම්වතා ඇගේ මුරපදය දනියි.

මෙම පාලිත පිවිසුම හේතුවෙන් ඇගේ භාවිතය ද සීමා වී ඇත - පළවන පෝස්ට් කිහිපය ය ද මාධ්‍ය ඇතුළු පිරිසගේ නිරන්තර සෘනාත්මක අවරගැස්මකට භාජනය වේ එහි එක්තරා ස්වයං වාරණයක් ද ඇත.

> *"අපි අපේ පිටුවේ දාන්නේ මොනවද කියලා අපි නිතර සැලකිලිමත් වෙනවා. කිසි ම නිදහසක් නෑ. ඉතින් අපි තොරතුරු බෙදාගන්නේ සීමිත කණ්ඩායමක් ඇතුළේ විතරයි. ප්‍රසිද්ධියේ නෙමෙයි. මට මගෙ ම පින්තූරයක් ඕනේ විදියට දාන්නවත් නිදහසක් නෑ".*

ඇගේ පින්තූරය බාගත කරගෙන ව්‍යාජ ප්‍රොෆයිල් එකක් භාවිත කරමින් හානිකර දේ පළකර 'ප්‍රජාව තුළ (ඇගේ) ප්‍රතිරූපයට හානිකළ' අනන්‍යතා සොරකමක් පිළිබඳව ද ආර්යා අප සමග පැවසුවා ය.





විජේ හා ලක්ෂ්මී යන දෙදෙනාට හැඟුණේ ඔවුන්ගේ අනන්‍යතා හෝ ඔවුන් උපකරණ හේතුවෙන් ඔවුන්ගේ අන්තර්ජාල පිවිසුමට එතරම් බලපෑමක් ඇති නොවූ බවයි. එහෙත් ලක්ෂ්මී කියා සිටියේ අන්තර්ජාල අවකාශය භාවිතයට ඇගේ අනන්‍යතාව බලපාන බවයි.

සෙල්වි පැවසුවේ ඇය භාවිත කරන ඇප් සියල්ල ඇගේ දත්ත තබාගත් නිසාත්, ආරක්ෂාවක් එහෙමට ම නොමැති නිසාත් ඈට හැඟුණේ ඇගේ උපකරණයේ පාලනය කිරීමේ හැකියාව ඈට අහිමි බවයි. මෙම ඇප්ස්වලින්



**ඇගේ යොවුන් කාලයේ දෙමාපියන් ඇගේ දුරකථනය ඔවුන් ළඟ තබාගත් නිසා ඇයට කලක් යනතුරු සමාජ මාධ්‍යයට පිවිසීමට නොහැකි විය. දැන් ඈ පළ කරන දේ පාලනය කිරීමට ඈට බොහෝදුරට හැකිවුවත් ඇගේ පෙම්වතා ඇගේ මුරපදය දනියි.**



දමන නීති හා කොන්දේසි ඇගේ පාලනය බොහෝ දුරට සීමා කළත් ඈ තවමත් එම වේදිකා භාවිත කරයි. ඈ පවසන්නේ මේ ගැන ඇගේ ප්‍රසාදයක් නැති බවත් ඒ නිසා ම පෞද්ගලික දත්ත අපහරණය නොවන වෙනත් විකල්ප ද තිබිය යුතු බවත් ය.

## පිරිවැය

ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා අතරතුරදී, සහභාගීවූවන් ඔවුන්ගේ අන්තර්ජාල පිවිසුමට පවතින විශාල බාධකයක් ලෙස මතු කළේ උපකරණ හා අන්තර්ජාල සබඳතා සඳහා වැයවන පිරිවැයයි. මෙය තවදුරටත් තහවුරුවන්නේ ජනගහණයෙන් 60%කට ජී.බී 1ක අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට ප්‍රමාණවත් මුදල් නොමැති බව දක්වන පර්යේෂණයකිනි (ගල්පාය සහ පිරිස, 2019) සහභාගීවූවන් පැවසුවේ ඔවුන් බොහෝ දෙනා පෙරගෙවුම් දුරකථන සබඳතා භාවිත කරන බවත්, ඩේටා ඉවර වූ විට රීචාර්ජ් එකක් මිළ දී ගැනීමට මුදල් නොමැතිනම් ඔවුන්ගේ පිවිසුම වයිෆයි තිබෙන ඔවුන්ගේ කාර්යාලය වැනි ස්ථානවලට සීමාවන බවත් ය. බොහෝ දෙනෙකු වීඩියෝ පරිභෝජනය කිරීම වැනි තෘප්තිය දනවන ක්‍රියා වෙනුවෙන් අන්තර්ජාලය භාවිත කළ ද, එය ඔවුන්ගේ අන්තර්ජාල භාවිත පරිමාව සීඝ්‍රයෙන් නිම කර දමන බව හොඳින් දන්නා කරුණකි. මෙලෙනිගේ අත්දැකීම ද මෙවැනි ය. "මං පාවිච්චි කරන්නේ ඩේටා කාඩ්􀀀 ඒවා පාවිච්චියේ දී නිතර ම සල්ලි ප්‍රශ්න ඇතිවෙනවා", යි කියූ ඔහු කීවේ ඔහුගේ අන්තර්ජාල පිවිසුම තීරණයවන්නේ ඔහුට රීලෝඩ් දැමීමට මුදල් තිබෙනවා ද, ඔහුහට උදව්වීමට මිතුරෙකුට හැකි ද යන කරුණු මත බවයි.

> **මුදල් නොමැතිනම් ඔවුන්ගේ පිවිසුම වයිෆයි තිබෙන ඔවුන්ගේ කාර්යාලය වැනි ස්ථානවලට සීමා**



2012 ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ 4G ජංගම අන්තර්ජාලය හඳුන්වාදුන් ප්‍රථම රට ලෙස නම් වුවත් පුවත්පත් වාර්තා පෙන්වා දෙන්නේ රට වටා 4G ආවරණය වැඩිවුවත් 4G ග්‍රාහක කාවැදීම තවමත් 2020 පළමු කාර්තුවේ දී 14.66% ලෙස පැවතුණු බවත් එය 2025 වනවිට 33.1% වේ යැයි අපේක්ෂා කරන බවත් ය. (Daily News, 2020). මෙම අඩු අගයන්ට හේතු ලෙස දැක්වෙන්නේ සබඳතා හා උපකරණ මිලදී ගැනීමට වත්කමක් නොමැති බවයි. ඒ අතරතුර රජයත්, පෞද්ගලික අංශයත් රට වෙනුවෙන් 5G යටිතල පහසුකම් වෙනුවෙන් ආයෝජනය අරඹා ඇත (Sunday Observer, 2020). මෙම පිරිවැය වටා වූ අභියෝගවලට විසඳුම් සොයා නොදුනහොත් එය ජනතාවගේ අන්තර්ජාල භාවිතය හා පිවිසුම ආශ්‍රිත විෂමතා තව තවත් අධික කරනු ඇත.

## රජය හා වේදිකා තුළින් සිදුවන නියාමනය

මේ වන විට අන්තර්ජාල වසාදැමීම් දකුණු ආසියාව ද ඇතුළු ලෝකය පුරා සාමාන්‍ය සිදුවීම් බවට පත්වී තිබේ (Access Now, 2020) මුළු රටක් හෝ ප්‍රදේශයක් පුරා ඇති සමස්ත අන්තර්ජාල අවහිරතාවයේ සිට

විශේෂිත වෙබ්අඩවි හෝ ඇප්ලිකේෂන් අවහිර කර දැමීම අන්තර්ජාල වසාදැමීමක් ලෙස නිර්වචනය වෙයි. මේ වනවිට  නිරන්තරයෙන් සිදුවන මෙම වසාදැමීම් පවතින කාල පරාසය ද දිගු වී ඇති. 2019 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ මුස්ලිම් විරෝධී කැරලි හේතුවෙන් රට පුරා ඇඳිරි නීතිය පනවා තිබූ අතරතුර අවම වශයෙන් අන්තර්ජාල වසාදැමීම් 3 පමණ (Access Now, 2020) සිදුවිණි. නෙට්බ්ලොක්ස් වාර්තා කර සිටියේ, මෙම වසාදැමීම් අතරතුර ෆේස්බුක්, වට්ස්ඇප්, ඉන්ස්ටාග්‍රෑම්, යූටියුබ්, වයිබර්, ස්නැප්චැට්, ෆේස්බුක් මැසෙන්ජර් හා ට්විටර් ඇතුළු සමාජ මාධ්‍ය වෙබ්අඩවි ගණනාවක් අවහිර කර ඇති බවයි. නෙට් බ්ලොක්ස් ඇස්තමේන්තු කර ඇත්තේ  2018 මාර්තු මාසයේ අන්තර්ජාලය වසාදැමීම හේතුවෙන් ආර්ථිකයට ඇමරිකානු ඩොලර් 30,000,000 පමණ අලාභයක් සිදු වූ බවයි. එවැනි වසාදැමීම්වලට අමතරව, ප්‍රවෘත්ති අඩවි හා බ්ලොග් වැනි විශේෂිත වෙබ්අඩවි, අවහිර කිරීම සහ වාරණය කිරීම ද කාලයක් තිස්සේ සිදුවෙමින් පවතී.

එසේනම්, ඔබ ජීවනෝපාය අන්තර්ජාලය මත යැපෙන අයෙක් නම්, මෙවැනි වසාදැමීම් ඔබගේ මාසික ආදායමටත් බලපෑමට ඉඩකඩ තිබේ. මෙලනි මෙය අත්දුටුවේ 2010 සිට 2015 දක්වා පමණ කාලය තුළ සිය සේවාවන් ප්‍රවර්ධනය කළ ඇතැම් වෙබ්අඩවි රජය විසින් අවහිර කළ විටයි. මෙම අවහිර කිරීමට හේතුවන්නට ඇත්තේ බාලවයස්කරුවන් ද මෙම වෙබ්අඩවිවල ඔවුන්ගේ සේවාවන් ප්‍රවර්ධනය කිරීම බව ඔහු සිතුවත්, එය කෙසේ නමුත් ඔහු වැනි පුද්ගලයින්ට ද බලපා ඇති බවයි. 2015 දී රජය මාරුවීමත් සමග ම මෙම අවහිරය ඉවත් වූවත්, මෑතක දී රජය නැවත මාරුවීමත් සමග ම නැවත මෙම අඩවි වසා දමාවි යැයි ඔහු සිතයි. මෙලනි තවදුරටත් කියා සිටියේ ලිංගික ශ්‍රමිකයන්



ගනුදෙනුකරුවන් සොයා ගැනීමට අන්තර්ජාලය භාවිත කරන බව පොලිසිය සහ නීති ක්‍රියාත්මක කරන්නන් දැන සිටියත් බාලවයස්කාරයන් හා සබැඳි අවස්ථාවල හැර මේ දක්වා ඔවුන්ගේ මැදිහත් වීමක් සිදුවී නැති බවයි.



සෙල්විට අනුව, වත්මන් දේශපාලන තන්ත්‍රයට ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු වූ විට මෙලෙස පිවිසුම් සීමා කළ හැකි වන අතර, එය ඇගේ කාර්යය හා ක්‍රියාකාරිත්වයට ද බලපෑම් ඇති කරනු ඇත. නමුත් මෙතුවක් කල් ඇය අන්තර්ජාලයට පිවිසීමේ දී කිසිදු පෞද්ගලික සීමාකිරීමකටට මුහුණ දී නැත. කොළඹ ජීවත්වන ක්‍රිෂාණි සහ දිව්‍යා ද අන්තර්ජාලයට පිවිසීමේදී කිසිදු පාලනයකට හෝ සීමාකිරීමකට මුහුණ දී නොමැති අතර, දිව්‍යා කුඩා කල සිට ම මෙම නිදහස් පිවිසීම භුක්තිවිඳ ඇත.

සමීක්ෂණ ප්‍රතිචාරවලින් පෙනීගියේ ආත්ම ප්‍රකාශනය සඳහා පරිශීලකයන් ප්‍රිය කළ ෆේස්බුක් හා වට්ස්ඇප් වැනි වේදිකා ඔවුනට වැඩි පාලනයක් ලබා නොදුන් බවයි. බොහෝ ප්‍රතිචාරකයන් භාවිත කළ වේදිකා පරිශීලකයින්ට ස්වයායත්ත පාලනයක් ලබා නොදුන්නේ (විකල්ප පිළිබඳ තොරතුරු නොමැතිකම, විකල්ප වේදිකාවල පරිශීලක ව්‍යාප්තියක් නොමැතිකම, වේදිකා කිහිපයක් භාවිතය උපකරණවල ප්‍රමාණවත් ඉඩක් නොමැතිවීම ආදි හේතු නිසා භාවිතා නොකිරීම වැනි හේතු නිසා) ය. තවත් සැලකියයුතු කාරණයක්වන්නේ බොහොමයක් දෙනා ඔවුන්ගේ උපකරණය පාලනය කිරීමට ඇති හැකියාව යනුවෙන් අදහස් කරන්නේ එම උපකරණ යොදාගෙන භාවිත කරන වේදිකාවල හුවමාරු කරන දත්ත පාලනය කිරීමට ඇති හැකියාව නොවන බවයි.

ලක්ෂ්මි පවසා සිටියේ ඇප් හා අඩවි දත්ත වෙත

එල්ල කළ පාලනය පිළිබඳවයි, ඇයත් එයට අකැමැති බැවින් තොරතුරු බෙදාගන්නා ස්ථාන පිළිබඳව හොඳින් තෝරා බේරා කටයුතු කරයි.




*“මං හිතන්නේ මගේ උපකරණ පාවිච්චියේත්, අන්තර්ජාල පාවිච්චියේත් පාලනය මගේ අතේ. මට ඒවා පාවිච්චි කරන්න ඕනේ නම්, මම කරනවා ‘කවුරුත් ඇඟිලි ගහන්නේ නෑ’ මං පාවිච්චි කරන්නේ මගේ ම උපකරණ විතරයි. ඒ වගේ ම සමහර ඇප් බාගත කරද්දී, බ්‍රවුසර් අරිද්දි අපේ ඊමේල් අනන්‍යතා, දුරකථන අංක එහෙම දෙන්න ඕනේ. ඒත් ඒ වෙද්දි මං ඒවා දෙන්නේ නෑ. මං ඇප් එක වහලා දානවා නැත්තං වෙන එකක් පාවිච්චි කරනවා. මං හිතන්නේ ඒක තමයි පාලනය කියන්නේ කියලා, ඉතින් මං ඒවා පාවිච්චි කරන්නෑ. මම මගේ භාවිතය වෙනත් ඇප් එක්ක කළමණාකරණය කරන්නේ හැම අඩවියට ම මගේ දත්ත නොදී ඉඳලා”*

ෆේස්බුක් හි සැබෑ නාම ප්‍රතිපත්තිය (The Verge, 2018) නිසා තමා මුහුණ දුන් අභියෝග කිහිපයක් මෙලනි අප හා බෙදා ගත්තේය. පෙර සඳහන් කළ පරිදි, ඔහුට ෆේස්බුක් ජාලගත සම්බන්ධතා 4,000 ක් පමණ තිබී ඇත. ඔහුගේ ප්‍රොෆයිල් පින්තූරය සංක්‍රාන්ති නොවන පුරුෂයකුගේ ඡායාරූපයක් වුවත්, ඔහුගේ ප්‍රොෆයිල් නාමය දශක දෙකක් පමණ එදිනෙදා ජීවිතයේ සියලු දෙනා ඔහුව දැන සිටි කාන්තා ඩ්‍රැග් රංගන/කාන්තාවක් මෙන් ඇඳ පැළඳගැනීමේදී භාවිත කළ නාමයයි දිනක් ඔහු සිය ෆේස්බුක් ගිණුමට ප්‍රවේශ වූ විට, වේදිකාවේ අයිතිවාසිකම් සහ වගකීම් ප්‍රකාශය උල්ලංඝනය හේතුකොටගෙන තම ගිණුම අක්‍රීය කර ඇති බව ඔහුට දන්වා ඇති අතර එම උල්ලංඝනය පිළිබඳ කිසිදු තොරතුරක් ද ඔහුට ලබා දී නැත. ඔහුගේ ජීවනෝපාය සඳහා මෙම ෆේස්බුක් ගිණුම ප්‍රධාන සන්නිවේදන මාර්ගයක් බැවින් ඔහු එය නැවත ලබා ගැනීමට උත්සාහ කර තිබේ මේ වන විට ෆේස්බුක් හි සැබෑ නාම ප්‍රතිපත්තිය පරිශීලකයින්ට ‘ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ දී පාවිච්චිවන නම’ භාවිත කිරීමට ඉඩ දී තිබුණත්, අත්හිටවූ ගිණුමක් යළි ලබා ගැනීම සඳහා ඔබට නිල හඳුනාගැනීමේ ලේඛනයක් හෝ ගිණුමේ ඇති නම යෙදූ උපයෝගිතා බිලක් වැනි දෙයක් ඉදිරිපත් කළ යුතු ය. ඔහුගේ නෛතික නාමය වෙනස් කිරීමට කිසිදු අදහසක් නැති, එම නම ඔස්සේ හඳුනාගැනීමේ ලියකියවිලි හා අනෙකුත් සියලු ම ලිපි හුවමාරු කරගෙන ඇති මෙලනිට මෙය විකල්පයක් නොවේ. තම ෆේස්බුක් ගිණුම නැවත ලබා ගැනීම පිළිබඳ බලාපොරොත්තුව අතහැර දැමූ ඔහු නව ගිණුමක් විවෘත කර එමගින් තම ජාලය නැවත ගොඩනගා ගැනීමට උත්සාහ කරය.



අන්තර්ජාල ප්‍රවේශය රට පුරා  බොහෝ දෙනෙකුට පොදු ප්‍රශ්නයක් ලෙස පැවතුන ද, ඔවුන්ගේ ජීවිත හා ජීවනෝපායන් වෙත සෘජු බලපෑම් ඇති කළ හැකි ප්‍රතිවිපාක ගෙන එන සිය ප්‍රජාවට ම විශේෂිත වූ ගැටලු කිහිපයකට LGBTQ+ පුද්ගලයින් මුහුණ දෙන බව මින් පෙනී ගියේය.



# පිවිසියහැකිබව හා නියාමනය

## ප්‍රියතම වේදිකා හා පරිශීලක සංස්කෘතිය

මෙම සමීක්ෂණය ප්‍රතිචාරකයන්ගේ ප්‍රියතම වේදිකා හා එම වේදිකාවල ඔවුන්ගේ පරිශීලන චර්යා ගවේෂණය කළේ මාර්ග කිහිපයකිනි.

අ) ඔබ වැඩිය ම අන්තර්ජාලය යොදාගන්නේ කුමක් සඳහා ද?

ආ) ඔබට ප්‍රකාශනය සඳහා වැඩිම අවකාශයක් ලබා දෙන වේදිකාව කුමක්ද?

ඇ) ඔබ ඔබගේ අන්තර්ජාල භාවිත කිරීමේ හැකියාව ප්‍රමාණ කරන්නේ කෙසේද?

මෙම ප්‍රශ්නවලට දුන් පිළිතුරු තුළින් ප්‍රතිචාරකයන් අන්තර්ජාලය භාවිත කළ ආකාරය හා ඔවුන්ගේ කැමැත්ත පසුපස වූ හේතු පිළිබඳව පැතිකඩ කිහිපයකින් අපට දැනුවත් කළේය.

මෙම ප්‍රශ්නයට ලැබෙන ප්‍රතිචාර වටහාගතයුත්තේ එක් එක් ප්‍රතිචාරකයන් විසින් ප්‍රශ්නයට දුන් අර්ථකථන තුළින් ඇති වූ ඒවා ලෙසයි. මෙහි දී අන්තර්ජාලයේ රැඳී සිටිනවිට මිනිසුන් වැඩිපුරම කරන්නේ කුමක්ද හා මිනිසුන් අන්තර්ජාලයට පිවිසෙන්නේ කුමක් සඳහා ද යන අර්ථකථන දෙකම ලබා දී ඇත. උදාහරණයක් ලෙස සෞඛ්‍ය තොරතුරු ගතහොත්, අයෙක් එය ඔවුන් අන්තර්ජාලයේ රැඳී සිටින විට සමහර විට කරන දෙයක් ලෙස අර්ථකථනය කළත් තවත් අයෙක් එය ඔවුන් සැමවිටම අන්තර්ජාලය තුළ පමණක් සොයන දෙයක් ලෙස අර්ථකථනය කරති (ඔවුන් කිසි විටෙකත් පියවි ලෝකයේ ඒවා සොයන්නේ නැත) සමහර ක්‍රියාකාරකම් අන්තර්ජාලයේ මෙන් ම ඉන් පිටත දී ද කළ හැකි ඒවා (නිදසුනක් ලෙස පර්යේෂණ, වැඩ, සෞඛ්‍ය තොරතුරු ආදිය) වුවද, එක්තරා ව්‍යාකූලත්වයක් ඇතිවූයේ ලැයිස්තුවේ සමහර ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් ම අන්තර්ජාලගත ක්‍රියාකාරකම් (උදාහරණයක් ලෙස

**ඔබ වැඩිය ම අන්තර්ජාලය යොදාන්නේ කුමක් සඳහා ද?**

| | නිතරම | ඉඳහිට | කිසිදාක නැත |
|---|---|---|---|
| බැංකුකරණය | 16.5% | 49.5% | 34% |
| බ්ලොග් කිරීම | 37.9% | 36.9% | 25.2% |
| ඇමතුම් | 58.3% | 38.8% | 2.9% |
| චැට් කිරීම | 52.4% | 37.9% | 9.7% |
| පෙම්සබඳතා ඇතිකරගැනීම | 13.6% | 42.7% | 43.7% |
| ඊතැපෑල | 65% | 20.4% | 14.6% |
| ෆෝරම්/සාකච්ඡා | 33% | 47.6% | 19.4% |
| ක්‍රීඩාකිරීමට | 21.4% | 44.7% | 34% |
| සෞඛ්‍යය තොරතුරු | 37.9% | 45.6% | 16.5% |
| ක්ෂණික පණිවුඩ | 61.2% | 30.1% | 8.7% |
| ජීවනෝපාය | 22.3% | 46.6% | 31.1% |
| කාමුක චිත්‍රපට | 19.4% | 51.5% | 29.1% |
| පර්යේෂණ | 55.3% | 32% | 12.6% |
| සෙවුම් එන්ජින් | 58.3% | 32% | 9.7% |
| ලිංගික පණිවුඩ | 12.6% | 42.7% | 44.7% |
| ලිංගික ප්‍රමෝදය | 12.6% | 49.5% | 37.9% |
| සමාජ ජාලගතවීමට | 55.3% | 35.9% | 8.7% |
| වීඩියෝ නැරඹීමට | 44.7% | 37.9% | 17.5% |
| රැකියාව සඳහා | 59.2% | 34% | 6.8% |

සමාජ ජාල, වීඩියෝ නැරඹීම, විද්‍යුත් තැපැල් ආදිය) වූ නිසා ය. වැඩ හා ජීවනෝපාය අතර හෝ චැට් කිරීම හා ක්ෂණික පණිවුඩ යැවීම වැනි ඇතැම් ක්‍රියාකාරකම් අතර වෙනස පිළිබඳව නිසි පැහැදිලි කිරීමක් එහි නොමැති විය. ක්‍රිඩා කිරීම වැනි ක්‍රියාකාරකමක් හඳුනාගත්තේ වීඩියෝගේම් ගසන හෝ තමා ක්‍රීඩකයෙකු කියා හඳුනාගත් අය ඔස්සේ වීම නිසා, වෙනත් විද්‍යුත් ක්‍රීඩා ගසන අය ඔවුන් නිතර ම ඒ ක්‍රීඩාකළත් පිළිතුර ලෙස 'සැමවිටම කියා තෝරා නොගන්නට ද ඇත'

කණ්ඩායමක් වශයෙන් ප්‍රතිචාරකයන් අපට කියනවා යැයි පෙනී ගියේ මෙවැන්නකි.

- මම නිතරම අන්තර්ජාලය භාවිත කරන්නේ බ්ලොග්, ඇමතුම්, චැට් කිරීමට, ඊතැපැල්, ක්ෂණික පණිවුඩ යැවීමට, පර්යේෂණ කිරීමට, සෙවුම් එන්ජින් සඳහා, සමාජ ජාලගතවීමට, විඩියෝ නැරඹීමට හා වැඩ කිරීමටයි.

- මම කිසිදාක පෙම්වතුන් හමුවීමට හෝ ලිංගික පණිවුඩ යැවීමට අන්තර්ජාලය භාවිත කර නැත.

- මම ඇතැම් විට බැංකුකරණය, බ්ලොග්, සාකච්ඡා, ක්‍රීඩා, සෞඛ්‍යය තොරතුරු, ජීවනෝපාය, නිල්චිත්‍රපට, හා ලිංගික තෘප්තිය වෙනුවෙන් අන්තර්ජාලය භාවිත කරමි.

46 හැවිරිදි මෙලනි මුලින් ම අන්තර්ජාලය භාවිත කිරීම ආරම්භ කළේ 2010 දී ය. ඔහු ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ කුඩා නගරයක සිට පැමිණි අතර ඔහු සිය සමලිංගිකත්වය මානසික රෝගයක් බව දිගු කලක් තිස්සේ විශ්වාස කළ අයෙකි. ඔහු වටා සිටි





## අන්තර්ජාලය තුළ ලිංගිකත්වය සහ ලිංගික දිශානතිය පිළිබඳ තොරතුරු සොයා ගැනීම.

අයගෙන් මෙන් ම ඔහුට පිවිසිය හැකි මාධ්‍යයන්ගෙන් ද ලබාගත හැකි වූ එක ම තොරතුර මෙය විය. ඔහු වැඩ සඳහා අන්තර්ජාලය භාවිත කිරීමට පටන්ගත් විට එච්.අයි.වී සහ ඒඩ්ස් පිළිබඳ තොරතුරු සොයා බැලීමට ද පටන් ගත්තේය. අන්තර්ජාලය තුළ ලිංගිකත්වය සහ ලිංගික දිශානතිය පිළිබඳ තොරතුරු සොයා ගැනීමටත්, එම අනන්‍යතාවත් තමාගේ ම කොටසක් ලෙස පිළිගැනීමටත්, ඔහුගේ අනන්‍යතාවය සාපරාධී ලෙස සැලකෙන අයුරු පිළිබඳව වැඩිදුර ඉගෙනීමටත් අන්තර්ජාලය මග පෑදුවේ ය. ශ්‍රී ලංකාවේ වෙසෙන සමලිංගික පුද්ගලයන් මෙන් ම විරුද්ධලිංගික ඇඳපැලඳගැනීම් කරන ප්‍රජාවේ අනෙක් අය හා සම්බන්ධ වීමටත් ඔහුට අන්තර්ජාලය ප්‍රයෝජනවත් විය. ඔහු බොහෝ දුරට මේ වනවිට අන්තර්ජාලය භාවිත කරන්නේ විද්‍යුත් තැපෑල, චැට් කිරීම, පර්යේෂණ සහ

සමාජ ජාල සඳහායි. විශේෂ යමක් ඇතිවිට පමණක් අන්තර්ගත පළකරන ඔහු සාමාන්‍යයෙන් අන්තර්ජාලයේ කරනුයේ වීඩියෝ නැරඹීම, සමාජ මාධ්‍යයේ කමෙන්ටු පළ කිරීම, ගොසිප් ලංකා අඩවිය කියවීම හා වැදගත් යැයි හැඟෙන දේ නැවත බෙදාගැනීමයි ඔහු උදාහරණයක් ලෙස මෑත කාලයේ දී වේගයෙන් පැතිරගිය "පරිසර කාන්තාව" වීඩියෝව දැක්වීය. එය කඩොලාන රක්ෂිතයක ක්‍රීඩා පිටියක් ඉදිකිරීමට රජයේ ඇමතිවරුන් කළ යෝජනාවට දිස්ත්‍රික් වන සංරක්ෂණ නිලධාරිනියක අභියෝග කළ වීඩියෝවකි. මෙලනි ද ඒ නිලධාරිනියගේ අවංකකම අගයමින් වීඩියෝව බෙදාගත් ශ්‍රී ලංකාවේ අන්තර්ජාල-පුරවැසියන් අතරින් කෙනෙකි.



ශමාල් පෙම්වතුන් හමුවීමට හෝ ලිංගික පණිවුඩ සඳහා කෙදිනකවත් අන්තර්ජාලය භාවිත කර නොමැති ඔහු කියා සිටියේ තමා ආදර හමුවීම් සුළුපටු දේ ලෙස නොතකන බවත්, හමුවීම් ඇප් ඔස්සේ තමාට අවශ්‍ය පරිදි හැඟීම් මිශ්‍ර සබඳතාවක් සොයාගත නොහැකි බව තමා විශ්වාස කරන බවත් ය. ඔහු අන්තර්ජාලයේ ඔහුගේ පෞද්ගලිකත්වය ගැන ඉතාමත් සැලකිලිමත්වන අතර තමාගේ ඡායාරූප හෝ වෙනත් පෞද්ගලික තොරතුරු බෙදා ගන්නේ ද කලාතුරකිනි. එම නිසා ලිංගික පණිවුඩ හෝ ඡායාරූප යැවීමට තරම් ඔහුට සුවපහසුවක් දැනෙන්නේ නැත. ඔහු ඇතැම් විට කාමුක දර්ශන නැරඹුවත් ලිංගික තෘප්තිය සඳහා කිසි විටෙකත් අන්තර්ජාලය භාවිත නොකරන බව ද පැවසීය. මෙහි ඔහු දුටු දෙබෙදුම ලිංගික තෘප්තිය සඳහා අන්තර්ජාලය භාවිත කිරීම දෙදෙනෙකු අතර සන්නිවේදනයකින් ඇතිවන්නක් යන අවබෝධයකින් පැන නැගුණ බව අපට පෙනීගියේ ය.

ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා හා සම්මුඛ සාකච්ඡා තුළින් අප කථා කළ බොහෝ ප්‍රතිචාරකයන් තොරතුරු හැසිරවීමේ කාර්යයන් ආශ්‍රිතව ක්‍රියා කළ දැනුම සබැඳි සේවකයන් ය. මෙය ඔවුන් ඊමේල් භාවිත කරන ආකාරයෙන් පෙනීයයි. 65% ක් තමන් සැමවිට ම විද්‍යුත් තැපෑල සඳහා අන්තර්ජාලය භාවිත කරන බව කියා සිටියත් එ තුළින් ප්‍රකාශන අවකාශයක් ලැබෙන බව කියා සිටියේ 10% ක් පමණි. කෙසේ වෙතත්, ලිංගික ශ්‍රමිකයන් පිරිසක් සමග පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවකදී හෙළි වූයේ ඔවුන් රැකියාව මෙන් ම පෞද්ගලික ජීවිතයේ ද වඩාත් ප්‍රිය කළ සන්නිවේදන ක්‍රමය මෙම සමීක්ෂණයේ ඇතුළත් කර නොමැති බවයි ඒ දුරකථන ඇමතුම් ය. අන්තර්ජාල භාවිතය පිළිබඳ අවධානය යොමු කරන ලද සමීක්ෂණයකට දුරකථන ඇමතුම් සහ කෙටි පණිවුඩ ඇතුළත් නොවූ හේතුව තේරුම් ගත හැකි වුවත්, මෙම ප්‍රතිපෝෂක පෙන්නුම් කරන්නේ අධ්‍යයනයේදී අන්තර්ජාලය ලෙස සීමා නොකර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් (ICTs) වෙත ප්‍රවේශ වීම යැයි හැඳින්වීම මගින් බොහෝදෙනෙකුගේ අත්දැකීම් ලේඛනගත කරගැනීමට හැකිවන බවයි. තවද, මෙම කණ්ඩායම සඳහන් කළේ අනාගත සේවාදායකයින් සමග සම්බන්ධ වීමට ලිංගික ශ්‍රමිකයන් ඇප් හා වෙබ්අඩවි භාවිත කළත්, සේවාදායකයන් හා සන්නිවේදනය කිරීමට වඩාත් ප්‍රිය කරන ක්‍රමය දුරකථන ඇමතුම් ඔස්සේ වන බවයි.

ක්‍රියාකාරිනියක් හා සංක්‍රාන්ති කාන්තාවක් වන ශිරාණි ද දුරකථන ඇමතුම්වල නිරන්තර වැදගත්කම සඳහන් කළාය. ඇය ඇගේ පෞද්ගලික ජීවිතයෙන් බොහෝ තොරතුරු ඇගේ සමාජ මාධ්‍යවල බෙදා නොගත්තත්, සංක්‍රාන්ති ලිංගිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන ඇගේ සංවිධානයේ ෆේස්බුක් පිටුවේ ඇගේ ජංගම දුරකථන අංකය සඳහන් කර ඇත. "මට රෑ




මැදත් ඇමතුම් එනවා ඉතින් මං උත්සහගන්නවා මට කතා කරන හැමෝට ම කතා කරන්න" ශිරාණි පවසයි. ඇය පවසන්නේ ඇය හා ඇගේ සංවිධානය අන්තර්ජාලය ඔස්සේ සොයාගත්ත ද මිනිසුන්, විශේෂයෙන් තරුණයින්, තවමත් දුරකථනයෙන් සංවිධානය හා සම්බන්ධවීමට කැමැත්තක් දක්වන්නේ දුරකථන ඔස්සේ බවයි, ඒ ඇමතුමක සාපේක්ෂ නිර්නාමිකභාවය නිසා ඔවුන්ට ලැබෙන පෞද්ගලිකත්වය නිසාවෙනි. ඇය රාත්‍රී කාලයේ ලැබෙන ඇමතුම් වෙත සහකම්පනයක් දක්වන්නේ බොහෝවිට රාත්‍රියට මිනිසුන්ට තනිකම හා තමා අවදානමට ලක්විය හැකි යැයි හැඟෙන නිසා බවත්, ඒ වගේ ම නිවසේ සිටින අනෙක් අයට නෑසෙන ලෙස සමාජභාවය හා ලිංගිකත්වය පිළිබඳ ගැටලු සාකච්ඡා කිරීමට හැකිවන්නේ එම කාලයේ දී නිසා බවත් ඇ පැවසුවාය.

එම නිසා, අන්තර්ජාල පරිශීලක හැසිරීම සහ සංස්කෘතිය වෙනත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවල පුළුල් පරාසය තුළ සලකා බැලීම වැදගත් වේ.

පෙර සඳහන් කළ අයුරින්, පර්යේෂණ පෙන්වන්නේ ලංකාවේ සියලු ම අන්තර්ජාල පරිශීලකයකු ම පාහේ සමාජ මාධ්‍යය පරිශීලකයකු බවයි (ගල්පාය සහ පිරිස , 2019). ඔවුන්ට ප්‍රකාශනය සඳහා වැඩිම අවකාශයක් ලබා දෙන ස්ථාන ලෙස අප සමීක්ෂණයේ ප්‍රතිචාරකයන් වැඩි කැමැත්තක් දැක්වූයේ ෆේස්බුක, වට්සැප්, ඉන්ස්ටාග්‍රෑම්, ඉමෝ හා ට්විටර් වෙතයි. ඔවුන්ගේ මේ කැමැත්ත සඳහා හේතු වූ කාරණා කිහිපයක් හා ඔවුන්ට ඇති වූ ගැටලු කිහිපයක් පහත දැක්වේ.

**ඔබ භාවිත කරන සියලු ම වේදිකා අතර ඔබට වැඩිම ප්‍රකාශන අවකාශයක් ලබා දෙන වේදිකාව කුමක්ද ?**




*රූපසටහන 34: ඔබ භාවිත කරන සියලු ම වේදිකා අතර ඔබට වැඩිම ප්‍රකාශන අවකාශයක් ලබා දෙන වේදිකාව කුමක්ද ?*

## ෆේස්බුක්

- විශේෂයෙන් ම ෆේස්බුක් පිටු කළමණාකරණය කරන විට පෝස්ට්/ෆොටෝ/ විඩියෝ සඳහා පැතිරීමේ අවකාශය ඉතාමත් වැඩි අගයක් ගන්නවා.
- එය ඩෙස්ක්ටොප් පරිගණකවල මෙන් ම ජංගම ඇප් එකක් හරහා ද පහසුවෙන් භාවිත කළ හැකිය.
- සිංහල භාවිත කිරීමට පුළුවන්.
- භාවිතය ඉතා ම පහසුයි.
- ෆේස්බුක් හා මගේ බ්ලොග් එක, මොකද මම මේ අඩවි දෙකේ ලියන දේ මිනිසුන් කියවනවා, ඒ නිසා මට අනෙක් අය වෙතත් පැතිරීමට අවකාශයක් තියෙනවා.
- මගේ මතවාද ඉදිරිපත් කිරීමට ඉතාමත් වැදගත්.
- මම කැමති ෆේස්බුක්වල පරිවර්තනය කිරීමට හැකිබවට.
- ෆේස්බුක් සෘනාත්මක අවකාශයක් වෙන්නත් පුළුවන්.
- අනිත් එක ෆෙස්බුක්වල අපි පරිභෝජකයන් නෙමේ, අපි තමයි නිෂ්පාදනය. මිනිස්සු ඒක එහෙමයි කියලා දැනගන්න ඕනේ, පරෙස්සම් වෙන්න ඕනේ.
- අවුරුදු කිහිපයකට පෙර මම ෆෙස්බුක්වල හුඟක් ක්‍රියාශීලී කාලේ□ හුඟක් ලිංගවාදී දේවල් තිබ්බා.
- සමාජභාවය ගැන කිසි දෙයක් දාන්න බෑ ඔයා පුවත් බෙදාගත්තත්, හිතේ තිබ්බ දේ කිව්වත් මිනිසුන්ට තරහා යනවා, සෘනාත්මක කමෙන්ටු ලබා දෙනවා.

## ඉන්ස්ටාග්‍රෑම්

- ඉන්ස්ටාග්‍රෑම් කියන්නේ මට මගේ අනන්‍යතාව ප්‍රකාශ කරන්න පුළුවන් කියලා හිතෙන තැනක්- පුද්ගයෙක් විදිහට මම, මම කැමති දේ වගේ ම මගේ ක්වියර බවත් ඒකේ පළ කිරීම ගැන මම ගොඩක් ආඩම්බර  වෙනවා.
- එහි ආරක්ෂාව වැඩි, ධනාත්මකයි, මාව ෆලෝව් කරන අය මුහුණාට හමු නොවී මට ම තෝරගන්න පුළුවන්.
- චිත්‍ර ප්‍රදර්ශනය කිරීමට හොඳ තැනක්.
- ලංකාවේ විචාරාත්මක බුද්ධිය ගැන කතා කරන්නේ ම නෑ. ඉන්ස්ටග්‍රෑම් ඉන්ෆ්ලුවෙන්සර්ලා, ආයතන වුණාත් හදන්නේ එයාලගේ නිෂ්පාදන අපිට විකුණාගන්න.
- මට ඉන්ස්ටග්‍රෑම් එකතු වෙන්න ආසය, ඒත් ඒකේ හුඟක් අන්තරගත තියෙන නිසා මම හරියට ම දන්නේ  නෑ ඒක මට ඕනේ ද කියලා- මිනිස්සු හැම වෙලේ ම පෝස්ට කරනවා. ඉන්ස්ටාග්‍රෑම් හදන්නේ හැම  තිස්සේම අපිව සම්බන්ධ කරගන්නයි.

### ට්විටර්

- මට හිතෙන්නේ ට්විටර කෙටි ක්‍රමයකින් නිදහස ප්‍රකාශනය ලබා දෙනවා කියලා. ඔයාට වැඩිය ලියන්නත්, අඩුපාඩු කියන්නත් නෑ.
- මං හිතන්නේ ට්විටර් සාකච්ඡාවලට නියම තැනක්, එකේ ඔයාට පුළුවන් සියලු ම, මෙන් ම ඕනෑ ම විෂයක් ගැන ලොකු විවිධත්වයක් තියෙන කණ්ඩායම්වල මතවාද අත්දකින්න.
- මම වැඩිය ම ඉන්නේ ට්විටර් එකෙයි ඉන්ස්ටාග්‍රෑම එකෙයි අහිතකර පරිසරයන් අතහැර දාලා යන්න ඕනෑ නිසා මම මගේ ෆේස්බුක් හා ටම්බ්ලර් ගිණුම් වහලා දැම්මා.
- ශක්තිමත්, හොඳින් සන්නිවේදනය කරන, අපුරූ අතික්‍රාන්ත පිරිසක් ඉන්නවා. මේ ඔක්කොම එකතු වුණාම, ලංකාවේ ට්විටර් එකේ සාමාන්‍යය වැඩකට නැතිබව තියෙද්දී ම, හොඳ ක්වියර ප්‍රජාවක් වගේ ම හොඳ කතාබහක් තියෙනවා.
- මගේ පවුල ටම්බ්ලර් හෝ ට්විටර් නැති නිසා මට ඒ තැන්වල ප්‍රකාශන කරන්න පහසුයි.

### ටික්ටොක්

- එකේ සෙල්ලං කරන්න හුඟක් ඉඩකඩ තියෙනවා.

### ටම්බ්ලර්

- එතන හැමෝම අමුතුයි. අනෙක් වේදිකාවල කිසිදෙයක් විශේෂ නැහැ, ඒත් ටම්බලර් එකේ හැම කාලේ ම සැබෑ ගතියක් තිබ්බා.
- මං වගේ වෙනස් අනන්‍යතා තියෙන අයට එකතුවෙලා එක එක දේ ගැන කතාබහ කරන්න හොඳ තැනක්.
- මගේ පවුල ටම්බ්ලර් හෝ ට්විටර් නැති නිසා මට ඒ තැන්වල ප්‍රකාශන කරන්න පහසුයි.
- මං ලියන්න ගත්තේ ටම්බලර් එක සහ බ්ලොග් නිසා. මාව දිරිමත් වුණා එක එක අන්තර්ගත නිර්මාණය කරන්න.

### ගූගල්


- තොරතුරු හා දැනුම හොයන්න. විවේකීව ඉන්නට.

### රෙඩිට්

- ඒක නිර්නාමික සමාජ මාධ්‍යයක්.
- ඒක නිර්නාමික නිසා.


## ඔබ ඔබගේ අන්තර්ජාල භාවිත කිරීමේ හැකියාව ප්‍රමාණ කරන්නේ කෙසේද?

### වෙබ්අඩවියක් සෑදිය හැකියි





*රූපසටහන 35: වෙබ්අඩවියක් සෑදිය හැකියි*

### කෝඩ් ලිවීමට හැකියි





*රූපසටහන 36: කෝඩ් ලිවීමට හැකියි*

### සෙවුම් එන්ජින් භාවිත කළ හැකියි





*රූපසටහන 37: සෙවුම් එන්ජින් භාවිත කළ හැකියි*

### සමාජ ජාලවල සහභාගිවිය හැකියි





*රූපසටහන 38: සමාජ ජාලවල සහභාගිවිය හැකියි*

### බ්ලොග් කළ හැකියි




*රූපසටහන 39: බ්ලොග් කළ හැකියි*

### අන්තර්ජාලයේ කණ්ඩායම්/සාකච්ඡාවල සහභාගිවිය හැකියි




*රූපසටහන 40: අන්තර්ජාලයේ කණ්ඩායම්/සාකච්ඡාවල සහභාගිවිය හැකියි*


මෙම ප්‍රශ්නයට පිළිතුරු ද, පෙර කොටසේ පුද්ගලයන් වැඩියෙන් ම අන්තර්ජාලය භාවිත කළේ මොනවාට ද සහ ප්‍රකාශනය සඳහා වැඩිම අවකාශය ලබාදුන්නේ මොන වේදිකාව ද යන ප්‍රශ්න වෙත ලැබුණු ප්‍රතිචාර හා සමාන වේ.

බොහොමයක් ප්‍රතිචාරකයන් සමාජ ජාල, කණ්ඩායම් හා සාකච්ඡාවල සහභාගීත්වය, සෙවුම් අඩවි භාවිතය, බ්ලොග් කිරීම ආදිය පිළිබඳ සිය හැකියාවන්ට ඉහළ අගයක් ලබා දී තිබිණි. අවසාන වශයෙන් ඇතැම් ප්‍රතිචාරකයන් (ඉංග්‍රීසි මෙන් ම දෙමළ ප්‍රතිචාරකයන්) ටම්බ්ලර් බ්ලොග් වේදිකාව අතික්‍රාන්ත පුද්ගලයින් ලෙස තමන්ගේ ආත්ම ප්‍රකාශනයට වැදගත් වන බව දැක්වීම සැලකිය යුතු කරුණකි. කෙසේවෙතත්, ප්‍රතිචාරකයන් සැලකියයුතු ප්‍රමාණයක් ඔවුන්ගේ බ්ලොග් කිරීමේ හැකියාව දැක්වූයේ 1ක් (කිසිදාක කර නැත) කියා වන අතර සමාජ මාධ්‍යයේ නැගීමත් සමග ලැබුණු ක්ෂුද්‍ර බ්ලොග් කිරීමේ අවස්ථා සමග ම බ්ලොග් කිරීම ප්‍රචලිත මාධ්‍යයක් නොවී යාම මීට තවත් හේතුවක් විය හැක (Blog Tyrant, 2020).

බොහෝ ප්‍රතිචාරකයන් දැක්වූයේ ඔවුන් කිසිදාක කෝඩ් කර හෝ වෙබ්අඩවියක් තනා නොමැති බවයි. මෙය පුදුමයක් නොවන්නේ ඒවා තවමත් විශේෂිත දැනුම ලෙස සැලකෙන නිසාවෙනි. කෙසේ වෙතත් කෝඩ් අඩු වේදිකාවල නැගීමත් (Gineers Now, 2020) කෝඩින්ග්-සාක්ෂරතාව, භාෂා සාක්ෂරතාව තරම් එදිනෙදා දෙයක් වේවි යන අනාවැකිත් (ඩේවිස්,2019) නිසා ම විශේෂයෙන් වෘත්තීය වෙළඳපලට ඇතුළුවන තරුණ තරුණියන් මෙම හැකියා දියුණු කරගැනීමට අවශ්‍යතාව නුදුරු අනාගතයේ දී ඇතිවේවි. ඉහත අංශය පෙන්වාදුන් පරිදි, බොහොමයක් ප්‍රතිචාරකයන්ට සිය උපකරණ පාලනය කළ හැකි වුවත් වේදිකා මත

**මෙය විශේෂයෙන් ම සත්‍යවන්නේ LGBTQ+ ජනතාවට වන අතර, ඉන් පෙනීයන්නේ ස්වයායත්ත අන්තර්ජාල වේදිකා ගොඩනැගීම හා සම-නිර්මාණ ආශ්‍රිත හැකියා දියුණු කරගැනීම විශේෂයෙන් ම ඔවුන්ට බලය පවරා දෙන්නක් විය හැකි බවයි.**

ඔවුන් අත්විඳින ස්වයායත්තතා මට්ටම් අවම නිසා ස්වයං-වාරණය කිරීමට හෝ වේදිකාවන්ගේ පාලනයට ලක්වීමට සිදුවේ. මෙය විශේෂයෙන් ම සත්‍යවන්නේ LGBTQ+ ජනතාවට වන අතර, ඉන් පෙනීයන්නේ ස්වයායත්ත අන්තර්ජාල වේදිකා ගොඩනැගීම හා සම-නිර්මාණ ආශ්‍රිත හැකියා දියුණු කරගැනීම විශේෂයෙන් ම ඔවුන්ට බලය පවරා දෙන්නක් විය හැකි බවයි. ජාතික ඩිජිටල් ප්‍රතිපත්තිය (ශ්‍රී ලංකා ඩිජිටල් යටිතලපහසුකම් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කාරකත්වයේ අමාත්‍යාංශය, 2019) මගින් " ඩිජිටල් සාක්ෂරතාව හා වැඩිහිටි, ආබාධිත, කාන්තා හා ආන්තික කණ්ඩායම් සඳහා යාවජීව හැකියා සංවර්ධනය පෝෂණය කිරීමට" ඇති අවශ්‍යතාව දක්වා ඇත. එහෙත් තමාගේ ලිංගිකත්වය, සමාජභාව අනන්‍යතාව හෝ ලිංගික චර්යා හේතුවෙන් ආන්තිකකරණය වන අයට ඔවුන් නීතියෙන් සාපරාධී යැයි තකන තාක් කල් මෙ තුළින් සාධනීය ලෙස සේවය කිරීමට නොහැක.



# පිවිසියහැකිබව හා නියාමනය

## භාෂාව හා පාරිභාෂික පදමාලාව

භාෂාව කිසිවිටෙකත් සන්නිවේදන මෙවලමකට පමණක් සීමා නොවේ, මෙය ශ්‍රී ලංකාවටත් සත්‍යයකි. ලංකාවේ භාෂාව හා පදමාලා ආශ්‍රිත ගැටලු ඓතිහාසිකව සංකූලවන අතර (පෙරේරා, 2011) ඒවා තුළින් පැතිරගිය සමාජීය, දේශපාලනික හා ආර්ථික ප්‍රතිවිපාක ද තිබේ. මෑතක දී ඇතිවුණු භාෂා පිළිබඳ ජාතික ප්‍රශ්නයක් වූයේ 2020 නිදහස් දින සැමරුම් උලෙළේ දී දෙමළ බසින් ජාතික ගීය නොගැයීමට නව ආණ්ඩුව ගත් තීරණයයි (Al Jazeera, 2020). භාෂාව හා දේශපාලනය අන්තර්ජාලයේ ද එකිනෙක හා ගැටේ. පුරවැසියන් නිතර පෙන්වාදෙන්නේ ජනපති මාධ්‍ය ඒකකය (ගෝපික්‍රිෂ්ණා, 2020), රජයේ තොරතුරු දෙපාර්තමේන්තුව මෙන් ම ශ්‍රී ලංකා රජයේ නිල ප්‍රවෘත්ති සේවය ද (අයින්කරණ්, 2019) තොරතුරු නිකුත් කරන්නේ සිංහල හා ඉංග්‍රිසි භාෂාවන්ගෙන් පමණක් බවයි.


> *"භාෂා විෂමතාව වැනි බැලූ බැල්මට සුළුවට පෙනෙන ගැටලුවක්, පුද්ගලයෙකුගේ එදිනෙදා ජීවිතයට, සේවා වෙත පිවිසුමට හා නීතිය සෙවීමට හිරිහැර කරන අයුරු අප හඳුනාගැනීම අතිශය වැදගත් වේ" (ද සේරා, 2017).*

භාෂාව මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයට බලපාන අයුරු ජනවර්ගය, භූගෝලය, සමාජ පංතිය ආදිය ඔස්සේ වාර්තාගත කර තිබුණ ද, ලිංගික දිශානතියේ හා සමාජභාව අනන්‍යතාව හා ඡේදනය බන ඒවා ලෙස නිසිලෙස ලේඛනගත කර නැත. මෙම අංශය ඇතැම් ප්‍රතිචාරකයන් බෙදාගත් අත්දැකීම් හා නිරීක්ෂණ බෙදාගනියි.

පෙර ක්‍රමවේද හා සීමා පිළිබඳ වූ අංශයේ සඳහන් පරිදි මෙම සමීක්ෂණය ඉංග්‍රීසි, දෙමළ හා සිංහල භාෂාවලින් පැවතිණි. එය පහත දැක්වෙන අයුරින් ප්‍රතිචාරකයන් අතින් සම්පූර්ණ විය. අප සමීක්ෂණයේ කොටසක් ලෙස පැවැත් වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා අතර දෙකක් සිංහල බසින් ද, දෙකක් දෙමළ බසින් ද, දෙකක් සිංහල හා ඉංග්‍රීසි බසින් ද පැවැත්විණි.

**සමීක්ෂණය සම්පූර්ණ කළේ**

| | |
|---|---|
| දෙමළෙන් | 42.7% |
| ඉංග්‍රීසියෙන් | 35.9% |
| සිංහලෙන් | 21.1% |



*රූපසටහන 41: සමීක්ෂණය සම්පූර්ණ කළේ*


භාෂාව හා පාරිභාෂික පදමාලාව මෙම අධ්‍යයනයේ ගවේෂණය වූයේ පහත සඳහන් මාර්ගවලිනි.

- ප්‍රතිචාරකයන් අන්තර්ජාලයේ දී භාවිත කළ මූලික භාෂා මොනවාද?
- සිංහල හා දමිළ යන දේශිය භාෂා භාවිත කරමින් අන්තර්ජාල භාවිතය කිරීමේ අත්දැකීම කුමනාකාර ද?
- සමාජභාවය හා ලිංගිකත්වය ආශ්‍රිත පාරිභාෂික පද මාලාව හසුරුවද්දී ඉංග්‍රීසි හා සසඳන විට සිංහල හා දෙමළ ආශ්‍රිතව ඇතිවුණු ගැටලු මොනවාද?

මෙම සමීක්ෂණය ප්‍රතිචාරකයන්ගෙන් ඔවුන් කතා කරන භාෂාව කුමක්ද කියාත් ඔවුන් අන්තරජාලයේ භාවිත කළ භාෂාව කුමක්ද කියාත් අසා සිටියේ ය.

ප්‍රතිචාරකයන් 20%ක් පවසා සිටියේ ඔවුන් ත්‍රෛභාෂික (ඉංග්‍රීසි, සිංහල හා දෙමළ) බවයි, එහෙත් අන්තර්ජාලයේ දී භාෂා 3 ම භාවිත කළේ 2% පමණි. බොහෝ ප්‍රතිචාරකයන් ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේත් අන්තර්ජාලයෙත් ද්විභාෂික විය. ප්‍රතිචාරකයන් 30% ක් අන්තර්ජාලයේ ඉංග්‍රීසි පමණක් භාවිත කළ අතර, ඉලක්ක කණ්ඩායම් හා සම්මුඛ සාකච්ඡා ඇසුරින් ඇතිවුණු කතාබහෙන් දිස්වූයේ සිංහල හා දෙමළ යතුරු පුවරු භාවිතය අපහසු නිසා ඔවුන් ශබ්දානුසාරයෙන් සිංහල හා දෙමළ සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි භාවිත කළ බවයි. එම නිසා අන්තර්ජාලයේ ඉංග්‍රීසි වැඩියෙන් භාවිතය වටහාගත යුත්තේ භාෂාව ලෙස පමණක් නොව සිංහල හා දෙමළ සන්නිවේදනය සඳහා යොදාගත් (ලතින්) අක්ෂර ද ඔස්සේ ය.

**කතා කරන භාෂාව හා අන්තර්ජාලයේ භාවිත කරන භාෂාව**




රූපසටහන 42: කතා කරන භාෂාව හා අන්තර්ජාලයේ භාවිත කරන භාෂාව

කතා කරන   අන්තර්ජාලයේ භාවිත කරන



භාෂාව ඔවුන් අන්තර්ජාලය භාවිත කරන ආකාරයට බලපාන අයුරු පිළිබඳව ප්‍රතිචාරකයන් බොහෝ දෙනෙක් මෙනෙහි කළහ. මෙලනි හා ශිරානි කියා සිටියේ අන්තර්ජාලයේ ඉංග්‍රීසි භාවිතය මග නොහැරිය හැකි බවත් ඒ නිසා ඔවුන්ට තමන්ව ම සම්පූර්ණයෙන් හා නිසියාකාරයෙන් ප්‍රකාශ කරගැනීමට අපහසු බවත් ය.ශිරානි පැවසුයේ යුනිකෝඩ් හා ගූගල් පරිවර්තනවල සිංහල-ඉංග්‍රීසි හා ඉංග්‍රීසි-පරිවර්තන වල දියුණුවීම ක්‍රියාකාරිනියක් වශයෙන් ඇයට විශාල වෙනසක් සිදුකර දී ඇති බවය. "මට පිනීවාවලට සිංහලෙන් ඊමේල් එකක් යවන්න පුළුවන්", ඈ පැවසුවේ අන්තර්ජාල මෙවලම් අන්තර්ජාතික මට්ටමේ මානව හිමිකම් වෙනුවෙන් පෙනීසිටීම හා වඩාත් හොඳින් සම්බන්ධවීමට ඉඩකඩ සලසා දී ඇති බව දනවමිනි.



අපගේ කතාබහේ දී නැවත නැවතත් කියවුණු දෙයක් වූයේ අන්තර්ජාලයේ පවතින බොහෝමයක් මූලාශ්‍ර තවමත් ඉංග්‍රීසියෙන් පවතින බවයි. අපි කතා කළ පුද්ගලයන්ට ද ඉංග්‍රීසි ඔවුන්ගේ මූලික භාෂාව නොවනවානම් මෙම කාරණය වටා කටයුතු කිරීමට ක්‍රම සොයාගැනීමට සිදුවියි ඔවුන්ගෙන් ඇතැම් අය දැනට පවතින් මූලාශ්‍ර පරිවර්තනයෙහි යෙදුණෝ අන් අය වෙනුවෙන් බහුභාෂික මූලාශ්‍ර ඇති කිරීමට ය. ලක්ෂ්මී පැවසුයේ ඉංග්‍රීසි අන්තර්ජාල සෙවීමක් මහා තොරතුරු සම්භාරයක් සොයා දුන්න ද, එහි දෙමළ භාෂාවෙන් ප්‍රතිඵල තිබේනම් ඒ අතළොස්සක් පමණ බවයි. හසිනි අනෙක් අයගේ මත හා එකඟ වෙමින් කියා සිටියේ අන්තර්ජාලය ඉංග්‍රීසියෙන් භාවිත කිරීම අවාසියට වඩා වාසි දායකවන්නේ මූලික වශයෙන් ම එහි ඉංග්‍රීසියෙන් බොහොමයක් අන්තර්ගත/නිපැයුම් තිබූ නිසා බවයි.





අන්තර්ජාලයේ සෙවීමෙන් පසු තමා සමාජභාව හා ලිංගිකත්වය ආශ්‍රිත ගැටලු පිළිබඳ වඩාත් දැනගත් බව ආර්යා පවසයි. එහෙත් බොහොමයක් අන්තර්ගත ඉංග්‍රීසියෙන් පැවතීම ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි කතා නොකරන අයගේ අන්තර්ජාල භාවිත මට්ටමටත් අන්තර්ගත/නිපැයුම් කරා පිවිසීමටත් අභියෝගයක් විය.



*"අදාළ ලිපි වගේ ම උනන්දුව දනවන කරුණු වැඩිය ම තියෙන්නේ ඉංග්‍රීසියෙන්. ඒවා තේරුම්ගන්න මම ගූගල් පරිවර්තන පාවිච්චි කරනවා. ඒත් අභියෝගේ තමයි ඒ පරිවර්තන හරියට ම හරි නැති එක. සමහර වෙලාවට ඒක සම්පූර්ණෙන් ම වැරදියි. ඒ නිසා ඉංග්‍රීසි දන්නේ නැති එක, හරි හමන් පරිවර්තනයක් නැති එක ප්‍රශ්නයක්. මට ඉංග්‍රීසි එච්චර ම හොඳට බැරි නිසා, ඉංග්‍රීසියෙන් හොයන්නත් අපහසුයි."*

කෙසේවතත්, පරිශීලකයන්ට හා දේශීය භාෂා භාවිතයට අතුරුමුහුණතක් ලබා දීමට අන්තර්ජාල වේදිකා තැත් කරන අවස්ථාවල තවත් අතිරේක අභියෝගයක් වන්නේ දේශීය භාෂාව පෙරනිශ්චිත වූවක් ලෙස පැමිණීමයි. සිංහලෙන් පමණක් තිබූ, දෙමළ භාෂාව ඇතුළත් නොවූ ගූගල් හා මයික්‍රොසොෆ්ට් වේදිකා භාවිත කිරීම පිළිබඳව අත්දැකීමක් විජේ බෙදාගත්තේය:

*"ගූගල් පාවිච්චි කරද්දි භාෂාව ගැන වැදගත් ප්‍රශ්නයක් මතුවෙනවා. මම ගත්තා අලුත් උපකරණයක්. ඒකේ ගූගල් ඇරියම ඒක සම්පූර්ණයෙන් ම සිංහලෙනුයි තිබ්බේ. ගූගල් කරන්නේ*



*ඒ රටේ බහුතර භාෂාව පාවිච්චි කරන එක. ඒත් මෙහෙ තවත් මිනිස්සු ඉන්නවා. එයාලත් මේ අඩවියට යනවා. ගූගල් ඒ මොකුත් හිතන්නේ නෑ. ගූගල් ඒ ගැන හිතන්නේ නෑ විතරක් නෙමෙයි, මයික්‍රොසොෆ්ට් එක හැසිරෙන්නෙත් ඒ වගේමයි."*



**ගූගල් පාවිච්චි කරද්දි භාෂාව ගැන වැදගත් ප්‍රශ්නයක් මතුවෙනවා. මම ගත්තා අලුත් උපකරණයක්. ඒකේ ගූගල් ඇරියම ඒක සම්පූර්ණයෙන් ම සිංහලෙනුයි තිබ්බේ ගූගල් කරන්නේ ඒ රටේ බහුතර භාෂාව පාවිච්චි කරන එක. ඒත් මෙහෙ තවත් මිනිස්සු ඉන්නවා, එයාලත් මේ අඩවියට යනවා. - විජේ**

අන්තර්ජාලයේ විවිධ භාෂා භාවිතය පෙනෙන්නේ විවිධ පුද්ගල කණ්ඩායම් සමග හොඳින්, තවත් සමීපව සන්නිවේදනය කිරීමට ක්‍රමයක් ලෙසයි. සමීක්ෂණ ප්‍රතිඵලවලට අනුව, බොහොමයක් ප්‍රතිචාරකයන් අන්තර්ජාලයේ ද්විභාෂික වන අතර, ඉංග්‍රීසි භාෂාවට අමතරව ඔවුන් සිංහල හෝ දෙමළ භාවිත කර ඇත.



ත්‍රෛභාෂික සංක්‍රාන්ති කාන්තාවක්වන ශිරානි සමාජභාව අනන්‍යතාව, ශල්‍යකර්ම හා හෝර්මෝනවල පසුවිපාක පිළිබඳව අන්තර්ජාලයේ සොයා තිබේ. කෙසේවෙතත් ඇය ද සොයාගත්තේ දේශීය භාෂාවලින් ලියැවුණු තොරතුරු අඩු බවයි. ප්‍රජාවේ අනෙක් අය වෙතට ඈ යොමු කළ තොරතුරු සොයාගැනීමට ඈට හැකිවුණත් ඉංග්‍රීසි නොදත් අයට මුහුණපෑමට සිදුවූ තොරතුරු පරතරය පිළිබඳව ද අනුදැනුමක් ඇයට ඇත. එම නිසා ඇගේ වැඩ තුළ ඇය මේ පරතරය යා කරන්නට හැකි උපරිමයෙන් තැත්දරන්නේ තොරතුරු බෙදාහැරීමටයි "මේ වනවිට කොළඹත්, කොළඹින් පිටතත් ඉන්න තරුණ අය බොහෝ දෙනෙක් තම අනන්‍යතාව පිළිබඳ පිටතට පැමිණෙනවා )coming out) ඒ නිසා භාෂා තුනෙන් ම ඔවුන්ට නිවැරදි තොරතුරු ලබාදීම වැදගත්", ඇය පවසුවා ය.

දමිළ ලෙස තමන්ව හඳුනාගත් විජේට, සිංහල භාවිතය අන්තර්ජාලයේ සිංහල කතාකරන පුද්ගලයන් හා කණ්ඩායම් සමග ද, දමිළ හා ඉංග්‍රීසි භාවිතයේ දී ඒ



වැනිම වෙනත් කණ්ඩායම් සමග ද එක් වෙන්නට උපකාරී වී තිබේ. සෙල්විට ද පුද්ගලයන් හා හොඳින් සම්බන්ධවීම පිළිබඳව තිබුණේ මෙවැනි ම අදහසකි. ඇය කියා සිටියේ ඇය සිංහලෙන් පෝස්ට් එකක් බෙදාගත් විට එය ඇයට සිංහල ප්‍රජාව හා සම්බන්ධවීමටත්, ජාලගත වීමටත් උපකාරී වූ අතර එ තුළින් ඈට වැඩ කරන අවකාශය පුළුල්වන බවයි. විජේ අන්තර්ජාලයේ භාෂා භාවිතය පිළිබඳ දකින අභියෝගය තාක්ෂණික එකකි: ඔහු පැවසුයේ සියලු ම දෙනාට ඔවුන්ගේ ම භාෂාවෙන් (දෙමළ/සිංහල) ටයිප් කරන්නට නොහැකියි, ඒ ඔවුන්ට ඒ විකල්පය නොමැති නිසා. සෙල්වි කැමැත්ත පළ කළේ වේදිකා තුලම ගොඩනැගුණු පරිවර්තන පහසුකම් තිබෙනවාටයි, ඒ වෙනත් භාෂාවලින් පවා ඇති අන්තර්ගතයන්/නිපැයුම් පරිභෝජනයට ඇයට හැකිවන බැවිනි.

**සියලු ම දෙනාට ඔවුන්ගේ ම භාෂාවෙන් (දෙමළ/සිංහල) ටයිප් කරන්නට නොහැකිය, ඒ ඔවුන්ට ඒ විකල්පය නොමැති නිසා.**

ලක්ෂ්මි පැවසුයේ ඇගේ අත්දැකීමට අනුව සමාජභාවය හා ලිංගිකත්වය පිළිබඳව ඉංග්‍රීසියෙන් ලියන විට ලැබෙන කමෙන්ට්, ඒවා දෙමළ බසින් ලියූ කලට වඩා පිළිග න්නාසුළු වන බවත්, ඒවාට විශාල පැතිරීමක් ඇති බවත් ය. මෙයට හේතුව ලෙස ඈට හැඟී ඇත්තේ මෙවන් අන්තර්ගත මූලිකව ම ඉංග්‍රීසියෙන් පවතින නිසා ඒවා පරිභෝජනය කරන අය, දමිළ වැනි මෙම විෂය ගැටලු හා සීමිත දැනුමකට විවෘත වූ භාෂා භාවිත කරන්නන්ට සාපේක්ෂව, වැඩි අවබෝධයක් ඇති අය වන්නට ඇතැයි කියා ය.



*"මං දන්නේ නෑ. ඒත් වෙනසක් තියෙනවා. මම පාවිච්චි කරන්නේ දෙමළ. මම දන්නේ දෙමළ, ඒක මගේ භාෂාව. ඒ නිසා ඒක ලියන්න ලේසියි ඒ ගමන් ම, මම වෙන සමාජ ගැටලු ගැන දෙමළෙන් ලිව්වොත් මට කතා කරන්න අවශ්‍ය පිරිස එක්ක සම්බන්ධ වෙන්න මට පුළුවන්. සමහරවෙලාවට ඒකෙන් මේ ගැටලු ගැන සාකච්ඡා ඇතිවෙනවා. ඒක ලොකු සහයෝගයක්. ඒත් ඉංග්‍රීසියෙන් ලිව්ව ම පැතිරීම වැඩිය."*

සෙල්විටත් එවැනි ම අත්දැකීම් තිබූ අතර ඈ පැවසුයේ ඇය දෙමළෙන් පෝස්ට් කළ විට හිරිහැර වැඩිවන බවත්, සාමාන්‍යයෙන් කමෙන්ටු අපවාදාත්මක වන බවත් ය. එහෙත් එය ම ඇය ඉංග්‍රීසියෙන් පළකර විට ලයික්ස් හා ශෙයාස් වැඩියෙන් ලැබෙන බවයි.



## සමාජභාව හා ලිංගිකත්වය වටා පදමාලාව හසුරුවීම

ක්‍රමවේදය හා සීමා අංශයේ සඳහන් වූ පරිදි, ඉංග්‍රීසි සමීක්ෂණය සිංහල හා දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීමේ දී ශ්‍රී ලංකාවේ (හා ඉංග්‍රීසි පළමු භාෂාව නොවන වෙනත් රටවල ද) ලිංගික දිශානතිය හා සමාජභාව අනන්‍යතාව හා ප්‍රකාශනය ආශ්‍රිත ගැටලු සමග ක්‍රියාකරන බොහොමයක් ක්‍රියාකාරීන් මෙන් ම වෙනත් අය ද මුහුණදෙන අභියෝගයක් ඇතිවිය: ගෝලීය LGBTQ+ ක්‍රියාකාරීත්වයේ පදමාලාවේ සම්මත වී පිහිටුවා ඇති යෙදුම් බොහොමයක් පරිවර්තනයේදී අරුත් විරහිත වී හෝ අදාළත්වය විරහිත වී ගියේ ය. උදාහරණයක් ලෙස gender යන්නට සිංහල පරිවර්තනය වන ස්ත්‍රීපුරුෂ සමාජභාවය හෝ එහි දෙමළ පරිවර්තනය பால்நிலை(පාල්නිලායි) පිහිටා ඇත්තේ සමාජභාවය යනු ස්ත්‍රී පුරුෂ ද්වීමයක් යන්න මත පමණක් පදනම්වූවක් ලෙසයි, එම නිසා එය ඇති සැටියෙන් ම යෙදීම අප සමීක්ෂණයේ පූර්වතාව ලබා දී ඇති අත්දැකීම් හා ප්‍රකාශන ඇති පුද්ගලයන් බොහොම දෙනෙකුව බහිෂ්කරණය කරයි. ඉංග්‍රීසි භාෂිත රටවල අතික්‍රාන්ත (queer) වැනි පදයක ගමන්මග දේශිය සන්දර්භය හා නොගැලපෙන විට අභියෝගය ඇතිවන්නේ පරිවර්තනයට පමණක් නොව, අපගේ අනන්‍යතාවේ මුල්බැසගත් හැඟීමටය. ලිංගික දිශානති හා සමාජභාව අනන්‍යතා වැනි පුළුල් යෙදුම් ඇතැම්විට සම්මත යැයි නොසැලකෙන ලිංගිකත්ව හා ලිංගික චර්යා ඇති ලිංගික ශ්‍රමිකයන් වැනි පුද්ගලයන් බහිෂ්කරණය කරයි.
මෙම සොයාගැනීම් දැනට ශ්‍රී ලංකාවේ අධ්‍යයන කටයුතුවල ගවේෂණය කර ඇති සමාජභාව අනන්‍යතාවේ හා ලිංගික දිශානතියේ බටහිර යෙදුම් හා දේශිය වටහාගැනීම හා අභිචාර අතර ඇති නොගැලපීම් හා අනුනාද වෙයි: උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ නච්චි යනුවෙන් හැඳින්වෙන පුදගලයන් සෘජුව ම සංක්‍රාන්ති

**අතික්‍රාන්ත (queer) වැනි පදයක ගමන්මග දේශිය සන්දගභය හා නොගැලපෙන විට අභියෝගය ඇතිවන්නේ පරිවගතනයට පමණක් නොව, අපගේ අනන්‍යතාවේ මුල්බැසගත් හැඟීමටය**

ප්‍රභේදයට අනුගත නොවන්නේ ඔවුන් සමාජභාව අනන්‍යතාව, ලිංගිකත්වය හා ආශාව අත්දකින සංකීර්ණ ක්‍රම හේතුවෙන, (මිලර් සහ නිකෝල්ස්, 2012); නැතිනම් විෂමලිංගික නොවන "ද්‍රව්‍යය තේරීමේ, ලිංගික භූමිකා හා ලිංගික ක්‍රියාවල ද්‍රවතාවක්" ඇති අය කියා (එල්ලාවල, 2018, පිටු 1321), දැක්වෙන සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන් පෙන්වාදෙන්නේ ස්ථිර හා වටහාගත හැකි අනන්‍යතාවක් පිළිබඳව ඇති න්‍යායාත්මක සංකල්පනය බිඳවැටී ඇති බවයි.

භාෂාවේ හා පාරිභාෂික පදමාලාවේ දේශපාලනය තැකිය යුත්තේ ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනීසිටීම හා මිනිසුන් ප්‍රභේද කිරීමට යුහුසුළු වී අපට කොටු පිරවීමට කියන ප්‍රතිචාර මෙන් ම, අතික්‍රාන්ත නිදහසේ ආඛ්‍යානය අනන්‍යතා දේශපාලනය වෙත යොමු වූ පංත, කුල, හැකියා, ජාති, හෝ ආර්ථික, පරිසර විද්‍යාත්මක මෙන් ම පාරිසරික පරිමාණ හා ඡේදනය වූ ආකෘතියක් රහිතව විකෘති කර ඇති (I)NGO කාර්මික මානසිකත්වය ද ඔස්සේ ය. පාරිභාෂික පදමාලවක හා භාෂාවක අතීත ගවේෂණය කිරීම ශක්තිමත් කරනුයේ අපේ ක්‍රියාකාරීත්වය හා දේශපාලනය පමණක් නොව, එය නැගෙන ගතානුගතිකත්වයට, ආන්තිකත්වවලට ද, නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති හා අනන්‍යතා දේශපාලනය හිංසනයට මෙන් ම රෝසකරණයට යෝදාගන්නා සංස්ථාපිත බලයට ද අභියෝග කරයි.

එම නිසා අප තීරණය කළේ LGBTQ+ භාෂාවේ දේශපාලනය පිළිබඳ කතා කිරීමට අවස්ථාවක් ලෙස ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා යොදාගැනීමටත්, ඇතැම් පාරිභාෂිකවල සෞන්දර්යයට පූර්වතාව ලබා දීමට හේතුවන කරුණු පිරික්සීමටත් ය. මෙම සාකච්ඡා තුළින් NGO කාර්යයන් ඔස්සේ ලබාදුන් යෙදුම් ප්‍රශ්න කිරීමටත්, ගලවා දැමීමටත් පමණක් නොව දේශීයව භාවිතවන භාෂාව ඔස්සේ සන්දර්භගත කිරීමටත් ඉතිහාසකරණය කිරීමටත් අපට හැකිවියි

- LGBTQ+ ජනතාව ලෙස අප භාවිත කරන භාෂාවට පැතිකඩ දෙකකි. අපගේ ක්‍රියාකාරිත්වයේ හා කාර්යයන්වල අපි භාවිත කරන පාරිභාෂික පදමාලාව (සමලිංගික කාන්තා, සමලිංගික පුරුෂ, අතික්‍රාන්ත ආදී) මෙන් ම එදිනෙදා ජීවිතයේ එකිනෙකා සමග භාවිත කරන භාෂාව (අපේ කට්ටිය, කමියුනිටි එක, මෙය එක් එක් ප්‍රදේශවලට ආවේණික වේ).

- පාරිභාෂික පද ප්‍රයෝජනවත්වන්නේ භාෂා සමාජානුයෝජනයේදී ය. මෙහි තල දෙකකි එක් අතකින්, සමලිංගික කාන්තා, සමලිංගික පුරුෂ, සංක්‍රාන්ති ලිංගික ආදි සම්මත යෙදුම් LGBTQ+ ප්‍රජාව සොයාගැනීමටත් ඔවුන් හා සම්බන්ධවීමටත් පහසු කරවයි. කෙසේවතත් මෙම හොඳින් දන්නා යෙදුම් හා බැඳී ඇති අපහාසාත්මක යෙදුම් ඒවා හා ඇසුරුවීමට මැළිකමක් ඇති කරන අතර ම, ඉතාමත් සංවෘත නිර්වචන තුළින් මිනිසුන්ට ඔවුන්ගේ ලිංගිකත්වයේ අත්දැකීම් ඒ තුළට මුසු කිරීමට අපහසුකරවයි.

  - එක් සහභාගිවන්නෙක් ලබා දුන් උදාහරණයක කියැවුණේ gay යන යෙදුම හොයාගත් පසු ඔහු කෙතරම් සහනයක් ලැබුවාද කියාත්, ඒ ඉංග්‍රීසි යෙදුම සමග හඳුනාගැනීම කොතරම් නිදහසක් වුවාද කියාත් ය. ඒ වනතුරු ඔහුට සමලිංගික (Samalingika) යන සිංහල යෙදුම හා හඳුනාගැනීමට නොහැකි වූයේ 7 ශ්‍රේණියේ

සෞඛ්‍යය විද්‍යාව පෙළපොතෙහි HIV/AIDS ආසාදනය විය හැකි ආකාර යටතේ සමලිංගික ක්‍රියාකාරකම් සඳහන් වූ නිසාවෙනි.

- තවත් සහභාගිවූවෙක් ප්‍රජාව හා සම්බන්ධවීමේදී LGBTQ+ පරිභාෂිකයේ ඇති වූ සීමා සඳහන් කළේ යි 2011, උතුරු මැද පළාතේ අතික්‍රාන්ත ජනතාව සිතියම්කරණය කිරීමට තැත් කළත් ඔවුනට gay, homosexual,ආදී වදන්වලින් සම්බන්ධ කරගැනීම අභියෝග යක් වියි එම නගරවල සිටි අතික්‍රාන්ත පුද්ගලයන්ව නගරවැසියන් හඳුනාගත්තේ "මගුල්ගෙවල්වල උයන කෙනා" "මනමාලියන්ට අන්දන කෙනා" වැනි විස්තර ඔස්සේ ය.
- දමිළ භාෂා සාකච්ඡාවල, සංක්‍රාන්ති ලිංගික සඳහා සාමාන්‍යයෙන් භාවිත වුණු දෙමළ පරිවර්තන - மாற்றுப்பாலினர் (Maatruppaalinar) පිළිගත් නොහැකිබව සමහරුන් පැවසුයේ එය සඳහන් කළේ පුරුෂ හා ස්ත්‍රී හැරුණුකොට වෙනත් විකල්ප සමාජභාවයක් බැවිනි. අදහස වූයේ මීට වඩා මධ්‍යස්ථ යෙදුමක් අවශ්‍ය බවයි திருனர் (thirunar) හෝ திருநம்பி(thirunambi සංක්‍රාන්ති පිරිමි) திருநங்கை' (thirunangai සංක්‍රාන්ති කාන්තා) මේ වනවිට භාවිත වේ.
- සහභාගිවූවන් කියා සිටියේ අන්තර්ජාලයේ දී ඔවුන් තමන්ව හඳුන්වාගැනීමට භාවිත කරන යෙදුම් ඔවුන් පියවි ජීවිතයේ භාවිත කරන ඒවාට වඩා වෙනස් වියහැකි බවයි. උදාහරණයක් ලෙස, ඔවුන් දැක්වූයේ ග්‍රයින්ඩර්හි බොහෝ දෙනෙක් ජෝන්සෙ හා නච්චි වැනි යෙදුම් (සංසර්ගයේදී උඩ හෝ යට සිටීම) වටහානොගන්නා නිසා ඒවා පියවි ලෝකයේ භාවිත කළත් හමුවීම් හා හුක්-අප් ඇප් භාවිතයේ දී ටොප් සහ බොටම් (top and bottom) යන යෙදුම් භාවිතයට උගත් බවයි.

- පාරිභාෂික පද හා බලය බැඳී ඇත. ලිංගිකත්වය, ලිංගික දිශානතිය හා සමාජභාව අනන්‍යතාව නිර්වචනය කරන යෙදුම් නිර්මාණය කිරීමට හැකිවීම ම එක්තරා බල මට්ටමක් හඟවයි. ඒ විශේෂයෙන් ම ඒ යෙදුම් භාවිතය පුදගලයන්ට සේවා හෝ වරප්‍රසාද වෙත පිවිසීමට, ආයතන ලියාපදිංචි කිරීමට පාදක වන නිසාය.
- සංක්‍රාන්ති ලිංගිකයන්ට ව්‍යාපෘති පරිත්‍යාගයක් තුළින් ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට අවශ්‍ය නම්, ඔවුන් සංක්‍රාන්ති ලිංගිකයන් බව තහවුරු කිරීමට වෛද්‍ය සහතිකයක් අවශ්‍ය බව සහභාගී වූ අයෙක් පැවසීයි සමාජීය හේතූන් මත සංක්‍රාන්ති නොවන පුද්ගලයන් ලෙස පෙනී සිටීමට සිදුවන අයට, මෙම වෛද්‍ය සහතික ගැනීමට ඔවුන් සංක්‍රාන්ති බව තහවුරු කිරීමට එලෙස පෙනී සිටින පින්තූර පවා පෙන්වීමට සිදුවී ඇති පාරිභාෂිතය පිළිබඳ සීමිත අවබෝධය සමාජභාව අනන්‍යතාවයත් හා ප්‍රකාශයත් පටලවාගැනීමට හේතුවේ.
- පාරිභාෂිතය, දේශීයවුවත් පිටතින් ලැබුවක් වුවත්, සෑම විටම භාවිත කරන්නාව බල රහිත කළයුතු නැති අතර එය උපක්‍රමශීලිව ද භාවිතා කළ හැකිය. Queer යන යෙදුම සඳහා සිංහල හෝ දෙමළ පරිවර්තනයක් නොමැති වුවත්, සමහර ක්‍රියාකාරීන් දකින්නේ ඒවාට පරිවර්තනයක් අවශ්‍යය ම නොවන බවයි. ඔවුන්ට අනුව පාරිභාෂිතය අපගේ අයිතිවාසිකම් සඳහා වන අරගලයේ මෙවලමක් ලෙස තාවකාලිකව භාවිතකරන්නක් වන අතර ඒ අරගලය සඳහට ම පවතින්නේ ද නැත.
- සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවේ පුද්ගලයන් සමග කළ සාකච්ඡාවකට සහභාගී වූ අය කියා සිටියේ තම තමන් අතර පමණක් භාවිතවන වචන/යෙදුම්

කිහිපයක් ඇති බවයි. මෙම යෙදුම්වලින් සමහරක් ඔවුන්ගේ ම අනන්‍යතාවට ආමන්ත්‍රණය කරයි. මේ ආකාරයේ වචන ප්‍රජාව තුළ එකිනෙකාට සංඥා කිරීමේ ක්‍රමයක් ලෙස හෝ ඔවුන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සඳහා භාවිතා වේ. එම නිසා ඔවුන් අපෙන් ඉල්ලා සිටියේ එම රහස්‍යභාවය පවත්වා ගෙන යන ලෙසත්, එවැනි යෙදුම් මෙම වාර්තාව තුළින් බෙදා නොගන්නා ලෙසත් ය.

අපගේ කාර්යවල අප භාවිත කරන පාරිභාෂික මාලාවක් ඇත, දේශීයව හා අනාකෘතිකව භාවිත කරන පාරිභාෂිතයක් ද ඇත, ඉන් පසුව අපහාසාත්මක හා ප්‍රචණ්ඩකාරී ලෙස අපට එරෙහිව භාවිතවන යෙදුම් තිබේ. මේවා ප්‍රජාව තුළ භාවිත නොවන සහ පිටස්තර ඒවා වන නමුත් සමලිංගිකභීතිකාවෙන් භාවිත කළ භාෂාව අභියෝගයට ලක් කරන හෝ නැවත අරුත්ගන්වන අවස්ථා ද අපට පෙනේ.

- 2017 දී වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු තමාට එල්ල කළ සමභීතිකා අපවාදයකට ඇමති මංගල සමරවීර ප්‍රතිචාර දැක්වූ අවස්ථාවක් පිළිබඳව සහභාගීවූවෝ කතා කළහ. ඔහු කියා සිටියේ "මැරයෙක්, හොරෙක් හෝ මිනීමරුවෙක්ට වඩා" ඒ අපවාදයෙන් අදහස්වන කෙනා වීමට තමා කැමති බවයි. (වීරවර්ධන, 2017). ඔහු හා දේශපාලනිකව එකඟ නොවූවන් පවා කියා සිටියේ ඔහු එසේ ප්‍රසිද්ධියේ පෙනී සිටීම ගැන තමා ආඩම්බර වූ බවය.
- හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන "සමනලයා" යන පදය සමලිංගිකභීතික අරුතකින් භාවිත කළ විට, LGBTQ+ ජනතාව මෙයට විරෝධය දක්වා නොනැවතී "ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සමනල්ලු" යන නාමය යටතේ සංවිධානය වී එම යෙදුම නැවත ලබා ගත්හ.මීට පෙර සඳහන් කළ අමාත්‍ය සමරවීර ද සහයෝගය දක්වා ට්විටර් පණිවුඩයක් ප්‍රකාශ කළේ (සමරවීර, 2018) "මං කුඩැල්ලෙකු නොවී සමනලයෙකු ම වෙන්නං, ජනාධිපතිතුමනි" කියා ය.

**සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවේ පුද්ගලයන් සමග කළ සාකච්ඡාවකට සහභාගී වූ අය කියා සිටියේ තම තමන් අතර පමණක් භාවිතවන වචන/යෙදුම් 94 ඳ කොහේද කොහේද අපේ ලොවක් කිහිපයක් ඇති බවයි. මෙම යෙදුම්වලින් සමහරක් ඔවුන්ගේ ම අනන්‍යතාවට ආමන්ත්‍රණය කරයි**

දේශීය භාෂාවන්ට හා N+ ප්‍රදේශවලට ආවේණික වූ යෙදුම් නිපදවෙන්නේ LGBTQ+ ප්‍රජාවට එකිනෙකා හමුවීමට, සමාජානුයෝජනයට හා සචලවීමට මෙන් ම එකිනෙකා හා සන්නිවේදනය

කිරීමේ ක්‍රම ගොඩනැගුණු විටයි. සහභාගිවූවන් දැක්වූයේ සංක්‍රාන්ති නොවන සමලිංගිකපුරුෂයින්ට ඔවුන්ගේ ලිංගික දිශානතිය හේතුවෙන් වෙනස් ලෙස සැලකීම් කළද, කොළඹ මෙන් ම අනෙක් පෙදෙස්වල සංවිධානය හා සමාජගත වීමට ඔවුන්ට වැඩි ඉඩකඩ ලැබුණු බවයි. මේ නිසා ඔවුන් දකින්නේ සමලිංගික පුරුෂයන් සඳහා වූ ප්‍රජාව අතර වැඩි යෙදුම් ගණනක් සහිත දේශීය පාරිභාෂිතයක් හා ග්‍රාම්‍ය ව්‍යවහාරයක් ද ඇති බවයි. සංසන්දනාත්මකව බලන කල, පුරුෂයන්ට මෙන් හමුවීමට හා සමාජගතවීමට නිදහසත්, ස්වයායත්ත බවත් නොමැති සමලිංගික, ද්විලිංගික හා අතික්‍රාන්ත කාන්තාවන් අතර අලුතෙන් නිපදවූ යෙදුම් නැත.

ඉහත සාකච්ඡාවලින් හෙළි වූයේ ශ්‍රී ලංකාවේ සමාජභාවය සහ ලිංගික දිශානතිය හා සම්බන්ධ දෙමළ හා සිංහල වචනවලින් පොහොසත් දේශීය ශබ්දකෝෂයක් ඇති බවයි. මෙම වාර්තාවේ මුලින් සඳහන් කළ පරිදි, මෙම සාකච්ඡාවලින් ඇති වූ වචන හා ඉතිහාස ‘සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමාජභාවය හා ලිංගික දිශානතිය සඳහා වූ පාරිභාෂික පදමාලාව’ වෙත යොමු කිරීම අපි ඇරඹූයෙමු. අතීතයේ දී ඇතැම් පාරිභාෂික පද මාලා පැවතුන ද, මෙය ලාභනොලබන හෝ ව්‍යාපෘති සන්දර්භයකින් බැහැරව, පරිවර්තන හා උච්චාරණ මාර්ගෝපදේශ සහිතව සැකසෙන්නේ ප්‍රජාවේ වැඩි පිරිසකට එකිනෙකා භාවිතකරන යෙදුම් හඳුන්වා දීමටයි. මෙම පදමාලාව භාෂාව සහ පාරිභාෂිතය දේශීයකරණය කිරීමේ උත්සාහයක් වන අතර, එය යටත්විජිතහරණය යනු නොස්ටැල්ජියාවේ අභ්‍යාසයක් නොව අපගේ වර්තමාන යථාර්ථයන් ගොඩ නැගීමේ සාමූහික ප්‍රයත්නයක් බව පිළිගනී. මෙම ගොඩනැගීමේදී අපව මෙහි රැගෙන ආ යටත්විජිතකරණය ද ඇතුළු එහෙත් එයට සීමා නොවූ එකිනෙක හා ඡේදනයවන දේශපාලනයන්, ඉතිහාස හා සන්දර්භයන් ද සිහිතබාගත යුතු ය.

# නිර්දේශ

ශ්‍රී ලංකාව පුරා සිටින LGBTQ+ ජනතාව වැඩ, ජීවනෝපාය, අධ්‍යාපනය, තොරතුරු, ප්‍රමෝදය, මිතුරන් සොයාගැනීම, ප්‍රජාව සොයාගැනීම හා වෙනත් දේට අන්තර්ජාලය භාවිත කරයි. ඔවුන් පිළිබඳව වඩාත් පෙනීයන්නේ ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය හෝ ප්‍රචණ්ඩතව හා ඔවුන්ගේ අත්දැකීම් වුවත්, ප්‍රතිපත්තිසාදන්නන්, වේදිකා, මානව හිමිකම් ක්‍රියාකාරීන් හා ඩිජිටල් හිමිකම් හා ප්‍රකාශන නිදහස වෙනුවෙන් ක්‍රියාකරන්නන් විසින් සමූලයක් වශයෙන් ඔවුන්ගේ අත්දැකීම් සලකාබැලිය යුතුවේ.

පහත දැක්වෙන්නේ අපගේ අධ්‍යයනය පාදක කරගෙන ප්‍රධාන රාජ්‍ය හා රාජ්‍ය නොවන කාරකයන්හට ඉදිරිපත් කෙරෙන නිර්දේශයි.

**රාජ්‍යය කාරකයන් සඳහා නිර්දේශ:**



- ලිංගිකත්වය, සමාජභාවය හා ලිංගික චර්යාව පාදක කරගෙන පුද්ගලයින් සාපරාධීබවට පත් කරන නීතීන් අවලංගු කර, සංශෝධනය කරන්න. ඔවුන්ගේ අනන්‍යතා සාපරාධී, පහත් හා වෙනස් ලෙස සලකනතුරු LGBTQ+ ජනතාවට අන්තර්ජාල භාවිතය සඳහා නිදහස්, ආරක්ෂිත හා ප්‍රමෝදය දනවන ක්‍රම සකසා දීමට කැපවූ ප්‍රතිපත්ති, වැඩසටහන් හෝ වෙනත් උත්සාහයන් සම්පූර්ණයෙන් ඉටුකරගැනීම කළ නොහැකිය.

- රාජ්‍යය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා ඩිජිටල් ප්‍රතිපත්ති සකසන කාර්යයන් සඳහා LGBTQ+ පුද්ගලයින් ඇතුළත් කරගන්න. මෙය සිය ලිංගිකත්වය හා සමාජභාවය හේතුවෙන් ආන්තික ලෙස සැලකෙන ජනතාවගේ අවශ්‍යතා හා අත්දැකීම්වලින් මහජන ප්‍රතිපත්ති හා වැඩසටහන් දැනුවත්වීම තහවුරු කරයි. මෙයට LGBTIQ+ ජනතාවගේ ඩිජිටල් ආර්ථිකය, ඩිජිටල් සාක්ෂරතාව හා අන්තර්ජාල පිවිසුම ප්‍රවර්ධනය කරන වැඩසටහන් හා පුහුණුවීම ඇතුළත් වේ.

- ප්‍රජා-මුලික වූ විද්‍යුත්සන්නිවේදන යටිතල පහසුකම් ජාලා දියුණු කරන්න: අන්තර්ජාල ආවරණය යනු පිවිසුම නොවේ. දරාගත හැකි මිලකට හෝ නොමිලේ උපකරණ හා අන්තර්ජාල සබඳතා ලබා දීම ශුද්ධ මධ්‍යස්ථතාව ට බලනොපාන අන්දමින් පිවිසුම දියුණු කිරීමට අත්‍යාවශ්‍ය වේ. පිරිවැය හා පිවිසුම් ගැටලු නිරාකරණයට එක් මගක්වන්නේ ප්‍රජා-මුලික විද්‍යුත්සන්නිවේදන යටිතල පහසුකම් ය. පර්යේෂණ පෙන්වාදෙන්නේ (බිඩ්වෙල්, 2019) එවැනි ජාල පිහිටුවීමේදීත් ක්‍රියාත්මක කිරීමේදීත් අභියෝග මතුවුවත්, පාලනය හා පිරිවය අතින් වන වාසි විශේෂයන් ම ආන්තික මිනිස් කණ්ඩායම් සඳහා අන්තර්ජාල පිවිසුම පරිණාමනය කරනු ඇති බවයි.

- තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වයට එරෙහි නීති ක්‍රියාත්මක කිරීම හා ඒ හා කටයුතු කරන ICT නිලධාරීන්ගේ ධාරිතාවන් දියුණු කිරීම. මෙයට තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය හඳුනාගෙන එයට ප්‍රචණ්ඩත්වය ලෙසින් සැලකීම; හානිකර නොවන, ගොදුරුබවට පත්වූ අයට දොස් හෝ විවේචන නොනගන, අවසරය හා පෞද්ගලිකත්වය සහිත රාමුවක් තුළ මෙම සිද්ධි හසුරුවීමට පුහුණු කිරීම; සමාජභාව හා ලිංගිකත්ව අයිතින් මත පදනම් වූ වටහාගැනීමක් ඔස්සේ සංවේදීකෘත වීම මීට ඇතුළත් වේ.




- වෛරී ප්‍රකාශන හා තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වයට භාජනය වූ අයට රජය දක්වන ප්‍රතිචාර විකල්ප සහිත විය යුතුයි එයට ඇතුළත්වන්නේ:
  - පුළුල් ලෙස තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය රාජ්‍ය මානව හිමිකම් පොරොන්දු ඔස්සේ නිරාකරණය කිරීම සඳහා පවතින නීති අර්ථකථනය කරමින් සංශෝධනය කරමින් සම්පූර්ණයෙන් ම යෙදවීම. ලිංගික ප්‍රකාශනය ඇතුළු ප්‍රකාශන නිදහස තිර කරන පුළුල් නීති අනුමත හෝ ක්‍රියාත්මක කිරීමෙන් වැළකීම.
  - නොමිලේ ලබා දෙන විවේචනාතමක නොවන මානසික සෞඛ්‍යය හා මනෝසමාජීය උපකාර වෙත පිවිසියහැකිබව.
  - තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය වාර්තා කරන අයුරු පිළිබඳව තොරතුරු කරා පිවිසියහැකිබව; සිවිල් සමාජ ආයතන හා සම්බන්ධවීම මෙන් ම නීතිමය උපකාර ලබාගැනීම පිළිබඳව තොරතුරු.
- ඩිජිටල් ආරක්ෂාව, මාධ්‍යය සාක්ෂරතාව හා සවිස්තරාතමක ලිංගිකත්ව හා සබඳතා අධ්‍යාපනය  පිළිබඳව  පාසල් මට්ටමේ වැඩසටහන් නිර්මාණය කර ක්‍රියාත්මක කරන්න. මෙයට අවසරය, පෞද්ගලිකත්වය හා ශාරීරික ස්වයායත්තබව ආදී තමාව නිදහස් සුරක්ෂිත හා ප්‍රමෝදය දනවන ක්‍රමවලින් ප්‍රකාශනය කිරීමට අත්‍යාවශ්‍ය සංකල්ප හඳුන්වාදෙන්න.



- තොරතුරු ලබාගැනීමේ අයිතීන් උල්ලංඝනය කරන, ජනතාවගේ ආර්ථික හා සමාජීය ජීවිතවලට බලපෑ හැකි අන්තර්ජාල වසාදැමීම් කියා ද හැඳින්වෙන සිතාමතා ම සිදුකරන අන්තර්ජාල හා විද්‍යුත් සන්නිවේදන බිඳ දැමීම් නවතා දමන්න. මෙයට තාවකාලික අවහිරතා මෙන් ම විශේෂිත ප්‍රදේශ හා වේදිකා අවහිරතා ද අයත් වේ. අන්තර්ජාල වසාදැමීම් තොරතුරු ලබාගැනීමේ අයිතිය උල්ලංඝනය කරන අතර ජනතාවගේ ජීවිතවලට  ආර්ථික මෙන් ම සමාජීය බලපෑම් ද සිදුකරයි.
- විද්‍යුත්සන්නිවේදනය ආශ්‍රිත මහජන අධිකාරීන් නිල භාෂා ප්‍රතිපත්තියට බැඳී සිටිය යුතු අතර, සියලු ම තොරතුරු හා සේවා ත්‍රෛභාෂික කිරීමට වගබලාගතයුතු ය.

**සිවිල් සමාජ කාරකයන් සඳහා නිර්දේශ:**



- මිනිසුන්ගේ ලිංගිකත්වය, සමාජභාවය හා ලිංගික චාර්යාව පාදක කරගෙන ඔවුන්ව සාපරාධී ලෙස සලකන නීති හා ප්‍රතිපත්ති අවලංගු කිරීම වෙනුවෙන් පෙනීසිටින්න.

- සිංහල හා දෙමළ භාෂාවලින් ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය හා අයිතීන, ලිංගිකත්වය හා සමාජභාවය පිළිබඳව තොරතුරු ඇති අන්තර්ජාල මූලාශ්‍ර දියුණුකරන්න. තමන්ගේ හා අනුන්ගේ - ලිංගිකත්වය හා සමාජභාවය ඇතුළු ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය හා අයිතීන් පිළිබඳව පැහැදිළි කිරීම් කරගැනීමට ජනතාව අන්තර්ජාලය භාවිත කරති. එහෙත් පැහැදිළිව ම දේශීය භාෂාවලින් රචිත ඒවැනි තොරතුරු හුවමාරු කිරීමටත්, සාකච්ඡාකිරීමටත් LGBTQ+ ජනතාව ඇතුළු තවත් අයට උපකාරීවන අන්තර්ජාල අවකාශ නිර්මාණය විය යුතු ය.



- LGBTQ+ ප්‍රජාවට තමන්ගේ භාෂාවන්ගෙන් තම කථා පැවසීමටත, ඒවා බෙදාගැනීමට උපකාරී වීමටත් අවශ්‍ය සම්පත් වෙන් කරන්නී මෙයට ඔවුන්ගේ භාෂාවෙන් ඔවුන්ගේ ම දැනුම නිපයීම ද, ඒ දැනුම බෙදාහැරීම ද ඇතුළත් වේ.

- ජනතාවගේ අන්තර්ජාල පිවිසියහැකිබව, ඩිජිටල් සාක්ෂරතාව, ඩිජිටල් ආර්ථිකය ප්‍රවර්ධනය කරන තාක්ෂණික ආයතන හා සබැඳි පුහුණුකිරීම් හා වැඩසටහන්වලට සහයෝගය දක්වන්න.

- වෛරී ප්‍රකාශ හා ප්‍රචණ්ඩත්ව හමුවේ ඔවුන්ගේ අන්තර්ජාලාත්මක අයිතීන් මෙන් ම ඒවාට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව LGBTQ+ ප්‍රජාව අතර අවබෝධය හා දැනුම ශක්තිමත් කරවන්න.


- තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය ද සමාජභාව-පාදක කරගත් ප්‍රචණ්ඩත්වයේ කොටසක් ලෙස සලකමින් සිවිල් සමාජ සංවිධාන (CSOs) යනු මොනවාදැයි යන විෂය පථය පුළුල් කිරීම් මෙයට ඒ වෙනුවෙන් පෙනිසිටීම්, ව්‍යාපාර හා සහයෝගීතාවලට ප්‍රචණ්ඩත්වය හමු වේ ගැලවූවන් ද එක් කර ගැනීම ඇතුළත් වේ.

- වෛරී ප්‍රකාශන හා තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දක්වන විට:

  - තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය රාජ්‍ය මානව හිමිකම් පොරොන්දු ඔස්සේ නිරාකරණය කිරීම සඳහා පවතින නීති අර්ථකථනය කරමින් සංශෝධනය කරමින් සම්පූර්ණයෙන් ම යෙදවීම.

- පවතින නීති සම්පූර්ණයෙන් ම යෙදවීම වෙනුවෙන් පෙනිසිටීම; නොමිලේ ලබා දෙන විවේචනාත්මක නොවන මානසික සෞඛ්‍යය හා මනෝසමාජීය උපකාර වෙත පිවිසියහැකිබව ප්‍රචණ්ඩත්වය වාර්තා කරන අයුරු පිළිබඳව තොරතුරු ලබා දීම; ඒ හා කටයුතු කරන සිවිල් සමාජ ආයතන හා සම්බන්ධවීම මෙන් ම නීතිමය උපකාර ලබාගැනීම පිළිබඳව තොරතුරු. ඩිජිටල් ආරක්ෂාව, මාධ්‍යය සාක්ෂරතාව හා සවිස්තරාතමක ලිංගිකත්ව හා සබඳතා අධ්‍යාපනය පිළිබඳව පාසල් මට්ටමේ වැඩසටහන් නිර්මාණය කිරීම වෙනුවෙන් පෙනීසිටින්න,සහයෝගය ලබාදෙන්න. උල්ලංඝන හමුවේ සහන ගෙන ඒම සඳහා ඇති නෛතික මූලාශ්‍ර දියුණු කරන්න, ඩිජිටල් හිමිකම් ආරක්ෂා කිරීමට සහයෝගීවන්න.


### අන්තර්ජාල වේදිකා සඳහා නිර්දේශ:



- තාක්ෂණය හා බැඳුණු ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමට උපකාරීවන මානව අයිතිවාසිකම් සම්මත හා අනුකූල වූ පැහැදිලි ප්‍රජා මාර්ග නිර්දේශ, නියාම හා කොන්දේසි ඇතුළත් කරගන්න. මෙහි දී ජනතාවගේ අවශ්‍යතා ද ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වියහැකි සැබෑ නාම, බහු ගිණුම්, නිර්නාමිකබව පිළිබඳ ප්‍රතිපත්ති ද සලකාබලන්න.

- සිංහල හා දමිළ භාෂාවන්ගෙන් අන්තරගත මධ්‍යස්ථකරණය කිරීමට හැකියාවක් වේදිකාවලට තිබිය යුතු ය. LGBTQ+ ප්‍රජාවට එරෙහි වූ ප්‍රචණ්ඩත්වයන් ඇතුළු ඔවුන්ට ලැබෙන සියලු වාර්තා ඇමතීමට හැකියාවක් ද තිබිය යුතු ය.

### මාධ්‍යය සඳහා නිර්දේශ:



- සිය මාධ්‍යය වේදිකාවල LGBTQ+ ප්‍රජාව නිරූපණයේදීත් වාර්තාකරණයේදීත් වෙනස් කොට සැලකීමෙන් වැළකී සිටීමට වගබලාගැනීමට (අන්තර්ජාලයට ආවේණික වූ හා නොවන) සියලු ම අන්තර්ජාල මාධ්‍යය ක්‍රියාමාර්ග ගතයුතුයි. ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සමුළුවේ ආචාර ධර්ම සංග්‍රහයෙහි එන "පුද්ගලයෙකුගේ ජාතිය, වර්ණය, ආගම, ලිංගය හෝ ඕනෑම ශාරීරික හෝ මානසික රෝගයක් හෝ විබල්‍යතාවකක් පදනම් වූ පූර්වමතධාරී හෝ අවමන් කරන සඳහන් කිරීම් භාවිතයෙන් මාධ්‍යය වැළකී සිටිය යුතු ය" යන්න සමාජභාව අනන්‍යතාව හා ලිංගිකත්වය ද ඇතුළත්වන ලෙස යාවත්කාලීන කළ යුතු ය.

## ශාස්ත්‍රීය නියැලීම් සඳහා නිර්දේශ

- සමීක්ෂණ හා පර්යේෂණ දේශීයකරණය, දේශීය භාෂාවන්ට පරිවර්තනයට සීමා නොවී ඉන් ඔබ්බට ගමන් කළ යුතුය. දේශීයව භාවිතවන හා අවබෝධවන පදමාලාවන් භාවිත කිරීමටත, අත්දැකීම ලේඛනගතවන ප්‍රජාවන්ගේ අනුදැනුම සහිතව පමණක් ඒවා භාවිත කිරීමටත් කාලය හා වෙනත් සම්පත් වෙන් කළ යුතු ය.

- මෙම සමීක්ෂණයේ විෂය පථය පුළුල් කරන්න. මෙම සමීක්ෂණය වෙනත් පිහිටීම්වල නැවත සිදුකිරීමෙන් LGBTQ+ පුද්ගලයින් අතර අන්තර්ජාල භාවිතයේ ජනවිකාසය පිළිබඳ නාගරික-ග්‍රාමීය හා වත්කම් භේදනය ආදී අතිරේක සාධක ඔස්සේ තවත් දෑ ඉගෙන ගැනීමට හැකිය.

- මෙම පර්යේෂණයේ විෂය පථයෙන් පිටත වූ අනතර්ජාලය හා LGBTIQ+ ප්‍රජාවේ මානසික සෞඛ්‍යය අතර ඇති සබඳතා ගවේෂණය කරන්න. ඇතැම් ප්‍රතිචාරකයන් මානසික සෞඛ්‍යයට අන්තර්ජාලයෙන් සිදුවන වාසි හා අවාසි සාකච්ඡා කළත්, එය මෙම අධ්‍යයනයේ විෂය පථයට පරිබාහිර වූ නිසා ගැඹුරින් ගවේෂණය කිරීමට අපට නොහැකිවියී ප්‍රකාශනය, අනන්‍යතාව, ප්‍රජාව සොයාගැනීම ආදී අංශ පෙන්වාදෙන්නේ ලංකාවේ LGBTIQ+ ජනතාව හා මානසික සෞඛ්‍යය අතර් ඇති අන්තර්-සබඳතා පිළිබඳව පර්යේෂණ සිදුකිරීමට ඇති අවශ්‍යතාවයි.

- ලිංගික ප්‍රකාශන, අන්තර්ක්‍රියා හා ලිංගික ශ්‍රමය සඳහා වූ අවකාශයක් ලෙස අන්තර්ජාලය සලකා ඒ ගැන වැඩිදුර පර්යේෂණ කරන්න. සාපරාධීකරණ හා සමාජ අපකීර්තිය ඇතිවූ වාතාවරණයක කාමුක දර්ශන නිපැයුම, ඒ වෙත පිවිසුම හා බෙදාහැරීම, හුක්-අප් සංස්කෘතිය, ලිංගික ගනුදෙනුව හා භාවිතවන බහු වේදිකා පිළිබඳව විය හැක.

- පාරිභාෂික පදමාලාවේ (නව)යටත්විජිතවාදී පදනම ගවේෂණය කර ඒ හා සබැඳි දේශිය අභියෝග විමසන්නඃ උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් අතර නිතර භාවිතවන හා රාමුකරණයවන පාරිභාෂික පද යටත්විජිත ධූරාවලී ප්‍රතිනිර්මාණය කරන අයුරු, දැනට පවතින යටවිජිතහරණයේ අභ්‍යාස මෙයට අභියෝග එල්ල කරන අයුරු අධ්‍යයනය කළ හැක. ඇතුළත්වන ලෙස යාවත්කාලීන කළ යුතු ය.



# ආශ්‍රිත ග්‍රන්ථ

Access Now. (2020). TARGETED, CUT OFF, AND LEFT IN THE DARK. The #KeepItOn report on internet shutdowns in 2019. https://www.accessnow.org/cms/assets/uploads/2020/02/KeepItOn-2019-report-1.pdf

Aingkaran. [@Aingkaran]. (2019, December 11). The official news portal of Government of Sri Lanka @newsdotlk has tweeted 65 times since Mr. @GotabayaR became the President. Not a single tweet in Tamil. Lack of resources, @ErandaGinige? [Tweet]. https://twitter.com/AingkaranK/status/1204731566796267520?s=20

Al Jazeera. (2020, February 4). Sri Lanka scraps Tamil national anthem at Independence Day. https://www.aljazeera.com/news/2020/02/sri-lanka-scraps-tamil-national-anthem-independence-day-200204103334093.html

Blog Tyrant. (2020). Is blogging finally dead?. https://www.blogtyrant.com/is-blogging-finally-dead/

Bidwell, N.J., & Jensen, M. (2019). Bottom-up connectivity strategies: Community-led small-scale telecommunication infrastructure networks in the global South. Association for Progressive Communications. https://www.apc.org/sites/default/files/bottom-up-connectivity-strategies_0.pdf

Castells, M., (2000). Materials for an exploratory theory of the network society. British Journal of Sociology, 51(1), pp.5–24.

Chamara, S. (2019, November 10). Out of the closet, onto the discussion table. Ceylon Today. https://ceylontoday.lk/news-more/8924

Code of Professional Practice (Code of Ethics) of the Editors Guild of Sri Lanka and Free Media Movement.
https://freemediasrilanka.wordpress.com/code-of-ethics/

Colombo Times. (2020, February 19). Colombo court rules prostitution is not punishable offence.
http://colombotimes.net/colombo-court-rules-prostitution-is-not-punishable-offence/

Davis, M. (2019, June 14). Will coding become a basic life skill? Yes and no, say experts. Big Think.
https://bigthink.com/technology-innovation/coding-life-skill

De Sayrah, A. (2017). Lost in Translation: Shortfalls in the implementation of Sri Lanka's official languages policy. Groundviews.
https://groundviews.org/2017/02/20/lost-in-translation-shortfalls-in-the-implementation-of-sri-lankas-official-languages-policy/

Deshapriya, P., Mendis, M., Wijewardena, S., Wijesiriwardena, S., Kottegoda, S., & Brown, S. (2017). Disrupting the Binary Code: Experiences of LGBT Sri Lankans Online. Women and Media Collective.
https://womenandmedia.org/wp-content/uploads/2018/02/Disrupting-the-Binary-Code-_-for-web.pdf

Ellawala, T.I. Mismatched Lovers: Exploring the Compatibility Between LGBTQ+ Identity Theories and Gender and Sexual Plurality in Sri Lanka. Sexuality & Culture 22, 1321–1339 (2018). https://doi.org/10.1007/s12119-018-9528-0

Feminist Principles of the Internet.
https://feministinternet.org/en/principle/usage

Galpaya, H., Zainudeen, A., & Amarasinghe, T. (2019). AfterAccess: ICT access and use in Sri Lanka and the Global South (Presentation). LIRNEasia.
https://lirneasia.net/2019/05/afteraccess-ict-access-and-use-in-sri-lanka-and-the-global-south-presentation/

Ghosha, Groundviews, & Hashtag Generation. (2019). Opinions, B*tch: Technology Based Violence Against Women in Sri Lanka.
https://groundviews.org/2019/06/27/opinions-btch-technology-based-violence-against-women-in-sri-lanka/

Gineers Now. (2020). Everything You Need to Know About Low-Code Development Platforms.
https://gineersnow.com/engineering/software/everything-you-need-to-know-about-low-code-development-platforms

Gopikrishna, K. [@KanagaGopi]. (2020, April 18). Waiting for the PMD to post an English or Tamil version of the PR so that I can fully understand what's happening in my country. [Tweet]. https://twitter.com/KanagaGopi/status/1251507733515235328?s=20
GSMA Intelligence. (2020, April 16). Groundwork being laid for Sri Lanka's foray into 5G. Daily News.
http://www.dailynews.lk/2020/04/16/local/216485/groundwork-being-laid-sri-lanka%E2%80%99s-foray-5g

Human Rights Watch. (2016). "All Five Fingers Are Not the Same" Discrimination on Grounds of Gender Identity and Sexual Orientation in Sri Lanka.
https://www.hrw.org/report/2016/08/15/all-five-fingers-are-not-same/discrimination-grounds-gender-identity-and-sexual

Human Rights Watch. (2020). Sri Lanka: Security Agencies Shutting Down Civic Space.
https://www.hrw.org/news/2020/03/03/sri-lanka-security-agencies-shutting-down-civic-space

Ivarsson, C.H., (2019). Lion's blood: social media, everyday nationalism and anti-Muslim mobilisation among Sinhala-Buddhist youth. Contemporary South Asia, 27:2, 145-159, DOI: 10.1080/09584a935.2018.1528210

Jayasinghe, P. (2019). Pride Under Emergency. Groundviews.
https://groundviews.org/2019/06/28/pride-under-emergency/

Jayasuriya, S. (2020, February 23). 5G to be rolled out in Sri Lanka soon. Sunday Observer.
https://www.sundayobserver.lk/2020/02/23/business/5g-be-rolled-out-sri-lanka-soon

Kadirgamar, A. (2013). Second Wave of Neoliberalism: Financialisation and Crisis in Post-War Sri Lanka. Economic and Political Weekly.
https://www.epw.in/journal/2013/35/web-exclusives/second-wave-neoliberalism-financialisation-and-crisis-post-war-sri

Kastrenakes, J. (2018, February 12). German court says Facebook's real name policy is illegal. The Verge.
https://www.theverge.com/2018/2/12/17005746/facebook-real-name-policy-illegal-german-court-rules

Lanka Standard. (2012, December 6). Call to protect Sharmila Seyyid's right to free speech.
http://www.lankastandard.com/2012/12/call-to-protect-sharmila-seyyids-right-to-free-speech/

Miller, Jody., & Nichols, Andrea., (2012). Identity, Sexuality and Commercial Sex among Sri Lankan Nachchi. Sexualities 15(5/6) 554–569. DOI: 10.1177/1363460712446120

Ministry of Digital Infrastructure and Information Technology (MDIIT) & Information and Communication Technology Agency of Sri Lanka (ICTA). (2019). National Digital Policy for Sri Lanka 2020-2025. http://www.mdiit.gov.lk/index.php/en/what-we-diliver/publications/action-plan/send/6-legislation/76-national-digital-policy

NetBlocks. (2018). Counting the cost of Sri Lanka's internet shutdown. https://netblocks.org/reports/sri-lanka-internet-shutdown-economic-impact-VxyM7EAZ

NetBlocks. (2019). Sri Lanka blocks social media for third time in a month. https://netblocks.org/reports/sri-lanka-blocks-social-media-for-third-time-in-one-month-M8JRjg80

Perera, J. (2016). Ethno-Religious Nationalism Raises Its Head in Sri Lanka. The Citizen. https://www.thecitizen.in/index.php/en/NewsDetail/index/5/9359/Ethno-Religious-Nationalism-Raises-Its-Head-in-Sri-Lanka

Perera, S. (2011). Reflections on Issues of Language in Sri Lanka: Power, Exclusion and Inclusion. Groundviews. https://groundviews.org/2011/10/24/reflections-on-issues-of-language-in-sri-lanka-power-exclusion-and-inclusion/

Samaraweera, M. [@MangalaLK]. (2018, November 5). I would rather be a butterfly than a leech Mr.President !!! @MaithripalaS #CoupLK #ConstitutionalCrisisSriLanka #FakePM #illegalgovernment #lka [Tweet]. https://twitter.com/MangalaLK/status/1059461522416558082?s=20

Sri Lanka Brief. (2014-2017). LGBT Rights.
https://srilankabrief.org/tag/lgbt-rights/

Weerawardhana, C. (2017, May 8). Standing Up For The Gay Politician: Mangala Samaraweera On Right Track? Colombo Telegraph.
https://www.colombotelegraph.com/index.php/standing-up-for-the-gay-politician-mangala-samaraweera-on-right-track/

Wickramasinghe, K. (2020, January 3). When conservatism gets in the way of sex education. Daily Mirror.
http://www.dailymirror.lk/news-features/WHEN-CONSERVATISM-GETS-IN-THE-WAY-OF-SEX-EDUCATION-Comprehensive-Sexuality-Education-in-SL/131-180620

Wijesiriwardena, S. (2017). Where have all the queer women gone?. GenderIT.org.
https://www.genderit.org/editorial/editorial-where-have-all-queer-women-gone

Women and Media Collective. (2016). Submission on LGBTIQ Persons and Transitional Justice Mechanisms. Groundviews.
https://groundviews.org/2016/08/25/submission-on-lgbtiq-persons-and-transitional-justice-mechanisms/

World Telecommunication/ICT Indicators Database. (2019).
https://www.itu.int/en/ITU-D/Statistics/Pages/publications/wtid.aspx

# ඇමුණුම්

# ඇමුණුම 1- පදමාලාව

### LGBTQ+

සමලිංගික ස්ත්‍රී, සමලිංගික පුරුෂ, ද්විලිංගික, සංක්‍රාන්තිලිංගික හා අතික්‍රාන්ත(හඳුනානොගත් සමාජභාව ඇති) මෙන් ම වෙනත් සමාජභාව අනන්‍යතා හා ප්‍රකාශන, ලිංගිකත්ව මෙන් ම ලිංගික චර්යා ඇති ජනතාව.

Gender සමාජභාවය ලිංගය යනුවෙන් හැඳින්වෙන්නේ ස්ත්‍රී පුරුෂභාවයන්ගේ ජීවවිද්‍යාත්මක අංගයි සමාජභාවය කතා කරන්නේ චර්යාත්මක, සමාජීය, සංස්කෘතිය හා පුරුෂභාවයේත් ස්ත්‍රීත්වයේත් අඛණ්ඩතාවේ වෙනත් අංග පිළිබඳවයි.

### Gender Identity සමාජභාව අනන්‍යතාව

පුරුෂ, ස්ත්‍රී හෝ වෙනත් සමාජභාවයක් වීම පිළිබඳව පුද්ගලයෙකුට ඇති දැනීම.

### Gender Expression සමාජභාව ප්‍රකාශනය

තමාගේ සමාජභාවයේ අංග හා සමාජභාව භූමිකා ප්‍රකාශනය කිරීමට පුද්ගලයෙකු තමාගේ පෙනුම ආදිය ද ඇතුළුව තමාව ම පිළිගන්වන ආකාරයි සමාජභාව ප්‍රකාශනය සැමවිට ම කෙනෙකුගේ සමාජභාව අනන්‍යතාවට සමාන නොවේ.

### සිස්-ටැබාැර සිස්-සමාජභාව/ සංක්‍රාන්තිනොවන

උපතේදී හිමි වූ සමාජභාවය හා හඳුනාගැනීම.

### Transgender සංක්‍රාන්ති සමාජභාව

උපතේදී හිමි වූ සමාජභාවය නොවන වෙනත් සමාජභාවයක් හා හඳුනාගැනීම.

### Sexuality ලිංගිකත්වය

ලිංගිකත්වයට ලිංගික, සමාජභාව අනන්‍යතා හා භූමිකා, සමාජභාව ප්‍රකාශන, ලිංගික දිශානති, ශෘංගාරය, ප්‍රමෝදය, ඇඟැලුම්කම ආදිය අයත් වේ. ලිංගිකත්වය සිතුවිලි, ෆැන්ටසි, ආශාව, විශ්වාස, ආකල්ප, සාරධර්ම, චර්යා, සිරිත්, භූමිකා හා සබඳතා ඔස්සේ ප්‍රකාශනය කිරීමට, අත්විඳීමට හැකිවේ. ලිංගිකත්වයේ මේ සියලු පරිමාණයන් ඇතුළු විය හැකි වුවත් හැමවිටකම මේ සියල්ල ම එකවර අත්දැකිය හෝ ප්‍රකාශනය කළ නොහැක. ජීවවිද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක, සමාජීය, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, නෛතික, ඓතිහාසික, ආගමික මෙන් ම අධ්‍යාත්මික සාධක ද ලිංගිකත්වයට බලපායි.

**Sexual Orientation ලිංගික දිශානතිය**

සමාන සමාජභාවයක්/ලිංගයකට අයත් අය, වෙනත් සමාජභාවයක්/ලිංගයකට අයත් අය හෝ සමාජභාව/ලිංග කිහිපයකට අයත් අය හා ඇඟැලුම් චිත්තවේගී, ප්‍රේමාන්විත හා/හෝ ලිංගික සබඳතා ඇති කරගැනීමට ඇති ආශාව් එසේ නැතිනම් එවැනි ආශාවක් නොමැතිබව.

**Lesbian සමලිංගික කාන්තා**

කාන්තා කියා හඳුන්වාගන්නා පුද්ගලයන් වෙත ඇඟැලුම් චිත්තවේගීව, ප්‍රේමාන්විතව හා/හෝ ලිංගිකව ආකර්ෂණය වන තමා කාන්තා කියාහඳුන්වාගන්නා පුද්ගලයන්.

**Gay සමලිංගික පුරුෂ**

පුරුෂ කියා හඳුන්වාගන්නා පුද්ගලයන් වෙත ඇඟැලුම් චිත්තවේගීව ප්‍රේමාන්විතව හා/හෝ ලිංගිකව ආකර්ෂණය වන තමා පුරුෂ යැයි හඳුන්වාගන්නා පුද්ගලයන්. 'සමලිංගික චර්යා' වල යෙදෙන සියලු පුරුෂයින් සමලිංගික පුරුෂයන් ලෙස හඳුනාගන්නේ නැති ඇතැම්විට සමාජභාවය කුමක් වුවත් විෂමලිංගික ලෙස හඳුනානොගන්නා ඕනෑම කෙනෙකු පිළිබඳ කතා කිරීමට ද මෙම යෙදුම භාවිත කරයි.

**Queer අතික්‍රාන්ත/ හඳුනානොගත් සමාජභාව**

විෂමලිංගික හා ඒකසහකාර නොවන බහුතරයේ නේක වරගයේ ලිංගික අභිමත දිශානති හා සිරිත් වැළඳග න්නා පුළුල් නිර්වචනයකි. අතික්‍රාන්ත යන කාණ්ඩයට ස්ත්‍රී සමලිංගික, පුරුෂ සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති පුද්ගලයින්, අන්තර්ලිංගික, රැඩිකල් ලිංගික ප්‍රජා හා ඔවුන්ගේ ලිංගිකත්වය ගවේෂණය කරන අය ද අයත් වේ. මෙම යෙදුම සමහරවිට ඔවුන් ආකර්ෂණයවන්නේ කාටදැයි නොපවසා විෂම-නොවන දිශානතියක් ඇරඹීමට ද භාවිත වේ. ඉංග්‍රීසිභාෂිත රටවල නිගාවක් ලෙස යෙදුණු පදයක් ප්‍රතිභාවිතයට ගැනීමෙන් අවමන් වූ කණ්ඩායම විසින් ම එහි අර්ථය උඩුයටිකුරු ගසා ඇත.

**Bisexual ද්වීලිංගික**

එක් සමාජභාවයකට වඩා ඇඟැලුම් චිත්තවේගී, ප්‍රේමාන්විත හා/හෝ ලිංගිකව ආකර්ෂණය වීම.

**Pansexual සර්වලිංගික**

සමාජභාවය නොතකා කෙනෙකුට ඇඟැලුම්, චිත්තවේගී, ප්‍රේමාන්විත හා/හෝ ලිංගිකව ආකර්ෂණය වීම.

**Non-binary බයිනරි නොවන / ද්වීමය නොවන**

පුරුෂ/කාන්තා ද්වීමය හා හඳුනානොගන්නා පුද්ගලයින් භාවිත කරන සමාජභාවයකි.

**Intersex අන්තර්ලිංගික**

අපේක්ෂිත ස්ත්‍රී පුරුෂ රටාවන්ට වෙනස් වූ වර්ණදේහ, හෝමෝන,ඇතුළත් ලිංගික අවයව හා ලිංගේන්ද්‍රිවල එකතුවක් හඳුන්වන යෙදුමකි.

**Heteronormativity විෂමසම්මතය**

පුද්ගල හෝ ආයතන තුළ සියලු දෙනා ම විෂමලිංගික බවත්, විෂමලිංගික බව අනෙක් ලිංගික දිශානති වලට වඩා උසස් යන උපකල්පනය.

**Coming out අනන්‍යතාව පිළිබඳ පිටත පැමිණීම**

පුද්ගලයෙකු තමාගේ ලිංගික දිශානතිය හෝ සමාජභාව අනන්‍යතාව ප්‍රථමවරට පිළිගන්න, භාරගන්න හා අගය කරන ක්‍රියාවලිය.

**Homophobic සමභීතිකාව**

විෂමලිංගික නොවන පුද්ගලයන් කෙරෙහි ඇති බිය, වෛරය හා අපහසුතාව.

**Transphobic සංක්‍රාන්තිභීතිකාව**

සංක්‍රාන්ති පුද්ගලයන් කෙරෙහි ඇති බිය, වෛරය හා අපහසුතාව.

**Ethnicity ජනවර්ගය**

සංස්කෘතික බැඳීම්, අතීත වාග්විද්‍යාත්මක උරුම, ආගමික සබඳතා, හිමිකම් කියූ ඥාතිත්වය හා ඇතැම් භෞතික ගතිලක්ෂණ මතපදනම් වූ පොදු පරපුරක හැඟීමකි.

**Technology-related violence තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය**

දුරකථන, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය වේදිකා හා ඊතැපෑල වැනි තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) භාවිත කරමින් සිදුකරන, අනුබලදෙන හෝ උග්‍ර කරවූ සමාජභාව-පාදක කරගත් ප්‍රචණ්ඩකාරී ක්‍රියා තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වයට අයත් වේ.

# ඇමුණුම 2 - ප්‍රමාණාත්මක සමීක්ෂණය

1. සිටිනා ස්ථානය:

- ○ බංගලිදේශය
- ○ නේපාලය
- ○ ශ්‍රී ලංකාව

2. ඔබ නියැලී සිටින්නේ කෙබඳු ක්‍රියාකාරකම් වල ද?

- ○ රාජ්‍ය නොවන ආයතනයක
- ○ ශාස්ත්‍රීය හෝ පර්යේෂණාත්මක ආයතනයක
- ○ ශිෂ්‍ය
- ○ නොබැඳි/නිදහස් වෘත්තිකයෙකු ලෙස
- ○ කලාකරුවෙක් ලෙස
- ○ මානව හිමිකම් ක්‍රියාධරයෙක් ලෙස
- ○ රාජ්‍ය සේවකයකු ලෙස
- ○ පුද්ගලික අංශයේ සේවකයකු ලෙස
- ○ රැකියා විරහිතයි
- ○ වෙනත් (කරුණාකර විස්තර කරන්න):

3. ඔබගේ වයස:

4. (අදාළ සියල්ල තෝරන්න) ඔබ:

සමාජභාවය:

- ○ සංක්‍රාන්ති නොවන කාන්තාවකි (උපතේ දී ඔවුන්ට ලබාදුන් ස්ත්‍රී සමාජභාවය හා හඳුනාගන්නා කාන්තාවන්)
- ○ සංක්‍රාන්ති නොවන පුරුෂයෙකි කාන්තාවකි (උපතේ දී ඔවුන්ට ලබාදුන් පුරුෂ සමාජභාවය හා හඳුනාගන්නා පුරුෂයන්)
- ○ සංක්‍රාන්ති කාන්තාවකි (උපතේ දී පුරුෂ ලෙස සඳහන් කළත් කාන්තාවන් වන අය)
- ○ සංක්‍රාන්ති පුරුෂයෙකි (උපතේ දී ස්ත්‍රී ලෙස සඳහන් කළත් පුරුෂ වන අය)
- ○ අන්තර් ලිංගික වේ (අපේක්ෂිත ස්ත්‍රී පුරුෂ රටාවන්ට වෙනස් වූ වර්ණදේහ, හෝමෝන්, ඇතුළත්
- ○ ලිංගික අවයව හා ලිංගේන්ද්‍රිවල එකතුවක් හඳුන්වන යෙදුමකි)
- ○ නොන්-බනරි  පුරුෂ/කාන්තා ද්වීමය හා හඳුනානොගන්නා පුද්ගලයින් භාවිත කරන සමාජභාවයකි

- ජෙන්ඩර් ක්වියර් / ජෙන්ඩර් නොන්-කොන්ෆෝමිං බනරි පුරුෂ/කාන්තා ද්වීමය හා හඳුනානොගන්නා පුද්ගලයින් භාවිත කරන සමාජභාවයකි
- නොකියා සිටීමට කැමතියි
- තමන් විසින්ම හඳුන්වා දීමට කැමතියි
- වෙනත් (කරුණාකර විස්තර කරන්න):

4. (අදාළ සියල්ල තෝරන්න) ඔබ:

සමාජභාවය:

- සංක්‍රාන්ති නොවන කාන්තාවකි (උපතේ දී ඔවුන්ට ලබාදුන් ස්ත්‍රී සමාජභාවය හා හඳුනාගන්නා කාන්තාවන්)
- සංක්‍රාන්ති නොවන පුරුෂයෙකි කාන්තාවකි (උපතේ දී ඔවුන්ට ලබාදුන් පුරුෂ සමාජභාවය හා හඳුනාගන්නා පුරුෂයන්)
- සංක්‍රාන්ති කාන්තාවකි (උපතේ දී පුරුෂ ලෙස සඳහන් කළත් කාන්තාවන් වන අය)
- සංක්‍රාන්ති පුරුෂයෙකි (උපතේ දී ස්ත්‍රී ලෙස සඳහන් කළත් පුරුෂ වන අය)
- අන්තර් ලිංගික වේ (අපේක්ෂිත ස්ත්‍රී පුරුෂ රටාවන්ට වෙනස් වූ වර්ණදේහ, හෝමෝන්, ඇතුළත්
- ලිංගික අවයව හා ලිංගේන්ද්‍රිවල එකතුවක් හඳුන්වන යෙදුමකි)
- නොන්-බනරි පුරුෂ/කාන්තා ද්වීමය හා හඳුනානොගන්නා පුද්ගලයින් භාවිත කරන සමාජභාවයකි
- ජෙන්ඩර් ක්වියර් / ජෙන්ඩර් නොන්-කොන්ෆෝමිං බයිනරි පුරුෂ/කාන්තා
- ද්වීමය හා හඳුනානොගන්නා පුද්ගලයින් භාවිත කරන සමාජභාවයකි
- නොකියා සිටීමට කැමතියි
- තමන් විසින්ම හඳුන්වා දීමට කැමතියි
- වෙනත් (කරුණාකර විස්තර කරන්න):

෧. ලිංගික දිශානතිය:

- විශමලිංගික (අනෙක් සමාජභාවයේ/ලිංගයේ පුද්ගලයන්ට ආකර්ෂණය වීම)
- සමලිංගික, පිරිමි (තමන්ගේ ම සමාජභාවය/ලිංගයේ පුද්ගලයන්ට ආකර්ෂණය වන සමහර පුරුෂයින් (සියල්ලොම නොවේ) භාවිත කරන්නකි
- සමලිංගික, කාන්තා (තමන්ගේ ම සමාජභාවය/ලිංගයේ පුද්ගලයන්ට ආකර්ෂණය වන සමහර කාන්තාවන් (සියල්ලොම නොවේ) භාවිත කරන්නකි
- ද්විලිංගික/සර්වලිංගික (පුරුෂ, ස්ත්‍රී හා බයිනරි නොඅවන් අය කරා ආකර්ෂණය මෙය එකම මට්ටමක ආකර්ෂණයක් නොහඟවයි, එහෙත් සමාජභාව දෙකකට වඩා ඇති සැලකියයුතු ආකර්ෂණ මීට අයත් වේ)
- ක්වියර්

- නොකියා සිටීමට කැමතියි
- තමන් විසින්ම හඳුන්වා දීමට කැමතියි
- වෙනත් (කරුණාකර විස්තර කරන්න):

4. වෙනත්

- ආබාධිත හෝ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයෙකි
- ජනවාර්ගික සුළුතරයක අයත් පුද්ගලයෙකි
- ආදිවාසී ප්‍රජාවට අයත් පුද්ගලයෙකි
- සංක්‍රමණික / සංක්‍රමික පුද්ගලයෙකි
- කුලය හේතුවෙන් වෙනස්කොට සැලකීම් වලට ලක්වන්නෙකි
- ජාතිය හේතුවෙන් වෙනස්කොට සැලකීම් වලට ලක්වන්නෙකි
- නොකියා සිටීමට කැමතියි
- තමන් විසින්ම හඳුන්වා දීමට කැමතියි
- වෙනත් (කරුණාකර විස්තර කරන්න):

ඊ-මේල් හෝ ඔබ ඇමතිය හැකි වෙනත් තොරතුරු (කැමතිනම් පමණක්):

6. ඔබට කථා කළ හැකි භාෂා:

7. අන්තර්ජාලයේ ඔබ භාවිත කරනා භාෂා:

- ප්‍රවේශය

8. ඔබ අන්තර්ජාලයට පිවිසෙන්නේ කොහේ සිට ද? (අදාළ සියල්ල තෝරන්න)

- ගෙදර සිට
- රාජකාරි කාර්යයාලයේ දී සිට
- ගමන්ගන්නා විට
- නෙට් කැෆෙ එකක සිට
- වෙනත්:

9. ඔබ බහුලවම අන්තර්ජාලයට පිවිසෙන්නේ කුමන උපකරණයක් හරහා ද?

- ඩෙස්ක්ටොප් පරිගණයක් හරහා
- ලැප්ටොප් පරිගණයක් හරහා

- ජංගම දුරකථනය හරහා
- ටැබ් එකක් හරහා
- වෙනත්:

10. පහත සඳහන් කියමන් හා අදාළව ඔබගේ නිපුණතාවය 1 හා 10 අතර පරාසයක ශ්‍රේණිගත කිරීමට කිවහොත්, එනම්, ඉතා පහසුවෙන් කළ හැකි දෙයක් නම් 10 ද, කිසි විටෙකත් එවැනි දෙයක් කර නැත්නම් 1 ද වන ලකුණු පරාසයක් තුළ, ඔබ ඔබටම ලබා දෙන ශ්‍රේණිය කුමක්ද?

- වෙබ්අඩවියක් නිර්මාණය කළ හැකියි
- පරිගණක මෘදුකාංග නිර්මාණය කළ හැකියි
- ගූගල් වැනි අන්තර්ජාලය සෙවීමේ සේවා භාවිතා කළ හැකියි
- සමාජ ජාලා තුළ සහභාගී විය හැකියි
- බ්ලොග් සටහන් පවත්වාගෙන යා හැකියි
- අන්තර්ජාලීය ගෲප් හා සංවාද පිටි තුළ සහභාගී විය හැකියි

11. ඔබ බහුලවම අන්තර්ජාලයට පිවිසීමට භාවිත කරනා උපකරණයට අදාළව ඔබට කෙතරම් නිදහසක් තිබේ ද?

- පූර්ණ නිදහස (එය මට අයිතිය; එහි භාවිතය වෙන කිසිවකු සමග බෙදා නොග
- නිමි; එහි භාවිතියට වෙන කිසිවකුගේ අවසරය අවශ්‍ය නොවේ)
- යම්තාක් දුරකට නිදහසක් ඇත
- නිදහසක් නැත (එය මට අයිති නොවේ; වෙන අය සමග එහි භාවිතය බෙදා ගැනීමට සිදු වේ; එහි භාවිතයට වෙනකෙකුගේ අවසරය අවශ්‍ය වේ

12. පරිගණක හෝ දුරකථන මෘදුකාංගයක් ඔබගේ උපකරණයට භාගත කිරීමට පෙර ඔබ කෙතරම් දුරට ඊට අදාළ කොන්දෙසි හා නියමයන් කියවනවා ද?

- සෑම විටම
- බොහෝ විට
- සමහර විට
- කිසි විටෙකත් නැත

භාවිතය

13. ඔබගේ සමාජභාවය ඔබ අන්තර්ජාලය පරිහරණය කිරීමේ දී බලපෑමක් වී තිබේ ද?
නිසැකවම  සමහර අවස්ථාවලදී  සැකයක් ඇත  මම නොදනිමි

14. ඔබගේ ලිංගික දිශානතිය ඔබ අන්තර්ජාලය පරිහරණය කිරීමේ දී බලපෑමක් වී තිබේ ද?
නිසැකවම  සමහර අවස්ථාවලදී සැකයක් ඇත  මම නොදනිමි

15. අන්තර්ජාලයට ඇති ප්‍රවේශය නිසා ඔබට සමාජභාවය හා ලිංගික
දිශානතිය පිලිබඳ ඇති අවබෝදය වෙනස් වී ඇත් ද?
නිසැකවම  සමහර අවස්ථාවලදී  සැකයක් ඇත  මම නොදනිමි

16. අන්තර්ජාලයට ඇති ප්‍රවේශය නිසා වෙනත් සමාජභාවයකට හෝ ලිංගික දිශානතියකට
අයත් පුද්ගලයකු දෙස ඔබ බලනා ආකාරය වෙනස් වී ඇත් ද?
නිසැකවම  සමහර අවස්ථාවලදී  සැකයක් ඇත  මම නොදනිමි

අදහස් ප්‍රකාශ කිරීම

17. එකත් දහයත් අතර පරාසයක් තුළ□ ඔබගේ ආත්ම ප්‍රකාශය සඳහා අන්තර්ජාලය කෙතරම් වැදගත් ද? (අත්‍යාවශ්‍ය නම් 10 ද, කොහෙත්ම අවශ්‍ය නැත්නම් 1 ද ලෙස සලකන්නී කරුණාකර ඔබගේ පිළිතුරට හේතුව දක්වන්නී

18. ඔබ අන්තර්ජාලය භාවිතා කරන්නේ කුමන ප්‍රයෝජන සඳහා ද? (අදාළ සියල්ල තෝරන්න)

| | සැමවිටම | සමහරවිට | ඉඳහිට | කිසි විටෙකත් නොවේ |
|---|---|---|---|---|
| රාජකාරී හේතු සඳහා | ○ | ○ | ○ | ○ |
| තොරතුරු ලබා ගැනීමට | ○ | ○ | ○ | ○ |
| ජීවනෝපාය සඳහා | ○ | ○ | ○ | ○ |
| පෙම් ඇසුරන් හමු වීමට | ○ | ○ | ○ | ○ |
| චැට් කිරීමට | ○ | ○ | ○ | ○ |
| ඇමතුම් ලබා ගැනීමට | ○ | ○ | ○ | ○ |
| බැංකු හා මූල්‍ය ගනුදෙනු සඳහා | ○ | ○ | ○ | ○ |
| ලිංගික ස්වරූපයකින් යුත් පණිවුඩ හුවමාරු කිරීමට | ○ | ○ | ○ | ○ |

| | | | | |
|---|---|---|---|---|
| ලිංගික/සරාගී වීඩියෝ හා පින්තූර නැරඹීම සඳහා | ○ | ○ | ○ | ○ |
| ක්‍රීඩා/ගේම්ං සඳහා | ○ | ○ | ○ | ○ |
| සමාජ ජාලාවල සහභාගී වීමට | ○ | ○ | ○ | ○ |
| සෞඛ්‍යාශ්‍රිත තොරතුරු ලබාගැනීමට (ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යයත්, පිළිසිඳගැනීම හා ඔසප් චක්‍ර හා අදාළ මෘදුකාංග ද ඇතුළුව) | ○ | ○ | ○ | ○ |
| සෘජුවම වීඩියෝ නැරඹීමට | ○ | ○ | ○ | ○ |
| බ්ලොග් සටහන් සඳහා | ○ | ○ | ○ | ○ |
| සංවාද පිටි | ○ | ○ | ○ | ○ |
| ඊ-මේල් | ○ | ○ | ○ | ○ |
| ක්ෂණික පණිවුඩ සඳහා | ○ | ○ | ○ | ○ |
| ලිංගික තෘප්තිය සඳහා | ○ | ○ | ○ | ○ |
| සෙවීමේ සෙවා හා වෙනත් වෙබ්අඩවි | ○ | ○ | ○ | ○ |
| වෙනත් | ○ | ○ | ○ | ○ |

19. අන්තර්ජාලයේ පළ වන නිපැයුම් (බ්ලොග්ස්, ව්ලොග්ස්, මීම්ස්, මෘදුකාංග වැනි දෑ) පිළිබඳ ඔබගේ පරිභෝජකත්වය කෙතරම් බහුල ද?:

○ දිනපතා
○ සතිපතා
○ මාසිකව එක් වරක්වත්
○ කලාතුරකින්
○ කිසි විටෙකත් නැත

19. අන්තර්ජාලයේ එවැනි නිපැයුම් වල නිශ්පාදකයෙකු ලෙස ඔබගේ දායකත්වය කෙතරම් බහුල ද?:

○ දිනපතා
○ සතිපතා
○ මාසිකව එක් වරක්වත්
○ කලාතුරකින්
○ කිසි විටෙකත් නැත

20. ඔබේ අත්දැකීමට අදාළව පහත සඳහන් කියමන් හට ප්‍රතිචාර දක්වන්න.

අන්තර්ජාලය තුළ විවිධ පුද්ගලයෝ විවාද හා සංවාද වල නිරත වෙති.

O නිසැකවම O සමහර අවස්ථාවලදී O සැකයක් ඇත O මම නොදනිමි

අන්තර්ජාලය මා වෙනත් පුද්ගලයින් සමඟ වඩා පහසුවෙන් සම්බන්ධ කරනවා ඇත.

O නිසැකවම O සමහර අවස්ථාවලදී O සැකයක් ඇත O මම නොදනිමි

සමාජය තුළ අසම්මත මාතෘකා පිළිබඳ තොරතුරු මා හට අන්තර්ජාලය හරහා ලබා ගත

O නිසැකවම O සමහර අවස්ථාවලදී O සැකයක් ඇත O මම නොදනිමි

අන්තර්ජාලය තුළ හින්සනයට ලක්වන්නේ කාන්තාවන් පමණී.

O නිසැකවම O සමහර අවස්ථාවලදී O සැකයක් ඇත O මම නොදනිමි

පියවි ලෝකය තුල දකින්නට ඇසෙන්නට ලැබෙන ප්‍රචණ්ඩත්වයම අන්තර්ජාලය තුළද දක්නට ඇත

O නිසැකවම O සමහර අවස්ථාවලදී O සැකයක් ඇත O මම නොදනිමි

21. පහත සඳහන් ඒවා අතරින් කිසිවක් ඔබ විසින් පුද්ගලිකව අත්දැක තිබේ ද? (පිළිතුරු දීම අනිවාර්ය නොවේ)

O සෘජුවම ප්‍රචණ්ඩකාරී තර්ජන, ලිංගික හා කායික තර්ජන ඇතුලුව

O අවලාද

O අවසරයකින් තොර ලිංගික ස්වරූපයකින් යුත් පණිවුඩ එවීම

O වෛරීය ප්‍රකාශන, අනන්‍යතාවය මූලික කරගත් සමාජ ජාලා පෝස්ට්ස් හෝ ඊ-මේල්/පණිවුඩ

O ස්ත්‍රී-පුරුෂ භාවය මූලික කරගෙන එල්ල වෙන් ඝෘණාත්මක අදහස්

O අනවසරයෙන් භාවිතා කිරීම හා භාවිතය පාලනය කිරීම

O අනවසරයෙන් පුද්ගලික තොරතුරු බෙදා හැරීම

O කාන්තාවක් පහත් කොට සැලකීම සඳහා අසභ්‍ය හෝ ප්‍රචණ්ඩකාරී රූප භාවිතය

O අසම්මත අදහස් ප්‍රකාශ කිරීම හෝ වෙනකෙකුගේ අදහස් වලට එකඟ නොවීම හෝ වෙනකෙකුගේ ලිංගික යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අන්තර්ජාලය තුළ ඇයව හින්සනයට හෝ ලැජ්ජාවට පත් කිරීම

O ස්ත්‍රීඝාතනයට පක්ෂව අදහස් ප්‍රකාශ කිරීම හෝ අනුබල දීම

O වෙන කෙනෙකු විසින් තමන්ගේ නමින් ව්‍යාජ ගිණුම් නිර්මාණය වීම හා තමන්ගේ අනන්‍යතාවය සොරකමට ලක්වීම

O අනුන් විසින් අන්තර්ජාලය තුළ තමන් වටකරගැනීමකට ලක්වීම හා

O පිරිසකගේ අයුතු බලපෑම් වල ඉලක්කයක් බවට පත් වීම

22. පහත සඳහන් කිසිවක ඔබ සහභාගී වී තිබේ ද?

සෘජුවම ප්‍රචණ්ඩකාරී තර්ජන▯ ලිංගික හා කායික තර්ජන ඇතුලුව

- අවලාද
- අවසරයකින් තොර ලිංගික ස්වරූපයකින් යුත් පණිවුඩ එවීම
- වෛරීය ප්‍රකාශන, අනන්‍යතාවය මූලික කරගත් සමාජ ජාලා පෝස්ට්ස් හෝ ඊ-මේල්/පණිවුඩ,
- ස්ත්‍රී-පුරුෂ භාවය මූලික කරගෙන එල්ල වෙන් ඝෘණාත්මක අදහස්
- අනවසරයෙන් භාවිතා කිරීම හා භාවිතය පාලනය කිරීම
- අනවසරයෙන් පුද්ගලික තොරතුරු බෙදා ගැනීම
- කාන්තාවක් පහත් කොට සැලකීම සඳහා අසභ්‍ය හෝ ප්‍රචණ්ඩාකාරී රූප භාවිතය
- අසම්මත අදහස් ප්‍රකාශ කිරීම හෝ වෙනකෙකුගේ අදහස් වලට එකඟ නොවීම හෝ වෙනකෙකුගේ ලිංගික යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අන්තර්ජාලය තුළ ඇයව හින්සනයට හෝ ලැජ්ජාවට පත් කිරීම
- ස්ත්‍රීඝාතනයට පක්ෂව අදහස් ප්‍රකාශ කිරීම හෝ අනුබල දීම
- වෙන කෙනෙකු විසින් තමන්ගේ නමින් ව්‍යාජ ගිණුම් නිර්මාණය වීම හා තමන්ගේ අනන්‍යතාවය සොරකමට ලක්වීම
- අනුන් විසින් අන්තර්ජාලය තුළ තමන් වටකරගැනීමකට ලක්වීම හා
- පිරිසකගේ අයුතු බලපෑම් වල ඉලක්කයක් බවට පත් වීම

23. එම අත්දැකීමට හෝ අත්දැකීම්වලට ඔබ ප්‍රතිචාර දැක්වූයේ කෙසේ ද?

- අදාළ වෙබ්අඩවිය හෝ සේවා සපයන්නාට වාර්තා කළා
- එය නොසලකා හැරියා
- එයට ප්‍රතිවාදීව ප්‍රතිචාර දැක්වූවා
- නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එය වාර්තා කළා
- වෙනත්

24. ඔබ එය ගැන වෙන කිසිකෙනෙකුටවත් කථා කෙරුවාද?

- ඔව්
- නැත

25.අන්තර්ජාලය තුළ ඔබේ අත්දැකීමේ තෘප්තිමත් බව 1 සිට 10 අතර පරාසයක් තුළ ශ්‍රේණිගත කරන්න.

26. ඔබ පරිහරණය කරනා සියලු අන්තර්ජාලීය සේවාවන් අතරින, ඔබගේ අදහස් ප්‍රකාශ කිරීමට වඩාත්ම ප්‍රයෝජනවත් සේවාව කුමක් ද? (ඔබේ පිළිතුර කෙටියෙන් විස්තර කරන්න.

27.ඔබගේ අන්තර්ජාල භාවිතයේ අත්දකීම් පිළිබඳ අප හා තවත් කතා කිරීමට කැමති ද? එසෙනම් ඔබව සම්බන්ධ කරගැනීමට පහසු ම මග අපට කියන්න:

# ඇමුණුම 3 පර්යේෂණ විචාරය

අන්තර්ජාලය හා සමාජභාවය, ලිංගිකත්වය, ජනවාර්ගික-ආගමික ජාතිවාද ආදියේ අන්තර්-සබඳතා පිළිබඳව ගවේෂණය කරන ශ්‍රී ලංකාවේ සාහිත්‍යය විමර්ශනය.

Bratsbjerg, C. (2018). Image-based cyberviolence against women and girls in Sri Lanka. Key findings from a field study in Sri Lanka. http://www.bakamoono.lk/admin/wp-content/uploads/2016/06/GBCV-Sri-Lanka_-Findings-and-recommendations-sheet_C.-Bratsbjerg.pdf

Deshapriya, P., Mendis, M., Wijewardena, S., Wijesiriwardena, S., Kottegoda, S., & Brown, S. (2017). Disrupting the Binary Code: Experiences of LGBT Sri Lankans Online. Women and Media Collective. https://womenandmedia.org/wp-content/uploads/2018/02/Disrupting-the-Binary-Code-_-for-web.pdf

Fernando, S., Wanniarachchi, S., Vidanapathirana, J. (2018). Montage of Sexuality in Sri Lanka. College of Community Physicians of Sri Lanka/UNFPA. https://srilanka.unfpa.org/sites/default/files/pub-pdf/Montage%20of%20Sexuality.pdf

Ghosha, Groundviews, & Hashtag Generation. (2019). Opinions, B*tch: Technology Based Violence Against Women in Sri Lanka. https://groundviews.org/2019/06/27/opinions-btch-technology-based-violence-against-women-in-sri-lanka/

Kottegoda, S., Emmanuel, S., & Perera, S. (2012). ICT Access for women from the margins. https://idl-bnc-idrc.dspacedirect.org/bitstream/handle/10625/51474/IDL-51474.pdf?sequence=1&isAllowed=y

Wijewardena, S. & Samuel, K. (2015). 3D Things: Devices, Technologies, and Women's Organising in Sri Lanka. https://books.google.lk/books/about/3D_Things.html?id=7pR4nQAACAAJ&redir_esc=y

Women and Media Collective. (2016). Ethno-Religious Nationalism and Sexual and Reproductive Health and Rights in Sri Lanka: A social media, print media and policy review. https://arrow.org.my/wp-content/uploads/2016/08/Interlinkages-Between-Religion-and-SRHR_National-Report_Sri-Lanka.pdf

# ඇමුණුම 4- නෛතික රාමුවේ දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන නීති දළ විශ්ලේෂණය (මූලාශ්‍රය: ඩිලීට් නතින්ග්)

තාක්ෂණය-සබැඳි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන විශේෂිත නීතියක ලංකාවේ නැතත, දණ්ඩ නීති සංග්‍රහයේ අංශයන් කිහිපයක් මෙන් ම වෙනත් නීති කිහිපයක් ද මේ සඳහා භාවිත කළ හැකි යි

දණ්ඩ නීති සංග්‍රහය

ලිංගික හිරිහැර පිළිබඳ 345 වන වගන්තිය

කප්පම් ගැනීම පිළිබඳ 372 වගන්තිය

සාපරාධී බිය ගැන්වීම් පිළිබඳ 483 වගන්තිය

සාපරාධී විශ්වාසය කඩ කිරීම පිළිබඳ 388 වන වගන්තිය

පුද්ගලිකව වංචා කිරීම පිළිබඳ 399 වන වගන්තිය

පරිගණක අපරාධ පනත, 2007 අංක 24

3 වන වගන්තිය අනුව පරිගණකයකට අනවසරයෙන් ප්‍රවේශ වීම වරදකි

දත්ත සමඟ කටයුතු කිරීම පිළිබඳ 7 වන කොටස

අසභ්‍ය ප්‍රකාශන (සංශෝධන) පනත (1983 අංක 22)

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත□ 2005 අංක 34

Supported by

APC

AMPLIFYCHANGE